# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 සැප්තැම්බර් මස 14 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.09.17 දින නිකුත් කරන ලදී)


# ත්‍රස්තවාදය වැළැක්වීමේ

**ත්‍රස්තවාදයෙන් හා ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදිවලින් ශ්‍රී ලංකාව හා ශ්‍රී ලංකාවේ ජනතාව ආරක්ෂා කිරීම සඳහා ද; ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදුකරනු ලබන ත්‍රස්තවාදය හා ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදි වැළැක්වීම සඳහා ද; ශ්‍රී ලංකාවෙන් පිටත ත්‍රස්තවාදය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකාවේ භූමිය සහ එහි ජනතාව භාවිත කිරීම වැළැක්වීම සඳහා ද; ත්‍රස්තවාදී ක්‍රියා සහ ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදි අනාවරණය කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් යම් වරදක් සිදුකර ඇත්තාවූ යම් තැනැත්තකු හඳුනාගැනීම, ග්‍රහණය කර ගැනීම, සිරභාරයට ගැනීම, අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, පරීක්ෂණ පැවැත්වීම, නඩු පැවරීම සහ දඬුවම් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ඉවත්කිරීම පිණිස ද; ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.**

විදේශ කටයුතු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 135.00 තැපැල් ගාස්තුව : රු. 55.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ත්‍රස්තවාදය වැළැක්වීමේ

එල්.ඩී.—ඕ. 2/2017

**ත්‍රස්තවාදයෙන් හා ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදිවලින් ශ්‍රී ලංකාව හා ශ්‍රී ලංකාවේ ජනතාව ආරක්ෂා කිරීම සඳහා ද; ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදුකරනු ලබන ත්‍රස්තවාදය හා ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදි වැළැක්වීම සඳහා ද; ශ්‍රී ලංකාවෙන් පිටත ත්‍රස්තවාදය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකාවේ භූමිය සහ එහි ජනතාව භාවිත කිරීම වැළැක්වීම සඳහා ද; ත්‍රස්තවාදී ක්‍රියා සහ ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදි අනාවරණය කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් යම් වරදක් සිදුකර ඇත්තා වූ යම් තැනැත්තකු හඳුනාගැනීම, ග්‍රහණය කර ගැනීම, සිරභාරයට ගැනීම, අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, පරීක්ෂණ පැවැත්වීම, නඩු පැවරීම සහ දඬුවම් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ඉවත්කිරීම පිණිස ද; ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට සහ භෞමික අඛණ්ඩතාවයට පූර්විකාව. ත්‍රස්තවාදය බරපතල තර්ජනයක් වී ඇති හෙයින් සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් මරණයට පත්කිරීම හා බරපතල තුවාල සිදුකිරීමට හේතුවී ඇති හෙයින් ද; ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික දේපළවලට එමගින් බරපතල අලාභහානි සිදුවී ජාතික සංවර්ධනය මන්දගාමී වී ඇති හෙයින් ද;

ත්‍රස්තවාදය විවිධ ආකාරවලින් සහ ස්වරූපවලින් ජාත්‍යන්තර ප්‍රජාවෙහි සාමයට සහ ආරක්ෂාවට තර්ජනයක් වී ඇති හෙයින් සහ අනාගතයේදී සිදුවිය හැකි ත්‍රස්තවාදී ක්‍රියා සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් ශ්‍රී ලංකාව, එහි ජනතාව සහ දේපළ ආරක්ෂා කිරීම රජයේ ප්‍රමුඛ වගකීමක් වන හෙයින් ද;

ශ්‍රී ලංකාව අත්සන්කරුවකු වී සිටින ත්‍රස්තවාදය වැළැක්වීමට අදාළ ජාත්‍යන්තර සාධනපත්‍රවලට දේශීය වශයෙන් නෛතික බලයක් ලබාදීම සඳහා නීති පැනවීමට ශ්‍රී ලංකාව වගකීමෙන් බැඳී සිටින හෙයින් ද;

ත්‍රස්තවාදයේ ව්‍යසනයෙන් වෙනත් ස්වෛරී ජාතීන් සහ ඒවායේ මහජනතාව ආරක්ෂාකිරීම සඳහා ශ්‍රී ලංකා රජය කැපවී සිටින හෙයින් ද;

ජාත්‍යන්තර මානයන් හා ප්‍රමිතීන් මෙන්ම දේශීය අවශ්‍යතා මත පදනම්ව ත්‍රස්තවාදයට එරෙහිව අපරාධ යුක්තිය පසිඳලීම සඳහා ඵලදායී ක්‍රමයක් බලාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකාව විසින් දේශීය සහ ජාත්‍යන්තර ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම සහ වැළැක්වීම සඳහා කැපවී සිටින හෙයින් සහ කැමැත්තෙන් සිටින හෙයින් ද;

ත්‍රස්තවාදයට එරෙහිව අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමය සාධාරණ සහ යුක්තිසහගත ලෙස අදාළ කරගැනීමට වගබලා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව ශ්‍රී ලංකා රජය සැලකිලිමත් වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

1. මේ පනත 2018 අංක      දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

**පනත අදාළවීම සහ වැරදි**

පනත අදාළවීම.

**2.** (1) (අ) ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය තුළ හෝ ඉන් පිටත දී මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකුට;

(ආ) මේ පනත යටතේ වරදක් -

(i) ශ්‍රී ලංකාව තුළ දී සම්පූර්ණයෙන් ම හෝ කොටසක් හෝ සිදුකරන යම් තැනැත්තකුට;

(ii) ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරය තුළ දී හෝ එයට ඉහළින් සිදුකරන යම් තැනැත්තකුට;

(iii) ශ්‍රී ලංකාවේ ගුවන් තලයෙහි සිදුකරන යම් තැනැත්තකුට;

(iv) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ශ්‍රී ලංකා රජයට අයත් හෝ ශ්‍රී ලංකා රජය විසින් භාවිත කරනු ලබන

හෝ කරන ලද හෝ ගුවන් යානයක හෝ නැවක සිට හෝ එබඳු ගුවන් යානයක් හෝ නැවක් සම්බන්ධයෙන් හෝ සිදුකරන යම් තැනැත්තකුට;

(v) ශ්‍රී ලංකාවේ රාජ්‍ය දූත මණ්ඩලයක හෝ කොන්සල් ධුරයේ හෝ කොන්සල් නිලධරයකුගේ මණ්ඩලයක කාර්යාල පරිශ්‍රය තුළ දී හෝ ඒ රාජ්‍ය දූත මණ්ඩලයේ හෝ කොන්සල් ධුරයේ ප්‍රධානියාගේ පදිංචි ස්ථානය තුළ හෝ එම රාජ්‍ය දූත මණ්ඩලයේ හෝ කොන්සල් ධුරයේ නිලධරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ පදිංචි ස්ථානය තුළ දී, සම්පූර්ණයෙන් හෝ කොටසක් සිදුකරන යම් තැනැත්තකුට;

(vi) ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති යම් කාර්යාල පරිශ්‍රයක් තුළ දී හෝ එවැනි ව්‍යවස්ථාපිත මණ්ඩලයක යම් සේවා නියුක්තයකුගේ පදිංචි ස්ථානය තුළදී සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ සිදු කරන යම් තැනැත්තකුට;

(ඈ) මේ පනත යටතේ වරදක් -

(i) ජාත්‍යන්තර සාමය ආරක්ෂා කිරීමේ මෙහෙවරක හෝ නියාමනය කිරීමේ මෙහෙවරක යෙදී සිටින පුරවැසියකු ඇතුළුව ශ්‍රී ලංකාවේ පුරවැසියකු සම්බන්ධයෙන්;

(ii) ශ්‍රී ලංකාවේ රජයට අයත් යම් දේපළක් සම්බන්ධයෙන්,

ශ්‍රී ලංකා ජනරජයේ දේශය තුළ හෝ ඉන් පිටත දී සිදුකරන යම් තැනැත්තකුට;

(ඈ) මේ පනත යටතේ වරදක් ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය තුළ දී හෝ ඉන් පිටත දී සිදුකරන ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටින ලද තැනැත්තකුට:

එසේ වුව ද, ඔහු ශ්‍රී ලංකාව තුළ ස්වකීය නිත්‍ය පදිංචිය අඛණ්ඩව පවත්වාගෙන යන්නේ නම් පමණක් එම තැනැත්තා සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන බලාත්මක කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, ඔහු ශ්‍රී ලංකාව තුළ ස්වකීය නිත්‍ය පදිංචිය පවත්වාගෙන නොයන්නේ නම්, එම තැනැත්තා පුරවැසියකු වන්නා වූ විදේශ රාජ්‍යයේ එකඟත්වය ඇතිව, මේ පනතේ විධිවිධාන බලාත්මක කරනු ලැබිය හැකි ය;

(ඉ) මේ පනත යටතේ වරදක් ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය තුළ දී හෝ ඉන් පිටත දී සිදුකරන ශ්‍රී ලංකාවේ ස්වකීය සුපුරුදු වාසස්ථානය පවත්වාගෙන යන යම් තැනැත්තකුට,

මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) මේ පනතේ අර්ථානුකූල වරදක් නොවන යම් වරදක ප්‍රතිඵලයෙහි සංකීර්ණ බව, බරපතල බව හෝ දරුණු බව පිළිබඳව ද, ඒ වරද පිළිබඳ අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනත හෝ වෙනත් අදාළ ලිඛිත නීතියක විධිවිධාන ප්‍රකාරව විමර්ශන පැවැත්වීම හා සම්බන්ධ අපහසුතා පිළිබඳව ද නොතකා, එවැනි වරදක් සිදුකරන තැනැත්තකු හඳුනාගැනීමට, සොයා ගැනීමට, ග්‍රහණයට ගැනීමට, සිරභාරයට ගැනීමට, අත්අඩංගුවට ගැනීමට, රඳවා තබා ගැනීමට, එවැනි තැනැත්තකු පිළිබඳ විමර්ශනය කිරීමට හෝ එවැනි තැනැත්තකුට එරෙහිව නඩු පැවරීමට මේ පනතේ විධිවිධාන බලාත්මක නොකළ යුතු ය.

ත්‍රස්තවාදී වරද.

3. (1) (අ) ජනගහනයක් බිය ගැන්වීමේ අරමුණින් යුතුව;

(ආ) යම් ක්‍රියාවක් සිදුකිරීමට හෝ සිදුකිරීම වැළැක්වීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් යම් ආණ්ඩුවක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් සාවද්‍ය ලෙස හෝ නීති විරෝධී ලෙස පෙළඹවීමේ අරමුණින් යුතුව;

(ඇ) එවැනි යම් ආණ්ඩුවක්, කටයුතු ඉටු කිරීම වැළැක්වීමේ අරමුණින් යුතුව; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් ස්වෛරී රටක භෞමික අඛණ්ඩතාවයට හෝ ස්වෛරීබවට හානි සිදුකිරීමේ අරමුණින් යුතු ව,

(2) වන උපවගන්තියේ සඳහන් යම් ක්‍රියාවක් සිදුකරනු ලබන යම් තැනැත්තකු ත්‍රස්තවාදී වරදට වරදකරු වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් ක්‍රියාවක් පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) මිනීමැරීම, මිනීමැරීමට තැත්කිරීම, බරපතල තුවාල සිදුකිරීම, ප්‍රාණ ඇපයට ගැනීම හෝ යම් තැනැත්තකු පැහැර ගැනීම;

(ආ) ක්‍රියාව සිදුකරන තැනැත්තා නොවන යම් තැනැත්තකුගේ ජීවිතය අනතුරට පත්කිරීම;

(ඇ) යම් රාජ්‍ය හෝ පෞද්ගලික දේපළ ඇතුළුව දේපළවලට, මහජන භාවිත ස්ථානයකට, රාජ්‍ය හෝ ආණ්ඩුවේ පහසුකමකට, යම් රාජ්‍ය හෝ පෞද්ගලික ප්‍රවාහන පද්ධතියකට හෝ යම් යටිතල පහසුකමකට හෝ පරිසරයකට බරපතල හානි සිදුකිරීම;

(ඈ) අත්‍යවශ්‍ය සේවාවලට හෝ සැපයීම්වලට බරපතල බාධා හෝ හානි සිදුකිරීම;

(ඉ) රාජ්‍ය හෝ පෞද්ගලික දේපළ කොල්ලකෑමේ, තාසද්ග්‍රහණය කිරීමේ හෝ සොරකම් කිරීමේ වරද සිදුකිරීම;

(ඊ) මහජනතාවගේ හෝ එහි යම් කොටසක සෞඛ්‍යය සහ ආරක්ෂාවට බරපතල අවදානමක් ඇති කිරීම;

(උ) ශ්‍රී ලංකාවට පවරාදී ඇති යම් ඉලෙක්ට්‍රොනික හෝ ස්වයංක්‍රීය පරිගණක පද්ධතියකට හෝ ජාලයකට හෝ සයිබර් අවකාශයකට හෝ එවැනි බලවර්තනයකට හෝ එවැනි බලවර්තනයක ලියාපදිංචි වී සිටින වෙබ් අඩවිවලට බාධා ඇති කිරීම හෝ අලාභහානි සිදුකිරීම හෝ එවැන්නකට මැදිහත්වීම;

(ඌ) යම් අත්‍යවශ්‍ය සේවා හෝ සැපයීම් සමඟ සම්බන්ධ යම් තීරණාත්මක යටිතල පහසුකමකට හෝ ප්‍රවර්ධන පහසුකමකට බාධා ඇති කිරීම හෝ අලාභහානි සිදුකිරීම හෝ ඒ සඳහා මැදිහත්වීම;

(එ) යම් ආගමික හෝ සංස්කෘතික දේපළක් හෝ උරුමයක් විනාශකිරීම හෝ එවැනි දේපළකට හෝ උරුමයකට අලාභහානි සිදුකිරීම; සහ

(ඒ) සංඥා සම්ප්‍රේෂණයක් සහ වෙනත් යම් සංඛ්‍යාත පදනම් වූ සම්ප්‍රේෂණ පද්ධතියක් ඇතුළුව යම් ඉලෙක්ට්‍රොනික්, ඇනලොග්, ඩිජිටල් හෝ වෙනත් රැහැන් සහිත හෝ රැහැන් රහිත සම්ප්‍රේෂණ පද්ධතියකට අවහිර කිරීම හෝ අලාභහානි සිදුකිරීම.

(3) යම් මූලික අයිතිවාසිකමක් නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමේ දී හෝ තමා වෙත ලබාදුන් නීත්‍යානුකූල නියෝගයක් අනුව හෝ එවැනි නියෝගයක් බලාත්මක කිරීමේ දී, නැතහොත් යම් අධිකරණ නියමයක් ප්‍රකාරව හෝ එවැනි නියමයක් බලාත්මක කිරීමේ දී, යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් ගන්නා ලද යම් පියවරක් මේ පනත යටතේ වරදක් වශයෙන් සලකනු නොලැබිය යුතුය.

ත්‍රස්තවාදී වරද සඳහා වූ දණ්ඩනය.

**4.** (1) (අ) මරණය සිදුකිරීමේ අරමුණින් යුතුව 3 වන වගන්තිය යටතේ වරදක් සිදුකරනු ලබන සහ එම වරද සිදුකිරීමේ දී වෙනත් තැනැත්තකුගේ මරණය සිදුකරනු ලබන යම් තැනැත්තකුට මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබීමේදී ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය යුතු ය;

(ආ) වරද සිදු කිරීමේ සාධාරණ හා පූර්වේක්ෂණය කළ හැකි ප්‍රතිඵලය වෙනත් තැනැත්තකුගේ මරණය සිදුකිරීම වන්නා වූ, 3 වන වගන්තිය යටතේ වරදක් යම් තැනැත්තකු විසින් සිදුකරනු ලැබූ විට, ඒ තැනැත්තා මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබීමේ දී, ජීවිතාන්තය දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකින් දඬුවම් කරනු ලැබිය යුතු ය; හෝ

(ඇ) (අ) සහ (ආ) ඡේදවල සඳහන් වැරදි නොවන, 3 වන වගන්තිය යටතේ වූ වරදක් සිදුකරනු ලබන යම් තැනැත්තකු මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක

බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට සහ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ එවැනි තැනැත්තකුට පනවා ඇති වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව, එවැනි තැනැත්තකුගේ සියලු දේපළ හෝ යම් දේපළක් රාජසන්තක කිරීම සඳහා අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

**ත්‍රස්තවාදී වරද සිදුකිරීමට තැත් කිරීම සඳහා වූ දණ්ඩනය.**

**5.** (1) 3 වන වගන්තිය යටතේ වරදක් සිදුකිරීමට තැත්කරනු ලබන, අනුබල දෙනු ලබන හෝ කුමන්ත්‍රණය කරනු ලබන යම් තැනැත්තකු, මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහළොවක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට සහ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදුකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ත්‍රස්තවාදී වරද සිදුකර ඇත්නම්, වරදකරු ත්‍රස්තවාදී වරද සිදු කර ඇති ලෙස සලකමින්, එම වරදකරුට එම දණ්ඩනයෙන්ම දඬුවම් කරනු ලැබිය යුතු ය.

**ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදි.**

**6.** ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවයට, ජාතික ආරක්ෂාවට සහ රාජ්‍ය ආරක්ෂාවට අහිතකර බලපෑමක් ඇති කිරීමේ අදහසින් හෝ ඒ පිළිබඳ දැනුවත්ව හෝ ඒ බව විශ්වාස කිරීමට හේතු ඇතිව, නැතහොත් සිවිල් ජනගහනයක් ත්‍රාසද්ග්‍රහණයට ලක් කිරීමෙන් හෝ බිය ගැන්වීමෙන් අහිතකර බලපෑමක් ඇති කිරීමේ අදහසින් හෝ ඒ පිළිබඳ දැනුවත්ව හෝ ඒ බව විශ්වාස කිරීමට හේතු ඇතිව -

(අ) 7 වන වගන්තියේ සඳහන් නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදුකරන; හෝ

(ආ) 8 වන වගන්තියේ සඳහන් ත්‍රස්තවාදය ආශ්‍රිත බරපතල අපරාධ ක්‍රියාවක් සිදුකරන; හෝ

(ඇ) 9 වන වගන්තියේ සඳහන් ත්‍රස්තවාදය ආශ්‍රිත ක්‍රියා සිදුකරන; හෝ

(ඈ) 10 වන වගන්තියේ සඳහන් ත්‍රස්තවාදයට අනුබල දීමේ ක්‍රියා සිදුකරන,

යම් තැනැත්තකු හෝ පොදු අරමුණක් යටතේ එක්ව හෝ වෙන වෙනම හෝ ක්‍රියාකරන පුද්ගල කණ්ඩායමක සාමාජිකයකු හෝ තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයක සාමාජිකයකු, මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

**නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියා.**

**7.** 6 වන වගන්තියේ (අ) ඡේදය යටතේ වන වරදක් සංයුක්ත වන ක්‍රියා පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) යම් තැනැත්තකුගේ මරණය සිදු කිරීම සහ මරණය සිදුකිරීමට තැත් කිරීම, යම් තැනැත්තකු පැහැරගෙන යාම, අයුතු ලෙස සිරකර තැබීම, ප්‍රාණ ඇපයට ගැනීම, ත්‍රාසද්ග්‍රහණය, සාපරාධී භයගැන්වීම හෝ වසර හතක් හෝ ඊට වැඩි කාලයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන වෙනත් වරදක් සිදුකිරීම;

(ආ) මේ පනත යටතේ වරදක වින්දිතයකු සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ වරදක් සිදුකිරීම පිළිබඳ සාක්ෂිකරුවකු සම්බන්ධයෙන්, 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 8 වන වගන්තිය යටතේ වරදක් සිදුකිරීම;

(ඇ) බුද්ධිමය දේපළ ඇතුළුව රජයේ දේපළවලට සහ රජයට අයිති, රජය මගින් පාලනය වන හෝ නියාමනය කරනු ලබන තීරණාත්මක යටිතල පහසුකම්, ස්වයංක්‍රීය පද්ධති, ඩිජිටල් දත්ත සමුදායන් සහ වෙනත් අත්‍යවශ්‍ය සේවාවන් ආශ්‍රිත ප්‍රවර්ධන ජාල, කොල්ලකෑම, ත්‍රාසද්ග්‍රහණය කිරීම, සොරකම් කිරීම, ඒවාට අනර්ථය කිරීම හෝ වෙනත් අලාභ හානි සිදුකිරීම;

(ඈ) නීත්‍යානුකූල අවසරයක් නොමැතිව, තුවක්කු, පීඩාකාරී ආයුධ, වෙඩි බෙහෙත්, පුපුරණ ද්‍රව්‍ය හෝ ගිනිගන්නාසුලු ද්‍රව්‍ය හෝ මලකඩ කන ද්‍රව්‍ය හෝ යම් ජීව විද්‍යාත්මක, රසායනික, විද්‍යුත් හෝ ඉලෙක්ට්‍රොනික හෝ න්‍යෂ්ටික අවි ආනයනය කිරීම, අපනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, රැස්කිරීම, ලබා ගැනීම, සැපයීම, වෙළෙඳාම් කිරීම හෝ සන්තකයේ තබා ගැනීම හෝ භාවිතය.

8. 6 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ වන වරදක් සංයුක්ත වන ක්‍රියා පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

ත්‍රස්තවාදය ආශ්‍රිත බරපතල අපරාධ ක්‍රියා.

(අ) දණ්ඩ නීති සංග්‍රහයේ -

(i) 114 වන වගන්තිය සහ 116 සිට 126 දක්වා වූ වගන්ති යටතේ දඬුවම් දිය හැකි රාජ්‍ය විරෝධී වරදක් සිදුකිරීම;

(ii) 128 සිට 137 දක්වා වූ වගන්ති යටතේ දඬුවම් දිය හැකි යුද හමුදාවට, නාවික හමුදාවට සහ ගුවන් හමුදාවට සම්බන්ධ වරදක් සිදුකිරීම;

(iii) 360ඇ වගන්තිය යටතේ තැනැත්තන් වෙළෙඳාම් කිරීමේ වරද සිදුකිරීම;

(ආ) 2000 අංක 41 දරන ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීම වැළැක්වීමේ පනත යටතේ වරදක් සිදුකිරීම;

(ඇ) 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත යටතේ යම් වරදක් සිදුකිරීම;

(ඈ) 2005 අංක 28 දරන ගෙවීම් හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ යම් වරදක් සිදු කිරීම;

(ඉ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ යම් වරදක් සිදුකිරීම;

(ඊ) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව ලැයිස්තුගත කළ සුරැකුම්පත් විකිණීමට අදාළව යම් වරදක් සිදුකිරීම;

(උ) (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත යටතේ යම් වරදක් සිදුකිරීම;

(ඌ) (351 වන අධිකාරය වූ) ආගාමික සහ විගාමික පනත යටතේ යම් වරදක් සිදුකිරීම.

ත්‍රස්තවාදය ආශ්‍රිත ක්‍රියා.

**9.** 6 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ වරදක් සංයුක්ත වන ක්‍රියා පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) ශ්‍රී ලංකා ජනරජයේ දේශසීමාවෙන් පිටත දී මේ පනත යටතේ වරදක් සිදුකිරීම සඳහා යම් සැලසුමක් සංවිධානය කිරීම, ඊට සූදානම් වීම හෝ එවැනි සැලසුමක් ක්‍රියාවට නැංවීම සඳහා යම් ක්‍රියාවක් සිදුකිරීම;

(ආ) 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත යටතේ තහනම් කරන ලද, තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයක නායකයකු, සාමාජිකයකු, හෝ සක්‍රිය සාමාජිකයකු ලෙස ක්‍රියාකිරීම හෝ සේවය කිරීම හෝ තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයක සාමාජිකයකු හෝ සක්‍රිය සාමාජිකයකු වීම සඳහා තැනැත්තන් බඳවා ගැනීම.

ත්‍රස්තවාදයට අනුබල දීමේ ක්‍රියා.

**10.** 6 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ වරදක් සංයුක්ත වන ක්‍රියා පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) මේ පනත යටතේ වරදක් සිදුකිරීම ස්වකීය අරමුණ වන තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානවලට හෝ ව්‍යාපාරවලට සම්බන්ධ වීමට තැනැත්තන් බඳවා ගැනීම හෝ පොළඹවා ගැනීම හෝ දිරිගැන්වීම;

(ආ) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට ආධාර දීමේ සහ අනුබල දීමේ කාර්යය සඳහා තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයක් සමඟ එකතු වීම, එවැනි සංවිධානයක සාමාජිකයකු බවට පත් වීම, ඊට උදව් කිරීම හෝ එවැනි සංවිධානයක් නියෝජනය කිරීම;

(ඇ) යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදුකර ඇති බව හෝ වරදක් සිදුකිරීමේ දී ඒ වරදට සම්බන්ධ වී ඇති බව දනිමින් හෝ ඒ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබිය දී, ඒ තැනැත්තාට රැකවරණය දීමෙන්, වසන් කිරීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් සාවද්‍ය ලෙස හෝ නීත්‍යනුකූල නොවන ලෙස ඒ තැනැත්තා හඳුනාගැනීම, සිරභාරයට ගැනීම, අත්අඩංගුවට ගැනීම, හෝ රඳවා තබාගැනීම, වැළැක්වීම, පමා කිරීම හෝ බාධා කිරීම;

(ඇ) තහනම් කරන ලද ත්‍රස්තවාදී සංවිධානයක් සඳහා හෝ ඒ වෙනුවෙන්, නැතහොත් මේ පනත යටතේ වරදක් සිදු කිරීමට සූදානම් වන යම් තැනැත්තකු සඳහා හෝ ඔහු වෙනුවෙන් නැතහොත් මේ පනත යටතේ වරදක් සිදුකිරීමට ඒ තැනැත්තාට ආධාර කිරීම සඳහා, දේපළ කොල්ලකෑම, ත්‍රාසද්ග්‍රහණය හෝ සොරකම සිදුකිරීම හෝ අන්‍යාකාරයකින් මුදල් හෝ යම් දේපළක් හෝ වෙනත් ද්‍රව්‍ය ලබා ගැනීම;

(ඉ) තහනම් කරන ලද ත්‍රස්තවාදී සංවිධානයකට එකතු වීමට හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ මේ පනත යටතේ වෙනත් යම් වරදක් සිදුකිරීමට හෝ ළමයින් බඳවා ගැනීම, තෝරා ගැනීම, පෙළඹවීම, කැමති කරවා ගැනීම, බල කිරීම, දේශනා කිරීම හෝ පුහුණු කිරීම;

(ඊ) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට මුදල්, දේපළ හෝ ද්‍රව්‍ය හෝ ඒවායේ වටිනාකම් භාවිත කළ හැකි බව දනිමින් හෝ ඒ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබිය දී තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයකට හෝ යම් තැනැත්තකුට ස්වේච්ඡාවෙන්, මුදලින්, දේපළවලින් හෝ ද්‍රව්‍යවලින් දායකත්වය ලබා දීම;

(උ) ඒ ක්‍රියාවෙන් ඒ වරද ප්‍රකාශිතවම අනුමත කරනු නොලැබුව ද, මේ පනත යටතේ ත්‍රස්තවාදී වරද හෝ වෙනත් වරදක් සිදුකිරීමට පෙළඹවීමේ අරමුණින් සහ ඒ වරද සිදුකරනු ලැබීම පිළිබඳ බිය වැද්දවීමේ අරමුණින්, යම් තොරතුරු මහජනයාට හිතාමතාම සහ නීත්‍යනුකූල නොවන ආකාරයට බෙදාහැරීම හෝ අන්‍යාකාරයෙන් ලබා දීම;

(ඌ) මේ පනත යටතේ වරදක් සිදුකිරීමේ කාර්යය සඳහා තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයකට ස්වේච්ඡාවෙන් සහ ඕනෑකමින් ම සේවා සැපයීම;

(එ) මේ පනත යටතේ වරදක් සිදුකරන තැනැත්තකුට යම් තොරතුරු සැපයීමේ අරමුණින් යම් රහස්‍ය තොරතුරු රැස්කිරීමේ කාර්යය සඳහා යම් නීතිවිරෝධී හෝ අනවසර ක්‍රියාවන්හි ස්වේච්ඡාවෙන් නියැලීම;

(ඒ) මේ පනත යටතේ වරදක් සිදුකරන තැනැත්තකුට යම් තොරතුරු සැපයීමේ කාර්යය සඳහා ස්වේච්ඡාවෙන් සහ නීතිවිරෝධී ලෙස හෝ අනවසරයෙන් රහස්‍ය තොරතුරු රැස් කිරීම;

(ඔ) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කරන, සූදානම් වන, අනුබල දෙන හෝ තැත් කරන යම් තැනැත්තකුට යම් තොරතුරු සැපයීමේ කාර්යය සඳහා ස්වේච්ඡාවෙන් සහ නීතිවිරෝධී ලෙස හෝ නීත්‍යානුකූල නොවන හෝ අනවසර ආකාරයෙන් රහස්‍ය තොරතුරු රැස්කිරීම;

(ඕ) මේ පනත යටතේ වරදක් සිදුකිරීමට හෝ ඒ සඳහා කුමන්ත්‍රණය කිරීමට, අනුබල දීමට හෝ තැත් කිරීමට ඒ තොරතුරු භාවිත කරනු ලබන බව දනිමින් හෝ එසේ විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබිය දී, යම් රහස්‍ය තොරතුරු වෙනත් යම් තැනැත්තකුට සැපයීම:

එසේ වුව ද, ලියාපදිංචි කළ මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන්, මහජන යහපත උදෙසා හෝ ජාතියේ හිතසුව පිණිස, නිසි උද්‍යෝගය ඇතිව සද්භාවයෙන් කිසිවක් පළ කිරීම හෝ ශාස්ත්‍රීය ප්‍රකාශනයක කිසිවක් පළ කිරීම මේ වගන්තිය යටතේ වරදක් ලෙස සලකනු නොලැබිය යුතු ය;

(ක) (ඌ), (එ) හෝ (ඒ) ඡේදය යටතේ වරදක් සිදුකිරීමට වෙනත් යම් තැනැත්තකු දිරිගැන්වීමේ, බල කිරීමේ හෝ පෙළඹවීමේ කාර්යය සඳහා යම් තැනැත්තකුට යම් පාරිතෝෂිකයක් ලබා දීම, පෙළඹවීම, තර්ජනය කිරීම, බල කිරීම හෝ වෙනත් යම් ආකාරයක බලපෑමක් කිරීම හෝ (ඌ), (එ) හෝ (ඒ) ඡේදවලට අනුව වරදක් සිදුකරනු ලබන යම් තැනැත්තකුට ප්‍රතිෂ්ඨාවක් ලෙස පාරිතෝෂිකයක් ලබාදීම.

6 වන වගන්තිය යටතේ වූ වරදක් සඳහා දණ්ඩනය.

11. (අ) මරණය සිදුකිරීමේ අරමුණින් 6 වන වගන්තිය යටතේ වරදක් සිදුකරන සහ ඒ වරද සිදුකිරීමේ ක්‍රියාමාර්ගයේ දී වෙනත් යම් තැනැත්තකුගේ මරණය සිදුකරන යම්

තැනැත්තකු මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී ජීවිතාන්තය දක්වා වූ සිරදඬුවමකට; හෝ

(ආ) 6 වන වගන්තිය යටතේ වන වරදක් වූ ද, එහි සාධාරණ පූර්වාපේක්ෂණය කළ හැකි ප්‍රතිඵලය වෙනත් තැනැත්තකුගේ මරණය සිදු කිරීම වූ ද, වරදක් සිදුකරන සහ ඒ වරද සිදුකිරීමේ ක්‍රියාමාර්ගය තුළ දී වෙනත් යම් තැනැත්තකුගේ මරණය සිදුකරන යම් තැනැත්තකු මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබීමේ දී ජීවිතාන්තය දක්වා දීර්ඝ කළ හැකි සිරදඬුවමකට සහ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට; හෝ

(ඇ) (අ) හෝ (ආ) ඡේදවල සඳහන් කරන ලද වරදක් නොවන 6 වන වගන්තිය යටතේ වරදක් සිදුකරන යම් තැනැත්තකු මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහළොවක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට,

යටත් විය යුතු ය.

6 වන වගන්තිය යටතේ වරදක් සිදුකිරීමට තැත් කිරීම යනාදිය සඳහා වූ දණ්ඩනය.

**12.** 6 වන වගන්තිය යටතේ වරදක් සිදුකිරීමට තැත්කරන, අනුබල දෙන හෝ කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු මහාධිකරණය විසින් වරදකරු කිරීමේ දී 11 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතු ය.

තොරතුරු සැපයීම පැහැර හැරීම වරදක් බව.

**13.** (අ) මේ පනත යටතේ වරදක් වෙනත් තැනැත්තකු විසින්-

(i) සිදු කර ඇති බවට; හෝ

(ii) සිදුකිරීමට සූදානම් වන බවට, තැත් කරන බවට, අනුබල දෙන බවට හෝ කුමන්ත්‍රණය කරන බවට,

දනිමින් හෝ එසේ විශ්වාස කිරීමට හේතු තිබිය දී, ඒ පිළිබඳ ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයාට වාර්තා කිරීම පැහැර හරින; හෝ

(ආ) ත්‍රස්තවාදී වරද හෝ ත්‍රස්තවාදය ආශ්‍රිත වරදක් සිදුකර ඇති බවට ඔහු දන්නා යම් තැනැත්තකුගේ තොරතුරු ඔහු සන්තකයේ තබා ගනිමින් ඒ තොරතුරු ඔහුගෙන් ප්‍රශ්න කරන පොලිස් නිලධරයකුට සැපයීම පැහැර හරින හෝ අසත්‍ය හෝ නොමඟ යවනසුළු තොරතුරු සපයන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබීමේ දී වසර තුනක් නොඉක්මවන කාලසීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

නීත්‍යනුකූල නියෝග නොපිළිපැදීම වරදක් බව.

**14.** (අ) මේ පනත යටතේ දෙන ලද නීත්‍යනුකූල විධානයක් හෝ ආඥාවක් කඩ කරන හෝ උල්ලංඝණය කරන හෝ එවැන්නකට පටහැනිව ක්‍රියා කරන; හෝ

(ආ) මේ පනත ප්‍රකාරව කරන ලද අණ කිරීමකට අනුකූලව ක්‍රියා කිරීම ඕනෑකමින්ම පැහැර හරින හෝ නොසලකා හරින; හෝ

(ඇ) මේ පනත යටතේ විමර්ශනයක් සිදුකරන පොලිස් නිලධරයකුට තොරතුරු ලබා දීම පැහැර හරින හෝ එවැනි නිලධරයකු අසන ප්‍රශ්නයකට අසත්‍ය හෝ නොමඟ යවනසුළු පිළිතුරු ලබා දෙන; හෝ

(ඈ) මේ පනත යටතේ නිකුත් කරන ලද නීත්‍යනුකූල ආඥා හෝ විධාන ක්‍රියාත්මක කිරීම ඕනෑකමින්ම වළක්වන හෝ යටපත් කරන; හෝ

(ඉ) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම වළක්වන හෝ ඊට බාධා කරන,

යම් තැනැත්තකු වරදක් කරනු ලබන අතර අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමට සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

වැරදි සංඥෙය වැරදි විය යුතු බව.

**15.** මේ පනත යටතේ වූ යම් වරදක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය වරදක් විය යුතු අතර, මේ

පනතේ සහ වෙනත් අදාළ නීතිවල විධිවිධාන ප්‍රකාර විමර්ශනය කිරීම, නඩු පැවරීම සහ දඬුවම් පැනවීම කළ යුතු ය.

II කොටස

**වැරදි විමර්ශනය කිරීම**

විමර්ශන පැවැත්විය හැකි වන්නේ කාටද යන්න.

**16.** (1) මේ පනත යටතේ වරදක් පිළිබඳව හෝ මේ පනත යටතේ වරදක් සිදු කිරීමට සූදානම් වීමේ ක්‍රියාවක් පිළිබඳ විමර්ශනය ආරම්භ කර පවත්වා ගෙන යාමට පොලිස් ස්ථානය භාර නිලධරයකුට හෝ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් බලය දෙන ලද වෙනත් යම් පොලිස් නිලධරයකුට හිමිකමතිබියයුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකු පොලිස් නිලධරයකු ඉදිරිපිට දී මේ පනත යටතේ වරදක් සිදුකරන අවස්ථාවක දී හෝ වරදක් සිදුකර ඇති බවට සැක කරන යම් තැනැත්තකු ඒ වරද සිදුකිරීමෙන් ඉක්බිතිව ම අත්අඩංගුවට ගන්නා අවස්ථාවක දී, ඕනෑම පොලිස් නිලධරයකු විසින් ඒ තැනැත්තා සිරභාරයට ගෙන ප්‍රශ්න කිරීම සහ විමර්ශනය ආරම්භ කිරීම නීත්‍යානුකූල විය යුතු ය:

එසේම, තවදුටත් ඒ පොලිස් නිලධරයා විසින් ඒ විමර්ශනය ආරම්භ කිරීම පිළිබඳ අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයාට වහාම දැනුම් දී ඔහුගේ උපදෙස්වලට යටත්ව විමර්ශනය පැවැත්විය යුතු ය.

පොලිස් නිලධරයකු සහ වෙනත් නිලධරයන් විසින් සිරභාරයට ගතහැකි බව.

**17.** යම් පොලිස් නිලධරයකු, සන්නද්ධ හමුදාවල යම් නිලධරයකු හෝ සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු විසින් -

(අ) ඔහු ඉදිරිපිට දී වරදක් සිදු කරන හෝ මේ පනත යටතේ වරදක් සිදු කර ඇතැයි විශ්වාස කිරීමට ඔහුට සාධාරණ හේතු ඇති කවර හෝ තැනැත්තකු; හෝ

(ආ) මේ පනත යටතේ වරදක් සිදුකිරීමට සම්බන්ධ වී ඇති යම් තැනැත්තකු; හෝ

(ඇ) මේ පනත යටතේ, වරදක් කර ඇති බවට හෝ වරදක් කිරීමට සම්බන්ධ වී ඇති බවට ඔහු විශ්වාස කරන පරිදි විශ්වසනීය වන තොරතුරක් හෝ පැමිණිල්ලක් ලැබෙන්නේ

කවර තැනැත්තකු පිළිබඳව ද, එවැනි යම් තැනැත්තකු; හෝ

(ඈ) මේ පනත යටතේ වරදක් සිදුකිරීමෙන් පසුව සිරභාරයට ගැනීම මඟහැරීමේ අරමුණින් ශ්‍රී ලංකාවෙන් පලා යන තැනැත්තකු හෝ සිරභාරයට ගැනීම මඟහරින යම් තැනැත්තකු; හෝ

(ඉ) මේ පනත යටතේ වරදකට සැකකරුවකු වී සිටින්නා වූ යම් තැනැත්තකු නිදහස් කර ඇත්තේ යම් ඇප කොන්දේසිවලට යටත් ව ද, ඒ ඇප කොන්දේසි උල්ලංඝනය කරන ඒ තැනැත්තා,

වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගනු ලැබිය හැකි ය.

පොලිස් නිලධරයකු නොවන නිලධරයකු විසින් සිරභාරයට ගන්නා විට ක්‍රියා පටිපාටිය.

**18.** (1) පොලිස් නිලධරයකු නොවන නිලධරයකු විසින් සිරභාරයට ගත් තැනැත්තකු, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව, සහ කවර විටක දී වුව ද පැය විසිහතරක් ඉක්ම යාමට පෙර, ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත හෝ පොලිස්පතිවරයා විසින් තත් කාර්යය සඳහා කලින් කල නම් කරනු ලබන පොලිස් නිලධරයකු වෙත ඉදිරිපත් කළ යුතු ය:

එසේ වුව ද, ශ්‍රී ලංකා ජනරජයේ දේශයෙන් බැහැර දී හෝ යම් ගුවන් යානයක දී හෝ යාත්‍රාවක දී ඒ තැනැත්තා සිරභාරයට ගනු ලැබ ඇති අවස්ථාවක දී,සිරභාරයට ගත් ඒ ස්ථානයේ සිට අදාළ පොලිස් ස්ථානයට ගමන් කිරීම සඳහා අවශ්‍ය කාලය ඒ පැය විසිහතරේ කාලසීමාව ගණනය කිරීමේ දී බැහැර කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත මේ උපවගන්තියේ පෙරාතුව වූ විධිවිධාන ප්‍රකාරව සිරභාරයට ගනු ලැබූ තැනැත්තා ඉදිරිපත් කිරීම, සිරභාරයට ගැනීම ක්‍රියාවට නගන තැනැත්තාගේ පාලනයෙන් බැහැර හේතු නිසා ප්‍රායෝගික නොවන්නේ නම්, ඒ තැනැත්තා වෙනත් පොලිස් ස්ථානයක ස්ථාන භාර නිලධරයකුගේ අත්අඩංගුවට පත් කරනු ලැබිය යුතු ය.

(2) සිරභාරයට ගැනීමට ක්‍රියා කරන නිලධරයා විසින් හැකිතාක් ඉක්මණින් සිරභාරයට ගැනීම පිළිබඳ තොරතුරු අධිකාරී ලත්

නිලධරයකුට හෝ ඒ තොරතුරු ලබාගැනීමට බලය දී ඇති වෙනත් ඉහළ නිලයක් දරන නිලධරයකුට දැනුම් දිය යුතු ය.

(3) 22 වන සහ 23 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව එසේ සිරභාරයට ගත් තැනැත්තකුගෙන් ප්‍රශ්න කරනු ලැබිය හැකි අතර, යම් තැනැත්තකුගේ ජීවිතය ආරක්ෂා කිරීම, ත්‍රස්තවාදී ක්‍රියාවක් වැළැක්වීම හෝ සිදු කරන ලද මේ පනත යටතේ වන වරදකට අදාළ සාක්ෂි සංරක්ෂණය කර ගැනීම අවශ්‍ය වන අවස්ථාවක දී, (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද අධිකාරී ලත් නිලධරයකු හෝ වෙනත් යම් නිලධරයකු විසින් වැඩිදුරටත් සෝදිසි කරනු ලැබිය හැකි ය.

(4) ඒ අධිකාරීලත් නිලධරයා හෝ වෙනත් යම් නිලධරයා විසින් නොපමාව ඒ සිරභාරයට ගැනීම පිළිබඳව ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයාට හෝ තත් කාර්යය සඳහා පොලිස්පතිවරයා විසින් නම්කරන ලද පොලිස් නිලධරයකුට හෝ දැනුම් දිය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි පොලිස් ස්ථානය භාර නිලධරයාගේ අත්අඩංගුවට එසේ සිරභාරයට ගත් තැනැත්තා පත් කරනු ලබන වේලාවේ දී, ඒ සිරභාරයට ගැනීමට ක්‍රියාකළ නිලධරයා විසින් ඒ ස්ථාන භාර නිලධරයාට ඔහු විසින් කරන ලද සිරභාරයට ගැනීමට අදාළ අවස්ථානුගත කරුණු දක්වමින් ප්‍රකාශයක් කළ යුතු ය.

(6) ඒ නිලධරයා විසින් සැකකරුගේ සන්තකයේ තිබී සොයා ගනු ලැබිය හැකි හෝ සිරභාරයට ගන්නා ස්ථානයේ තිබී සොයා ගනු ලැබිය හැකි සියලු අයිතම ඒ පොලිස් ස්ථානය භාර නිලධරයාට භාරදීම ද සිදුකළ යුතු ය.

සිරභාරයට ගැනීම පොලිස් නිලධරයකු විසින් කරනු ලැබූ විට ක්‍රියාපටිපාටිය.

**19.** (1) (අ) පොලිස් නිලධරයකු විසින් සිරභාරයට ගනු ලැබූ යම් තැනැත්තකු අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඒ පොලිස් නිලධරයා අනුයුක්තව සිටින පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ආ) එසේ ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, සිරභාරයට ගනු ලැබූ තැනැත්තා ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මේ පනත ප්‍රකාරව සිරභාරයට ගැනීමක් සිදුකිරීමට හෝ සිරභාරයට ගනු ලැබූ තැනැත්තකු පොලිස් ස්ථානයකට ගෙන යාමට

සන්නද්ධ හමුදාවල සාමාජිකයකුගේ හෝ වෙරළ ආරක්ෂක නිලධරයකුගේ සහාය පොලිස් නිලධරයකු විසින් ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

(3) සිරභාරයට ගනු ලැබූ තැනැත්තකුට යම් ශාරීරික හානි සිදුකිරීමෙන් ආරක්ෂා කිරීමට ප්‍රායෝගිකව ගතහැකි සියලු පියවර ගනු ලැබිය යුතු ය.

නතරකිරීමේ සහ සෝදිසි කිරීමේ බලතල.

**20.** (1) 18 වන හෝ 19 වන වගන්ති යටතේ යම් තැනැත්තකු සිරභාරයට ගැනීමට සාධාරණ පදනමක් පවතින අවස්ථාවක දී, (මේ කොටසේ මින්මතු "සිරභාරයට ගන්නා නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පොලිස් නිලධරයකු, යම් සන්නද්ධ හමුදාවක සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු විසින්, -

(අ) යම් තැනැත්තකු, වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක් හෝ ගුවන් යානයක් නැවැත්වීම සහ සෝදිසි කිරීම;

(ආ) යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම;

(ඇ) යම් පරිශ්‍රයකට හෝ ඉඩමකට ඇතුළු වී සෝදිසි කිරීම; සහ

(ඈ) මේ පනත යටතේ වන යම් වරදක් සිදුකිරීමේ දී භාවිත කරනු ලැබූ, ඉන් ව්‍යුත්පන්න වූ, ඊට සම්බන්ධ වූ හෝ ඒ සඳහා භාවිත කරනු ලැබූ බවට, ඉන් ව්‍යුත්පන්න වූ බවට හෝ ඊට සම්බන්ධ වූ බවට යුක්තිසහගතව සැක කරනු ලබන යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් ස්වකීය භාරයට ගැනීම,

කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වන බලතල ක්‍රියාත්මක කිරීමේ දී 25 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අදාළ පාර්ශ්වයන් වෙත දැන්විය යුතු ය.

(3) එසේ භාරයට ගනු ලැබූ යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් හැකිතාක් ඉක්මණින් අදාළ පොලිස් නිලධරයා අනුයුක්ත පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත හෝ ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් පොලිස් ස්ථානයභාර නිලධරයා විසින් අදාළ සැකකරු ඉදිරිපත් කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද එම මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ සම්බන්ධයෙන් වන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර එකී මහෙස්ත්‍රාත්වරයා විසින් එසේ භාරයට ගනු ලැබූ ලේඛන, දේවල් හෝ ද්‍රව්‍ය සන්තකයෙහි තබා ගැනීම හෝ නිදහස් කිරීම සම්බන්ධයෙන් උචිත නියෝගයක් ලබා දිය යුතු ය.

සිරභාරයට ගනු ලබන අවස්ථාවේ දී ලබාදිය යුතු තොරතුරු.

**21.** (1) සිරභාරයට ගැනීම සිදුකරනු ලබන අවස්ථාවේ දී සිරභාරයට ගන්නා නිලධරයා විසින් (මේ කොටසේ මින්මතු "සැකකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) සිරභාරයට ගනු ලබන තැනැත්තා වෙත-

(අ) සිරභාරයට ගන්නා නිලධරයාගේ අනන්‍යතාවය;

(ආ) සැකකරු විසින් සිදුකර ඇතැයි කියනු ලබන වරද;

(ඇ) ලිඛිත නීතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි නීතීඥවරයකු මුණගැසීම සඳහා එම තැනැත්තාට ඇති අයිතිවාසිකම,

සම්බන්ධයෙන් තොරතුරු ලබා දිය යුතු ය.

(2) ඒ තොරතුරු සිංහල, දෙමළ, හෝ ඉංග්‍රීසි භාෂාවලින් සැකකරුට අවබෝධ වන කවර හෝ භාෂාවකින් ලබාදීම සඳහා සෑම සාධාරණ පියවරක්ම ගත යුතු ය.

(3) සිරභාරයට ගන්නා වේලාවේ දී (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට සැකකරුට තොරතුරු ලබාදීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, එකී තොරතුරු ඔහුට අවබෝධ වන යම් භාෂාවකින් හැකිතාක් ඉක්මණින් ලබා දිය යුතු ය.

සිරභාරයට ගැනීම පෞද්ගලිකත්වය කෙරෙහි නිසි සැලකිල්ල ඇතිව කරනු ලැබිය යුතු බව.

**22.** සෑම සිරභාරයට ගැනීමක් ම සිරභාරයට ගනු ලබන තැනැත්තාගේ පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් නිසි සැලකිල්ල දක්වමින් සිදු කළ යුතු ය. සැකකාරියක් සිරභාරයට ගැනීමේ දී සිරභාරයට ගන්නා නිලධාරිනියක විසින් එය සිදු කරනු ලැබීමට හෝ නිලධාරිනියක ඉදිරිපිට දී සිදුකරනු ලැබීමට වගබලා ගැනීම සඳහා හැකි සෑම පියවරක්ම ගත යුතු ය.

**ස්ත්‍රීන් සෝදිසි කිරීම සහ ස්ත්‍රීන්ගෙන් ප්‍රශ්න කිරීම.**

**23.** (1) යම් ස්ත්‍රියකගෙන් ප්‍රශ්න කිරීම සිරභාරයට ගන්නා නිලධාරිනියක විසින් සිදුකරනු ලැබීමට හෝ නිලධාරිනියක ඉදිරිපිට දී සිදුකරනු ලැබීමට වගබලා ගැනීම සඳහා හැකි සෑම පියවරක්ම ගත යුතු ය.

(2) ස්ත්‍රියක් සෝදිසි කිරීම අනිවාර්යයෙන්ම නිලධාරිනියක විසින් සිදුකළ යුතු ය.

**සැකකරු වෛද්‍ය පරීක්ෂණයට ලක්කිරීම.**

**24.** (1) සැකකරු රඳවා තබා ගනු ලැබූ පොලිස් ස්ථානය භාර නිලධරයා හෝ එකී පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් බලය ලබා දෙන පොලිස් නිලධරයකු විසින් එකී සැකකරුට යම් දෘශ්‍යමාන හානියක් තිබේද යන්න දැනගැනීම සඳහා ඔහු පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(2) සැකකරුට යම් දෘශ්‍යමාන හානියක් තිබේ නම් පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් එකී තැනැත්තා අධිකරණ වෛද්‍ය නිලධරයකු මඟින් හෝ ආණ්ඩුවේ වෝහාරික වෛද්‍ය විශේෂඥවරයකු මඟින් පරීක්ෂා කරවාගෙන වාර්තාවක් ලබා ගත යුතු ය.

(3) වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා හේතුවක් ඇත්නම් මිස, එකී අධිකරණ වෛද්‍ය නිලධරයා හෝ ආණ්ඩුවේ වෝහාරික වෛද්‍ය විශේෂඥවරයා විසින්, ප්‍රමාදයකින් තොරව, එකී සැකකරු පොලිස් අත්අඩංගුවට නැවත භාරදිය යුතු ය.

**සිරභාරයට ගැනීම සම්බන්ධයෙන් දැනුම් දීම.**

**25.** (1) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව යම් තැනැත්තකු සිරභාරයට ගන්නා, යම් නිලධරයකු විසින් සැකකරුගේ ළඟම ඥාතියාගේ පවුලේ යම් වැඩිහිටි සාමාජිකයකු සිරභාරයට ගන්නා අවස්ථාවේ දී පැමිණ සිටී නම්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් එහෙත්, සිරභාරයට ගැනීමෙන් පැය විසිහතරක් ගත වීමට පෙර එකී සැකකරු සිරභාරයට ගැනීම සහ අත්අඩංගුවට ගැනීම පිළිගන්නා වූ දැනුම්දීමක් මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය අනුව, එකී තැනැත්තා වෙත ලබා දිය යුතු ය.

(2) එකී සිරභාරයට ගැනීම හා අත්අඩංගුවට ගැනීම පිළිගන්නා වූ දැනුම්දීමෙහි -

(අ) සිරභාරයට ගැනීම සිදුකළ දිනය, වේලාව සහ ස්ථානය;

(ආ) සිරභාරයට ගැනීමට හේතු;

(ඇ) අත්අඩංගුවේ තබා ගනු ලබන හෝ රඳවා තබාගනු ලබන ස්ථානය;

(ඈ) සිරභාරයට ගන්නා නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය; සහ

(ඉ) විමර්ශන පැවැත්වීමට අගතියක් නොමැතිව, සැකකරුගේ ළඟම ඥාතියාට ඔහු වෙත ප්‍රවේශවීමට යුක්තිසහගත ලෙස අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු,

ඇතුළත් විය යුතු ය.

(3) එවැනි තැනැත්තකු පැමිණ නොසිටී නම්, (1) වන උපවගන්තියේ සඳහන් සිරභාරයට ගැනීම සහ අත්අඩංගුවට ගැනීම පිළිගන්නා වූ දැනුම්දීම භාරදිය යුතු වන්නා වූ යම් තැනැත්තකුගේ අනන්‍යතාවය සහ සිටින තැන සම්බන්ධයෙන් සිරභාරයට ගන්නා නිලධරයා එම සැකකරුගෙන් විමසිය යුතු අතර සැකකරු විසින් එකී තොරතුරු ලබා දෙන්නේ නම් එම දැනුම්දීම එකී තැනැත්තා වෙත භාරදීම සඳහා හැකි සෑම පියවරක්ම ගත යුතු ය. එකී දැනුම්දීමෙහි පිටපතක් සැකකරුට භාරදිය යුතු ය.

(4) සැකකරු රඳවා තබා ගනු ලබන්නා වූ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් එකී තැනැත්තා සිරභාරයට ගැනීමෙන් පසුව කවර අවස්ථාවක දී වුව ද පැය විසිහතරකට වඩා ගත නොවී එකී සිරභාරයට ගැනීම සහ රඳවා තබාගැනීම සම්බන්ධයෙන් මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැන්විය යුතු අතර මේ පනතේ තුන්වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව, පොලිස්පතිවරයා වෙත හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා වෙත දැන්විය යුතු ය.

(5) එකී දැනුම්දීමෙහි -

(අ) සිරභාරයට ගැනීම සිදුකළ දිනය, වේලාව සහ ස්ථානය;

(ආ) සිරභාරයට ගැනීමට හේතු;

(ඇ) සැකකරු රඳවා තබා ගනු ලබන ස්ථානය;

(ඇ) සිරභාරයට ගන්නා නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය;

(ඉ) මානව හිමිකම් කොමිෂන් සභාවට සැකකරු ඉක්මණින් මුණගැසීමට හැකි කරවනු ලබන වෙනත් යම් තොරතුරු; සහ

(ඊ) එකී සිරභාරයට ගැනීමෙන් සහ රඳවා තබා ගැනීමෙන් අදාළ තැනැත්තාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත්තේ ද යන්න නිශ්චය කිරීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිය හැකි වෙනත් යම් තොරතුරු,

ඇතුළත් විය යුතු ය.

මධ්‍යගත දත්ත ගබඩාව හා රෙජිස්ටරය.

**26.** (1) පොලිස්පතිවරයා විසින්, මේ පනත යටතේ සිදු කළ එක් එක් සිරභාරයට ගැනීම, රඳවා තබා ගැනීම, රිමාන්ඩ් භාරයේ තැබීම, ඇප ලබා දීම, නිදහස් කිරීම, නඩු පැවරීම, වරදකරු කිරීම හෝ නිදොස් කිරීම සහ දඬුවම් ලබාදීම සම්බන්ධයෙන් වන තොරතුරු අඩංගු වන මධ්‍යගත දත්ත ගබඩාවක් සහ රෙජිස්ටරයක් ස්ථාපනය කොට පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) එකී දත්ත ගබඩාවේ සහ රෙජිස්ටරයේ -

(අ) සිරභාරයට ගැනීමේ, අත්අඩංගුවෙහි තබා ගැනීමේ සහ රඳවා තබා ගැනීමේ නීත්‍යනුකූලභාවය;

(ආ) සැකකරුගේ නිදහස අහිමි කිරීමේ නීත්‍යානුකූලභාවය; සහ

(ඇ) අඛණ්ඩව රඳවා තබා ගැනීමේ සහ රිමාන්ඩ් භාරයේ තැබීමේ අවශ්‍යතාවය,

නිශ්චය කිරීම සඳහා අවශ්‍ය වෙනත් යම් තොරතුරු ද ඇතුළත් විය යුතු ය.

(3) මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිනු ලබන කවර හෝ අවස්ථාවක දී පොලිස්පතිවරයා විසින් එම දත්ත ගබඩාවේ සහ රෙජිස්ටරයේ ඇතුළත් තොරතුරු මානව හිමිකම් කොමිෂන් සභාවට ලබා දිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ලබා ගත් තොරතුරු මානව හිමිකම් කොමිෂන් සභාවේ පරමාර්ථ ක්‍රියාවට නැංවීමේ කාර්ය සඳහා පමණක් භාවිත කළ යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ ලබා ගත් තොරතුරු, සිදු කරමින් පවතින විමර්ශනවලට අගතියක් වන ආකාරයට කිසිදු තැනැත්තකු විසින් භාවිත නොකරන බවට වගබලා ගැනීම මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යය විය යුතු ය.

මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීම.

**27.** (1) මේ පනත ප්‍රකාරව සිරභාරයට ගෙන රඳවා තබා ගෙන ඇති සැකකරුවකු එසේ සිරභාරයට ගැනීමෙන් පසු පැය හතළිස් අටක් ගතවීමට පෙර යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ යුතු ය:

එසේ වුව ද, සිරභාරයට ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ දේශයෙන් බැහැර දී හෝ යම් ගුවන්යානයක දී හෝ යාත්‍රාවක දී සිදු කරනු ලැබ ඇති විට දී, සිරභාරයට ගන්නා ලද ස්ථානයේ සිට අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත ගමන් කිරීම සඳහා අවශ්‍ය කාලසීමාව, එම පැය හතළිස් අට ගණනය කිරීමේ දී බැහැර කළ යුතු ය.

(2) සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේ දී -

(අ) 31 වන වගන්තිය ප්‍රකාරව වලංගු රඳවා තැබීමේ නියමයක් නිකුත් කරනු ලැබ එය මහෙස්ත්‍රාත්වරයා විසින් පරීක්ෂා කිරීම සඳහා ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබූ විට දී, මහෙස්ත්‍රාත්වරයා විසින් එම රඳවා තබා ගැනීමේ නියමය බලාත්මක කිරීම සඳහා ආඥාවක් ලබා දිය යුතු ය; නැතහොත්

(ආ) රඳවා තැබීමේ නියමයක් නිකුත් කොට නොමැති විට දී හෝ එවැනි රඳවා තැබීමේ නියමයක් මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කොට නොමැති විට දී, මහෙස්ත්‍රාත්වරයා විසින් -

(i) අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් සැකකරු රිමාන්ඩ් භාරයේ තැබීම සඳහා ආඥාවක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන්නේ නම්, අවස්ථානුගත කරුණු අනුව

සාධාරණ බවට සලකනු ලබන හේතූන් මත පදනම්ව, රිමාන්ඩ් භාරයේ තබන ලෙස ආඥා කළ යුතු ය; හෝ

(ii) අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, ඇප ලබා දෙන ලෙස ඉල්ලා සිටින්නේ නම් හෝ ඇප ලබා දීමට කිසිදු විරෝධයක් දක්වනු නොලබන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් සඳහන් කරනු ලැබිය යුතු කොන්දේසි මත, 1997 අංක 30 දරන ඇප පනතේ විධිවිධාන යටතේ සැකකරු ශරීර ඇප හැර වෙනත් ඇප මත මුදා හරිනු ලැබිය යුතු ය; හෝ

(iii) අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ඉල්ලා සිටින්නේ නම්, සැකකරු නිදහස් කළ යුතු ය.

(3) සැකකරු ඉදිරිපත් කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද එම මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) පෞද්ගලිකව සැකකරු හමුවී, පුද්ගලික සාකච්ඡාවක් මගින් ඔහුගේ යහපැවැත්ම සහ සුභසිද්ධිය පිළිබඳව සොයා බැලීම; සහ

(ආ) සැකකරු විසින් කරනු ලබන යම් අදහස් දැක්වීමක් වාර්තා කිරීම,

කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා "පුද්ගලික සාකච්ඡාව" යන්නෙන්, විවෘත අධිකරණයේ දී හෝ මහෙස්ත්‍රාත්වරයාගේ නිල මැදිරියෙහි දී පවත්වනු ලබන්නා වූ ද, සිරභාරයට ගැනීමට සහභාගී වූ හෝ සැකකරු විසින් සිදුකර ඇතැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් විමර්ශනය කරන ලද, යම් පොලිස් නිලධරයකු නොමැතිව සිදුකරනු ලබන්නා වූ ද, නඩු කටයුතු අදහස් වේ.

**මහෙස්ත්‍රාත්වරයා විසින් සැකකරු වෝහාරික වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කිරීමට විධාන කළ යුතු බව.**

**28.** (1) සැකකරු විසින් ඉදිරිපත් කරන ලද යම් පැමිණිල්ලක් සහ ඊට විත්ති වාචකයක් ලෙස සිරභාරයට ගන්නා නිලධරයා හෝ අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් සිදුකරන ලද කරුණු දැක්වීම් සැලකිල්ලට ගැනීමෙන් පසු එම සැකකරු වධහිංසාවලට භාජනය වී ඇති බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන විට දී, ආණ්ඩුවේ වෝහාරික වෛද්‍ය විශේෂඥවරයකු වෙත ඒ සැකකරු වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කරන ලෙස ද ඒ වෛද්‍ය විශේෂඥවරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තාවක් භාරදිය යුතු බවට ද, මහෙස්ත්‍රාත්වරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(2) ආණ්ඩුවේ වෝහාරික වෛද්‍ය විශේෂඥවරයාගේ වාර්තාවෙන් සැකකරු වධහිංසාවලට භාජනය වී තිබීමට ඉඩ ඇති බවට හෙළිදරව් කරනු ලබන විට දී, සැකකරුට සහ සිරභාරයට ගන්නා නිලධරයාට හෝ පොලිස් ස්ථානය භාර නිලධරයාට කරුණු දැක්වීම සඳහා අවස්ථාව ලබාදීමෙන් පසු මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) සැකකරු අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමු කළ යුතු ය; සහ

(ආ) සැකකරු රිමාන්ඩ් භාරයේ තැබීමට ආඥා කරනු ලැබිය යුතු ය.

(3) සැකකරු රිමාන්ඩ් භාරයේ තබන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබූ විට දී, කලින් සැකකරු වෙත ප්‍රවේශ වීමට හැකියාව තිබූ පොලිස් නිලධරයන්ට සැකකරු වෙත ප්‍රවේශ වීමට නොහැකි විය යුතු ය.

(4) එකී සැකකරුට අදාළ විමර්ශන පොලිස්පතිවරයා විසින් විධාන කරනු ලබන පරිදි වෙනත් යම් පොලිස් නිලධරයන් විසින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(5) වධහිංසා සිදු කරන ලද බවට චෝදනා ලද තැනැත්තාට විරුද්ධව අපරාධ නඩු කටයුතු පැවරීමට නීතිපතිවරයාට හැකි කරවීම සඳහා කරන ලදැයි කියනු ලබන වධහිංසා සිදු කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයාට විධාන කරනු ලැබිය යුතු ය.

**විශේෂ හේතු මත මහාධිකරණයේ ඇප ලබා දීම.**

**29.** 30 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විශේෂ හේතු මත මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් ලබාදෙන ලද ආඥාවක බලය මත හැර රිමාන්ඩ් භාරයේ තැබූ කිසිම තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු විසින් ඇප මත මුදා හරිනු නොලැබිය යුතු ය.

**රිමාන්ඩ් භාරයේ තැබිය හැකි උපරිම කාලසීමාව.**

**30.** (1) අපරාධ නඩු කටයුතු පැවරීමෙන් තොරව කිසිම තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ දිනයේ සිට මාස හයක් ඉක්මවන කාලසීමාවක් සඳහා රිමාන්ඩ් භාරයේ නොතැබිය යුතු ය:

එසේ වුව ද, නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් කරන ලද ආඥාවකින් රිමාන්ඩ් භාරයේ තබන කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය:

එසේ ම තවදුරටත්, උපරිම සමුච්චිත දීර්ඝ කිරීමේ කාලසීමාව මාස හයක් නොඉක්මවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත අපරාධ නඩු පවරනු නොලැබුවේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් සඳහන් කරනු ලැබිය යුතු කොන්දේසි මත සැකකරු ඇප මත මුදා හරිනු ලැබිය යුතු ය.

**රඳවා තැබීමේ නියම.**

**31.** (1) (අ) (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් යම් කාර්යයක් සඳහා සැකකරුවකු රඳවා තබා ගැනීම සඳහා රඳවා තැබීමේ නියමයක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නා වූ යම් පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් අදාළ පොලිස් කොට්ඨාසය භාර නිලධරයාගේ නිර්දේශය ඇතිව නියෝජ්‍ය පොලිස්පතිවරයකු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) සැකකරු විසින් මේ පනත යටතේ වන වරදක් කරනු ලැබ ඇති බවට හෝ වරදක් කිරීමට සම්බන්ධ වී ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බවට නියෝජ්‍ය පොලිස්පතිවරයා සෑහීමට පත්වන්නේ නම් ඔහු විසින්, අනුමත කළ රඳවා තබා ගැනීමේ කොන්දේසි යටතේ අනුමත රඳවා තබා ගැනීමේ ස්ථානයක සැකකරු රඳවා තබා ගැනීමට බලය ලබා දෙමින් මේ පනතේ හතරවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ආකෘතියට සාරානුකූලව රඳවා තැබීමේ නියමයක් ලබා දෙනු ලැබිය හැකි ය.

(ඇ) කිසිදු රඳවා තැබීමේ නියමයක් එක් වරකට සති දෙකක් ඉක්මවන කාලසීමාවක් සඳහා නිකුත් කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක , එය ලබා දීම සඳහා වූ හේතු ඇතුළත් විය යුතු අතර හුදෙක්ම පහත

සඳහන් කාර්ය සඳහා අවශ්‍ය වන විටදී පමණක් එකී රඳවා තැබීමේ නියමයක් නිකුත් කළ යුතු ය:-

(අ) සැකකරුට අදාළ විමර්ශන පැවැත්වීමට පහසුකම් සැලසීම;

(ආ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට අදාළ විමර්ශනය සඳහා තොරතුරු සහ ලබා ගත හැකි සාක්ෂි ලබා ගැනීම;

(ඇ) රඳවා තබා සිටිය දී සැකකරුගෙන් ප්‍රශ්න කිරීම; සහ

(ඈ) රඳවා තැබීමේ නියමයෙහි වාර්තාගත කළ යුතු හේතූන් මත මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වන සාක්ෂි සුරක්ෂිත කිරීම.

(3) 27 වන වගන්තිය යටතේ අදාළ සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ දී මේ වගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක් ලබා දී ඇති විට දී, රඳවා තබා ගැනීමේ නියමයේ සහතික කළ පිටපතක් පරීක්ෂා කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි තැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වන සෑම රඳවා තැබීමේ නියමයකම පිටපතක් රඳවා තබා ගනු ලබන සැකකරුට භාර දිය යුතු අතර සැකකරු විසින් එය භාරගත් බවට වන ප්‍රකාශයක් ලබාගෙන එය අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනුගත කළ යුතු ය.

(5) රඳවා තැබීමේ නියමයෙහි පිටපතක් සැකකරුගේ ළඟම ඥාතියාට හෝ පවුලේ වැඩිහිටි සාමාජිකයකු ට භාර දිය යුතු අතර එකී පිටපත භාරදෙනු ලබන ආකාරය සම්බන්ධයෙන් 25 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(6) පොලිස්පතිවරයාගේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් මේ වගන්තියේ කාර්යය සඳහා "අනුමත රඳවා තබා ගැනීමේ ස්ථාන" ලෙස යම් ස්ථාන සංඛ්‍යාවක් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(7) පොලිස්පතිවරයා සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විමසා, අමාත්‍යවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන

නියමයක් මගින් මේ වගන්තියේ කාර්යය සඳහා "අනුමත කළ රඳවා තබා ගැනීමේ කොන්දේසි" නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

රඳවා තබා ගැනීමේ ස්ථානයක් නිරීක්ෂණය කිරීමට මහෙස්ත්‍රාත්වරයකු පැමිණීම.

**32.** (1) රඳවා තැබීමේ නියමයක බලතල යටතේ රඳවා තබා ගනු ලැබූ සැකකරුවකු ඉදිරිපත් කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද එම මහෙස්ත්‍රාත්වරයාට එකී රඳවා තැබීමේ ස්ථානය භාර බලධරයාට පූර්ව දැනුම්දීමක් ලබා දීමෙන් තොරව -

(අ) එකී සැකකරු රඳවා තබා ගැනීමේ ස්ථානය නිරීක්ෂණය කරනු ලැබීමට; සහ

(ආ) සැකකරු සම්මුඛ සාකච්ඡාවකට භාජනය කර ඔහුගේ යහපැවැත්ම පිළිබඳ සොයා බැලීමට,

බලය තිබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයාට ඉක්මණින් සහ බාධාවකින් තොරව යම් රඳවා තබා ගැනීමේ ස්ථානයකට ප්‍රවේශවීමට ඉඩ ලබා දීම එම ස්ථානය භාර බලධරයාගේ කාර්යය විය යුතු ය.

(3) සැකකරු වධහිංසාවලට භාජනය වී ඇති බවට මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන්නේ නම් හෝ තමා වධහිංසාවලට භාජනය වූ බවට සැකකරු චෝදනා කරනු ලබන්නේ නම්, සැකකරු ආණ්ඩුවේ වෝහාරික වෛද්‍ය විශේෂඥවරයකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ද ඒ පිළිබඳව වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරන ලෙස ද මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය යුතු ය.

(4) සැකකරුට සහ අදාළ පොලිස් නිලධරයාට හෝ නිලධරයන්ට කරුණු දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දීමෙන් පසු, සැකකරු වධහිංසාවලට භාජනය වී ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් 28 වන වගන්තියේ (2), (3), (4) සහ (5) වන උපවගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

රඳවා තබා ගැනීම පිළිබඳ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැන්වීම.

**33.** (1) සැකකරුවකු රඳවා තබා ගනු ලබන්නේ යම් පොලිස් ස්ථානයක ද එම පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, ප්‍රායෝගිකව හැකි තාක් ඉක්මණින් එහෙත් කවර විටක දී වුව ද රඳවා තබා ගැනීම ආරම්භ වීමෙන් පැය හැත්තෑ දෙකක් ගතවීමට

පෙර එකී රඳවා තබා ගැනීම පිළිබඳ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැන්විය යුතු ය.

(2) රඳවා තබා ගැනීමේ නියමයේ පිටපතක් ප්‍රායෝගිකව හැකි තාක් ඉක්මණින් මානව හිමිකම් කොමිෂන් සභාවට භාරදිය යුතු ය.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අනුමත කළ රඳවා තබා ගැනීමේ ස්ථානයක් නිරීක්ෂණය කිරීමට පැමිණීම.

**34.** පූර්ව දැනුම්දීමක් ලබා දීමෙන් තොරව මානව හිමිකම් කොමිෂන් සභාවේ යම් බලයලත් නිලධරයකුට -

(අ) යම් අනුමත රඳවා තබා ගැනීමේ ස්ථානයකට ඇතුල් වී පරීක්ෂා කිරීමට;

(ආ) එකී රඳවා තබා ගැනීමේ ස්ථානයේ පවත්වාගෙන යනු ලැබිය යුතු රඳවා ගැනීමේ නාමලේඛන, රඳවා තැබීමේ නියමයන් සහ වෙනත් පොත්පත් හා ලේඛන ඉල්ලා පරීක්ෂා කිරීමට; සහ

(ඇ) එකී ස්ථානයේ රඳවා තබා ගෙන ඇති තැනැත්තන් සම්මුඛ සාකච්ඡාවට භාජනය කිරීමට,

හිමිකම තිබිය යුතු ය :

එසේ වුව ද, විමර්ශන සටහන් සහ සාක්ෂිකරුවන්ගේ හෝ වෙනත් තැනැත්තන්ගේ වාර්තාගත කළ ප්‍රකාශ පරීක්ෂා කිරීමට මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධරයාට හිමිකම නොතිබිය යුතු ය.

යම් රඳවා තබා ගැනීමේ ස්ථානයකට පැමිණීමට මහේස්ත්‍රාත්වරුන්ට හිමිකම තිබිය යුතු බව.

**35.** පූර්ව දැනුම්දීමකින් තොරව යම් අනුමත කළ රඳවා තබා ගැනීමේ ස්ථානයකට ඇතුල්වීමට, එකී රඳවා තබා ගැනීමේ ස්ථානය, එකී රඳවා තබා ගැනීමේ ස්ථානයේ පවත්වාගෙන යනු ලැබිය යුතු නාමලේඛන, රඳවා තබා ගැනීමේ නියමයන් සහ වෙනත් පොත්පත් සහ ලේඛන පරීක්ෂා කිරීමට යම් මහේස්ත්‍රාත්වරයකුට හිමිකම තිබිය යුතු ය.

සති දෙකක් ඉක්මවා රඳවා තබා ගැනීම මහේස්ත්‍රාත්වරයාගේ අනුමතය ඇතිව පමණක් සිදු කළ යුතු බව.

**36.** (1) 31 වන වගන්තිය යටතේ ලබාදෙන ලද රඳවා තැබීමේ නියමයක් ප්‍රකාරව සති දෙකක කාලසීමාවක් ඉක්මවා යම් සැකකරුවකු රඳවා තබා ගැනීමට අවශ්‍ය වන විට දී, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් -

(අ) සැකකරුට විරුද්ධව ඇති චෝදනාව ;

(ආ) විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු; සහ

(ඇ) වැඩිදුර රඳවා තබා ගැනීමට අවශ්‍ය හේතු,

සඳහන් කරමින් මහෙස්ත්‍රාත් අධිකරණයේ රහස්‍ය වාර්තාවක් ගොනු කර ඒ සැකකරු අඛණ්ඩව රඳවා තබා ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයාගේ අනුමතය ලබා ගත යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින් එසේ ගොනු කරනු ලැබූ වාර්තාවේ රහස්‍යභාවය සහතික කරනු ලැබිය යුතු ය.

(3) සැකකරුට හෝ ඔහුගේ නීතීඥවරයාට රඳවා තැබීමේ කාලසීමාව දීර්ඝ කිරීමට විරෝධය පළ කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් තොරතුරු ලබා ගැනීම සඳහා හිමිකම තිබිය යුතු ය.

(4) රඳවා තැබීමේ කාලසීමාව දීර්ඝ කිරීමක් අපේක්ෂා කරන්නා වූ පොලිස් නිලධරයාගේ කරුණු දැක්වීම් සහ සැකකරු හෝ ඔහුගේ නීතීඥවරයා විසින් එම දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ විරෝධතා මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තා කරනු ලැබිය යුතු ය.

(5) මහෙස්ත්‍රාත්වරයා විසින් හේතු දක්වමින් රඳවා තැබීමේ කාලසීමාව දීර්ඝ කිරීමට හෝ එවන් දීර්ඝ කිරීමක් ප්‍රතික්ෂේප කිරීමට ආඥා කරනු ලැබිය හැකි ය.

(6) (අ) රඳවා තැබීමේ නියමයක් දීර්ඝ කිරීම මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, සැකකරු රිමාන්ඩ් භාරයට පත් කිරීමට සාධාරණ හේතු පවතින්නේ ද යන්න ඔහු පරීක්ෂා කළ යුතු ය.

(ආ) සැකකරු මේ පනත යටතේ වරදක් කර ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ පදනමක් පවතින බව, පරීක්ෂණයෙන් පසුව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන්නේ නම්, සැකකරු රිමාන්ඩ් භාරයට පත් කළ යුතු ය.

(ඇ) සැකකරු මේ පනත යටතේ වරදක් කර ඇති බවට විශ්වාස කිරීමට හේතු නොමැති අවස්ථාවක දී, ඔහුව රඳවා තැබීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ වන නඩු කටයුතු රහසේ පවත්වනු ලැබිය යුතු ය.

රඳවා තැබීමේ නියම යටතේ රඳවා තැබීමේ උපරිම කාලසීමාව.

**37.** කිසිදු සැකකරුවකු 31 වන වගන්තිය යටතේ කරනු ලැබූ රඳවා තැබීමේ නියම යටතේ සති අටක් ඉක්මවන්නා වූ කාලසීමාවක් සඳහා රඳවා තබා ගනු නොලැබිය යුතු ය.

රඳවා තැබීම දීර්ඝ කිරීමට හෝ රඳවා තැබීම දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනා කිරීම.

**38.** (1) පොලිස් නිලධරයා හෝ සැකකරු විසින් 36 වන වගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමය දීර්ඝ කිරීමක් ප්‍රදානය කිරීමකට හෝ ප්‍රතික්ෂේප කිරීමකට එරෙහිව අදාළ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින් එවැනි අභියාචනයක් අදාළ මහෙස්ත්‍රාත් අධිකරණය පිහිටුවා ඇති ප්‍රදේශය පිළිබඳ අධිකරණ බලය ඇති මහාධිකරණය වෙත පොලිස් නිලධරයා විසින් ගොනු කරනු ලැබූ රහස්‍ය වාර්තාව හා නඩු කටයුතු පිළිබඳ වාර්තාවද සමග රහස්‍ය කවරයකින් වහාම යොමු කරනු ලැබිය යුතු ය.

(3) එවැනි යම් අභියාචනයක් පොලීසියට, නීතිපතිවරයාට හා සැකකරු නියෝජනය කරන නීතීඥවරයාට සවන් දෙනු ලැබීමට අවස්ථාව සැලසීමෙන් පසුව එම අභියාචනය ගොනු කරනු ලැබූ දිනයේ සිට සති තුනක් ඇතුළත විභාග කර අවසන් කිරීම එකී මහාධිකරණයේ කාර්යය විය යුතු ය.

(4) මහාධිකරණය විසින් -

(අ) මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබූ ආඥාව ස්ථිර කිරීම; හෝ

(ආ) (i) රඳවා තැබීමේ නියමය දීර්ඝ කිරීමක් ප්‍රදානය කිරීමෙන්; හෝ

(ii) සැකකරු රිමාන්ඩ් භාරයට පත් කිරීමෙන්,

මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාව ප්‍රතිශෝධනය කිරීම කළ හැකි ය.

සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු බව.

**39.** (1) යම් රඳවා තැබීමේ නියමයකට අදාළ කාලය අතරතුර, සෑම දින දහහතරකට වරක්ම සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මහෙස්ත්‍රාත්වරයා විසින් 27 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(3) රඳවා තැබීමේ නියමය යටතේ වන රඳවා තැබීමේ කාලසීමාව අවසන් වූ පසු සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එම ඉදිරිපත් කිරීමෙන් පසුව අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් යම් පොලිස් නිලධරයකු විසින් -

(අ) සැකකරු මේ පනත යටතේ යම් වරදක් සිදු කළ බවට විශ්වාස කිරීමට ප්‍රබල සාක්ෂි මත පිහිටි හේතු පවතින බව සහ වැඩිදුර විමර්ශන පවත්වාගෙන යන බව; හෝ

(ආ) විමර්ශනය අවසන්කර ඇති බව සහ සැකකරුට විරුද්ධව අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම සලකා බැලීමට නීතිපතිවරයා වෙත ඉල්ලුම් කර ඇති හෝ ඉල්ලුම් කළ යුතු බව, මහෙස්ත්‍රාත්වරයාට දැනුම් දුන් අවස්ථාවකදී, මහෙස්ත්‍රාත්වරයා විසින් සැකකරු රිමාන්ඩ් භාරයේ රඳවා තබා ගත යුතු බවට ආඥා කරනු ලැබිය යුතු ය.

පොලිස් නිලධරයාට රිමාන්ඩ් භාරයේ සිටින සැකකරු වෙත ප්‍රවේශ විය හැකි බව.

**40.** මහෙස්ත්‍රාත්වරයා විසින් අන්‍යාකාරයකින් ආඥා කරන්නේ නම් මිස, මේ පනත යටතේ යම් විමර්ශනයක් පවත්වාගෙන යන පොලිස් නිලධරයකු විසින් -

(අ) මේ පනත ප්‍රකාරව රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ යම් සැකකරුවකු වෙත ප්‍රවේශ වීමට සහ සැකකරු සමඟ සම්මුඛව සාකච්ඡා කිරීමට;

(ආ) තත් කාර්යය සඳහා මහෙස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලීමක් කර ලබාගත් අවසරය ඇතිව, ඔහුගේ ප්‍රකාශයන් වාර්තාගත කිරීමට;

(ඇ) වැඩිදුර විමර්ශන පැවැත්වීමේ කාර්යය සඳහා මහෙස්ත්‍රාත්වරයකු විසින් කරන ලද ආඥාවක බලය යටතේ සැකකරු රිමාන්ඩ් භාරයෙන් ඉවතට ගැනීමට,

හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද, ඉහත සඳහන් සෑම අවස්ථාවකදීම, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු සහභාගී වි යුතු ය.

රඳවා තැබීමේ නියමවලින් පරිපාලනමය සහන සඳහා වන සමාලෝචන මණ්ඩලය.

**41.** (1) 31 වන වගන්තිය යටතේ කරනු ලැබූ රඳවා තැබීමේ නියමවලට එරෙහිව කරනු ලබන අභියාචන සඳහා පරිපාලනමය සහන ප්‍රදානය කිරීමට සමාලෝචන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සමාලෝචන මණ්ඩලය -

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන්; සහ

(ආ) (i) අපරාධ විමර්ශනය හා අපරාධ යුක්තිය; සහ

(ii) මානව හිමිකම්,

යන ක්ෂේත්‍රයන්හි වෘත්තීය විශිෂ්ටත්වය හා පළපුරුද්ද ලබාගත්, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තන් දෙදෙනෙකුගෙන්,

සමන්විත විය යුතු ය.

(3) 31 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලැබූ යම් රඳවා තැබීමේ නියමයක් යටතේ සිරභාරයට ගැනීමට හා රඳවා තැබීමට ගනු ලැබූ තීරණය හේතුවෙන් අතෘප්තියට පත් වූ යම් සැකකරුවකු හෝ ඔහු වෙනුවෙන් නීතිඥවරයකු විසින්, එකී නියමය සමාලෝචනය කිරීම සඳහා සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) සමාලෝචන මණ්ඩලය විසින් අභියාචනයේ සඳහන් හේතු ද, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් රඳවා තැබීමේ නියමය

සඳහා ඉල්ලුම් කරන ලද නිලධරයාගේ සහාය ඇතිව එම නියමය ඉල්ලා සිටීමට හේතු වශයෙන් ඉදිරිපත් කරන කරුණු ද, රඳවා තැබීමේ නියමය නිකුත් කරනු ලැබූ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ඉදිරිපත් කරන කරුණු ද සැලකිල්ලට ගනිමින් අභියාචනය පිළිබඳ සලකා බැලිය යුතු අතර, ඒ පිළිබඳ තීරණයක් ලබා දිය යුතු ය.

(5) එකී තීරණයට -

(අ) සැකකාර අභියාචක අඛණ්ඩව රඳවා තැබීමට; හෝ

(ආ) සැකකරු රඳවා තැබීම අවසන් කිරීමට හා සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීමට හා සැකකරු රිමාන්ඩ් භාරයේ තැබීමට ඉල්ලුම් කිරීමට; හෝ

(ඇ) සැකකරුට ඇප ප්‍රදානය කළ හැකි ලෙසින් සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීමට,

අදාළ විධාන ඇතුළත් විය හැකි ය.

(6) එකී තීරණය, අභියාචනය කර සති දෙකක් ඇතුළත ලබා දිය යුතු අතර ඒ සඳහා හේතු ඇතුළත් කළ යුතු ය. තව ද, අභියාචකට ද, රඳවා තැබීමේ නියමය නිකුත් කරනු ලැබූ නියෝජ්‍ය පොලිස්පතිවරයාට ද, රඳවා තැබීමේ නියමය සඳහා ඉල්ලුම් කරනු ලැබූ නිලධරයාට ද, දැනුම් දෙනු ලැබිය යුතු ය.

**රිමාන්ඩ් භාරයේ තැබීම අතරතුර රඳවා තැබීම.**

**42.** (1) මේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ යම් තැනැත්තකු -

(අ) මේ පනත යටතේ යම් වරදක් සිදු කරන බවට;

(ආ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට සූදානම් වන බවට හෝ තැත් කරන බවට;

(ඇ) රිමාන්ඩ් භාරයෙන් පලා යාමට තැත් කරන බවට; හෝ

(ඈ) සිරභාරයට ගැනීමට ප්‍රථම, මේ පනත යටතේ යම් වරදක් සිදු කර ඇති බවට හා පොලිස් ස්ථානය භාර නිලධරයා එම කරුණ දැන නොසිටි බවට,

යම් පොලිස් ස්ථානයක් භාර නිලධරයකු වෙත සත්‍ය බව ඔහු විශ්වාස කරන තොරතුරු ලැබුණු අවස්ථාවක දී, ඔහු විසින් එම තොරතුරු අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කළ යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින් එම තොරතුරු පිළිබඳ වහාම පරීක්ෂා කළ යුතු අතර, පරීක්ෂණය අවසානයේ දී, පොලිස් ස්ථානය භාර නිලධරයා සද්භාවයෙන් ක්‍රියා කර ඇති බවට හා පොලීසිය විසින් සැකකරුට විරුද්ධව සිදු කරනු ලැබූ චෝදනාව ප්‍රබල සාක්ෂි මත සිදු කර ඇති බව පෙනී යන බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන්නේ නම්, සහ සැකකරු රැඳවුම් භාරයේ තැබීම යෝග්‍ය බව මහෙස්ත්‍රාත්වරයාට හැඟී යන්නේ නම් ඔහු විසින් මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ රඳවා තැබීමේ නියමයක් ඉදිරිපත් කිරීම මත පොලිස් ස්ථානය භාර නිලධරයාට -

(අ) සැකකරු ස්වකීය භාරයට ගැනීමට;

(ආ) සැකකරු රිමාන්ඩ් භාරයෙන් ඉවත් කිරීමට; සහ

(ඇ) එකී රඳවා තැබීමේ නියමය ප්‍රකාරව එම සැකකරු රඳවා තබා ගැනීමට,

අවසර දෙනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ සැකකරුවකු රඳවා තැබීම -

(අ) මහෙස්ත්‍රාත්වරයා විසින් බලය ලබා දෙනු ලබන යම් කාලසීමාවක් සඳහා පමණක් විය යුතු ය;

(ආ) මේ පනත යටතේ රඳවා තබා ගනු ලබන තැනැත්තකුට අදාළ වන විධිවිධානවලට යටත් විය යුතු ය; සහ

(ඇ) සෑම දින දහහතරකට වරක්ම මහෙස්ත්‍රාත්වරයා විසින් සමාලෝචනයට ලක් කරනු ලැබිය යුතු ය.

(4) සැකකරු රිමාන්ඩ් භාරයේ සිට රැඳවුම් භාරයට මාරු කිරීම පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

**43.** (1) මේ පනත යටතේ සිර භාරයට ගත් යම් තැනැත්තකු රිමාන්ඩ් භාරයෙන් හෝ රඳවා තැබීමෙන් මුදා හැරීම මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව සහ මහෙස්ත්‍රාත්වරයා විසින් පනවනු ලැබිය හැකි යම් කොන්දේසියකට යටත්ව පමණක් කරනු ලැබිය යුතු ය.

රිමාන්ඩ් භාරයෙන් සහ රඳවා තැබීමෙන් මුදා හැරීම.

(2) ලිඛිතව බලය පවරනු ලැබූ නිලධරයකු, මුදා හැරීම සිදුවන අවස්ථාවට සහභාගී වීම සඳහා එවීමට අවශ්‍ය විය හැකි ප්‍රමාණවත් කාලසීමාවක් මානව හිමිකම් කොමිෂන් සභාවට ලබා දෙමින් අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් සැකකරුගේ මුදාහැරීම මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දෙනු ලැබිය යුතු ය.

**44.** මේ පනත යටතේ සැකකරුවකු නියෝජනය කරන යම් නීතිඥවරයකුට පොලිස් භාරයේ සිටින එවැනි තැනැත්තකු වෙත ප්‍රවේශ වීමට සහ ලිඛිත නීතියේ විධිවිධාන සලසා ඇති පරිදි කරුණු දැක්වීමට අයිතිවාසිකම තිබිය යුතු ය.

සැකකරු නියෝජනය කිරීමට යම් නීතිඥවරයකුට ඇති අයිතිවාසිකම.

**45.** මේ පනත යටතේ වන සැකකරුවකු සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 115 වන, 116 වන හා 120 වන වගන්තිවල විධිවිධාන අදාළ කරගනු නොලැබිය යුතු ය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඇතැම් වගන්ති අදාළ කර නොගත යුතු බව.

**46.** මේ පනතේ විධිවිධානවලට හා 45 වන වගන්තියට යටත්ව, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ ඕනෑම නීති කෘත්‍යයකට අදාළ කරගනු ලැබිය යුතු ය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදාළ කර ගැනීම.

**47.** අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 9 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මහෙස්ත්‍රාත්වරයකු වෙත කලින් ඉදිරිපත් කරනු ලැබූ මේ පනත යටතේ වන සැකකරුවකු සම්බන්ධයෙන් වන විමර්ශනය හා නඩු කටයුතු එසේ එම මහෙස්ත්‍රාත්වරයා වෙත සැකකරු ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේදී එකී මහෙස්ත්‍රාත්වරයා විනිශ්චයාසනය දැරූ මහෙස්ත්‍රාත් අධිකරණයේදී පවත්වනු ලැබිය යුතු ය.

මහෙස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩු කටයුතු.

**48.** (1) මේ පනතේ විධිවිධාන යටතේ රැඳවුම් භාරයේ තබනු ලැබූ හෝ රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ සැකකරුගේ රඳවා තබන

සැකකරුට මානුෂිකව සැලකිය යුතු බව.

ස්ථානය හෝ රිමාන්ඩ් භාරයේ තබන ස්ථානය මානුෂීය ලෙස සැලකීම සඳහා අවශ්‍ය වන අවශ්‍යතාවලින් සමන්විත විය යුතු අතර එකී ස්ථානය හෝ බන්ධනාගාරය භාර නිලධරයාගේ පූර්ව අවසරය ඇතිව රැඳවුම් භාරයේ හෝ රිමාන්ඩ් භාරයේ සිටින සැකකරුගේ පවුලේ සාමාජිකයන්ට හා ඔහුගේ නීතිඥවරයාට එම ස්ථානයට ප්‍රවේශ විය හැකි විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන යටතේ රඳවා තබන ස්ථානය හෝ රිමාන්ඩ් භාරයේ තබන ස්ථානය පරීක්ෂා කිරීමක දී, රඳවා තබන හෝ රිමාන්ඩ් භාරයේ තබන ස්ථානය, (1) වන උපවගන්තියේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන බවට මානව හිමිකම් කොමිෂන් සභාවට හෝ මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන්නේ නම්, එම කරුණු -

(අ) රඳවා තබා ගැනීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවලදී පොලිස්පතිවරයාට; හෝ

(ආ) රිමාන්ඩ් භාරයේ තබා ගැනීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවලදී බන්ධනාගාර අධිකාරීවරයාට,

දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) මානුෂීය ලෙස සැලකීම සඳහා අවශ්‍ය වන කවරාකාරයේ හෝ දෙයක් සැපයීම සඳහා අවශ්‍ය පියවර හැකි උපරිම ප්‍රමාණයෙන් ගනු ලැබීම පොලිස්පතිවරයාගේ හෝ බන්ධනාගාර අධිකාරීවරයාගේ කාර්යය විය යුතු ය.

(4) යම් සැකකරුවකු -

(අ) රඳවා තැබීමේ නියමයක් ප්‍රකාරව මාස එකක කාලසීමාවක් ඉක්මවා රැඳවුම් භාරයේ තබනු ලබන; හෝ

(ආ) නඩු විභාගය ආරම්භ කරන තෙක් රිමාන්ඩ් භාරයේ තබනු ලබන; හෝ

(ඇ) නඩු විභාගය අවසන් වන තෙක් රිමාන්ඩ් භාරයේ තබනු ලබන,

අවස්ථාවලදී, පොලිස් ස්ථානය හෝ රඳවා තබන ස්ථානය භාර නිලධරයා විසින් සැකකරුට හා මානව හිමිකම් කොමිෂන් සභාවට

පහත සඳහන් තොරතුරු ඇතුළත් කරමින් නිවේදනයක් නිකුත් කරනු ලැබිය යුතු ය:-

(i) රැඳවුම් භාරයේ හෝ රිමාන්ඩ් භාරයේ තැබීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා ආඥා කිරීමට හේතු;

(ii) සැකකරු රැඳවුම් භාරයේ තබා ඇති අවස්ථාවලදී, පවත්වාගෙන යන විමර්ශනවලට අගතියක් සිදු නොවන පරිදි, විමර්ශන උද්‍යෝගයෙන් හා කඩිනම්ව පවත්වාගෙන යාමට අවශ්‍ය වන තොරතුරු; සහ

(iii) සැකකරු රිමාන්ඩ් භාරයේ තබා ඇති අවස්ථාවලදී, අවස්ථාවෝචිත පරිදි, අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම වහාම සිදු කිරීමට නොහැකි වීමට හෝ නඩු විභාගය වහාම ආරම්භ කිරීමට නොහැකි වීමට හෝ නඩු විභාගය කඩිනම්ව අවසන් කිරීමට නොහැකි වීමට හේතු.

## III වන කොටස

### මේ පනත යටතේ ඇතැම් නිලධරයන්ගේ බලතල සහ කාර්ය

මේ පනත යටතේ පොලිස් නිලධරයන්ගේ බලතල.

**49.** මේ පනත යටතේ වන වැරදි හා එවැනි වරදක් සිදු කිරීමේ ක්‍රියාවලිය තුළ දී කරනු ලැබිය හැකි වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන වැරදි පිළිබඳව විමර්ශන පැවැත්වීමේ හෝ එවන් වරදක් සිදු කිරීම වැළැක්වීමේ කාර්යය සඳහා මේ පනත යටතේ වන වැරදි පිළිබඳ විමර්ශනය කිරීම හෝ ඒවා වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි ප්‍රමාණයට පොලිස් ආඥාපනත හෝ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත හෝ අදාළ වෙනත් යම් ලිඛිත නීති මඟින් පොලිස් නිලධරයන්ට පවරනු ලැබූ යම් බලතලවලට අතිරේකව, මේ කොටසේ නිශ්චිතව සඳහන් බලතල පොලිස් නිලධරයන් සතු විය යුතු ය.

මේ පනත යටතේ වන වැරදි සිදු කිරීම වැළැක්වීම ඇතැම් නිලධරයන්ගේ කාර්යය වන බව.

**50.** (1) මේ පනත යටතේ වන යම් වරදක් සිදු කිරීම වැළැක්වීම සඳහා මේ පනතේ විධිවිධානවලට යටත්ව අවශ්‍ය පියවර ගැනීම, සෑම පොලිස් නිලධරයකුගේ ම, සෑම සන්නද්ධ හමුදාවක සාමාජිකයකුගේ ම හා වෙරළ ආරක්ෂක නිලධරයකුගේ ම කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා එවැනි යම් නිලධරයකු විසින් -

(අ) සද්භාවයෙන්;

(ආ) සිදු කරන ලදැයි කියනු ලබන වරද සිදු කිරීම මඟින් පැමිණවිය හැකි හානියට සමානුපාතිකව;

(ඇ) මේ පනතේ පරමාර්ථ සාක්ෂාත්කර ගැනීමේ අන් සියලු ක්‍රම නිරර්ථක වන බව සනාථ වූයේ නම් පමණක්; සහ

(ඈ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම වළක්වනු ලැබීමට හෝ මේ පනත යටතේ වැරදි සිදු කරනු ලැබූ තැනැත්තන් ග්‍රහණය කර ගැනීමේ අරමුණ සඳහා එම පියවර අවශ්‍ය විය හැකි ප්‍රමාණයට පමණක්,

යම් පියවර ගනු ලැබිය යුතු ය.

(3) එවැනි යම් නිලධරයකු විසින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව පෞද්ගලික ආරක්ෂාව ක්‍රියාත්මක කිරීමේදී හැර මාරාන්තික බලයක් භාවිත නොකළ යුතු ය.

ශ්‍රී ලංකා පොලීසියේ විශේෂිත ත්‍රස්ත විරෝධී නියෝජිතායතනය.

**51.** (1) පොලිස්පතිවරයා විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ හා එයට එරෙහි වීමේ හා මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම පිළිබඳව විමර්ශනය කිරීමේ වගකීම පවරනු ලබන, (මෙහි මින්මතු "විශේෂිත නියෝජිතායතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පොලීසියේ විශේෂිත ත්‍රස්ත විරෝධී නියෝජිතායතනය නම් කර පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පොලිස්පතිවරයා විසින් මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වන යම් විමර්ශනයක් හෝ අර්ධ වශයෙන් පවත්වනු ලැබූ යම් විමර්ශනයක්, ශ්‍රී ලංකා පොලීසියේ වෙනයම් අංශයකට හෝ ඒකකයකට හෝ යම් පොලිස් ස්ථානයකට පැවරීමට පොලිස්පතිවරයාට හිමිකම තිබිය යුතු ය.

(3) වෙනත් කරුණු අතර -

(අ) මධ්‍යගත දත්ත ගබඩාව පවත්වාගෙන යාම;

(ආ) මේ පනත යටතේ වැරදි සිදු කිරීමට අදාළ සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම;

(ඇ) මේ පනත යටතේ වැරදි සිදු කරන තැනැත්තන් සිර භාරයට ගැනීම, නඩු පැවරීම, නිදහස් කිරීම හා දඬුවම් දීම සඳහා විමර්ශන පැවැත්වීම;

(ඈ) ත්‍රස්තවාදය මඟින් එල්ල වී ඇති තර්ජනයේ තත්ත්වය ඇගැයුමට ලක්කර, මහජනතාවට අනතුරු හැඟවීම් නිකුත් කිරීම; සහ

(ඉ) ත්‍රස්තවාදය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ විමර්ශන ක්‍රමවේද හා ක්‍රමෝපාය ද, හොඳම පරිචයන් සහ ප්‍රමිති ද වැඩි දියුණු කිරීම,

විශේෂිත නියෝජිතායතනයේ කාර්යය විය යුතු ය.

විමර්ශකයන්ගේ විශේෂ කණ්ඩායම් පත්කිරීම.

**52.** (1) මේ පනත යටතේ වන යම් වරදක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවකදී හෝ මේ පනත යටතේ වන යම් වරදක් සිදු කිරීම හෝ සිදු කිරීමට සූදානම් වීම පිළිබඳ යම් තොරතුරක් ලැබීම මත, පොලිස්පතිවරයා විසින් ඒ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා හෝ එය වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පහත සඳහන් පුද්ගලයන්ගෙන් සමන්විත (මින්මතු "විමර්ශන කණ්ඩායම" යනුවෙන් සඳහන් කරනු ලබන) විමර්ශකයන්ගේ විශේෂ කණ්ඩායමක් පත් කළ හැකි ය :-

(අ) විමර්ශන කණ්ඩායමේ ප්‍රධානියා විය යුතු නමින් සහ නිලයෙන් නම් කරනු ලැබූ පොලිස් නිලධරයෙක්;

(ආ) අපරාධ විමර්ශකයන් විය යුතු නමින් සහ නිලයෙන් නම් කරනු ලැබූ වෙනත් පොලිස් නිලධරයන් යම් සංඛ්‍යාවක්;

(ඇ) නීති විශාරදයින් යම් සංඛ්‍යාවක්;

(ඈ) අපරාධ පරීක්ෂක නිලධරයන් යම් සංඛ්‍යාවක්;

(ඉ) වෝහාරික වෛද්‍ය විශේෂඥයින් යම් සංඛ්‍යාවක්;

(ඊ) වෝහාරික මනෝ විද්‍යාඥයින් යම් සංඛ්‍යාවක්;

(උ) මස්තු විද්‍යාව, ජාන විද්‍යාව, බැලිස්ටික්, පුපුරණ ද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍ය විද්‍යාඥයින් ඇතුළුව ව්‍යෝහාරික විද්‍යාඥයින් යම් සංඛ්‍යාවක්;

(ඌ) ඇඟිලි සලකුණු විද්‍යාඥයින් යම් සංඛ්‍යාවක්;

(එ) අත් අකුරු සහ සැක කටයුතු ලේඛන පිළිබඳ විශේෂඥයින් යම් සංඛ්‍යාවක්;

(ඒ) පරිගණක හා ස්වයංක්‍රීය ජාල විශේෂඥයින් යම් සංඛ්‍යාවක්;

(ඔ) ව්‍යෝහාරික විගණකයින් යම් සංඛ්‍යාවක්;

(ඕ) ඇනලොග්, ඩිජිටල් තාක්ෂණය සහ ජංගම හා චන්ද්‍රිකා සන්නිවේදන තාක්ෂණයන්හි විශේෂඥයින් යම් සංඛ්‍යාවක්;

(ඛ) ඡායාරූප ශිල්පීන් හා වීඩියෝ ශිල්පීන් යම් සංඛ්‍යාවක්; සහ

(ග) පොලිස්පතිවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් විශේෂඥයින් යම් සංඛ්‍යාවක්.

(2) (අ) පොලිස්පතිවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ විමර්ශන කණ්ඩායම සඳහා පොලිස් ස්ථානයක් නම්කරනු ලැබිය යුතු ය.

(ආ) එකී පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා විසින් මේ පනත යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ එවැනි යම් ස්ථාන භාර නිලධරයකුට පවරනු ලැබූ සාමාන්‍ය කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමට අමතරව විමර්ශන කණ්ඩායමට සහාය ලබා දිය යුතු ය.

(3) පොලිස් නිලධරයන් නොවන විමර්ශන කණ්ඩායමේ සාමාජිකයන් එකී විමර්ශන කණ්ඩායම වෙත පවරනු ලැබූ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සහාය කණ්ඩායම් පිහිටුවීම.

**53.** (1) මේ පනත යටතේ වන වරදක් සිදු කර තිබෙන අවස්ථාවක දී යම් අපරාධ ස්ථානයක දී පහත සඳහන් කාර්යවල නියැලීම සඳහා, විමර්ශන කණ්ඩායමේ සාමාජිකයකු වන නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන්නා වූ පොලිස්

නිලධරයකු විසින් අදාළ අධිකාරීන්ගේ එකඟතාවය ඇතිව, යම් සන්නද්ධ හමුදාවක සාමාජිකයන්ගෙන්, වෛද්‍යවරුන්ගෙන් සහ වෙනත් සෞඛ්‍ය සේවකයන්ගෙන්, හදිසි සහන සේවා සපයන්නන්ගෙන්, රජයේ සේවකයන්ගෙන් හා වෙනත් අවශ්‍ය තැනැත්තන්ගෙන් සමන්විත සහාය කණ්ඩායම් ස්ථාපනය කරනු ලැබිය හැකි ය:-

(අ) යම් වරදක වින්දිතයන් සහ වෙනත් තැනැත්තන් අපරාධ ස්ථානයෙන් මුදවා ගැනීම හා ඉවත් කිරීම සඳහා ;

(ආ) හදිසි වෛද්‍ය ප්‍රතිකාර සැපයීම සඳහා ;

(ඇ) මළ සිරුරු සොයා ගැනීම සඳහා;

(ඈ) ගිනි නිවීම සඳහා;

(ඉ) පුපුරණ ද්‍රව්‍ය හා වෙනත් මාරක සහ අන්තරායකාරී ද්‍රව්‍ය අක්‍රිය කිරීම සඳහා;

(ඊ) මාරාන්තික සහ අන්තරායකාරී ද්‍රව්‍ය අක්‍රිය කිරීම පිණිස පාලනය කරන ලද පිපිරීම් සිදුකිරීම සඳහා;

(උ) සුන්බුන් ඉවත් කිරීම සඳහා;

(ඌ) පිවිසුම් මාර්ග නිර්මාණය කිරීම සඳහා; සහ

(එ) වෙනත් හදිසි, මානුෂීය සහ ආරක්ෂක අවශ්‍යතා සහ සේවා සැපයීම සඳහා.

(2) (1) වන උපවගන්තිය යටතේ වන සහාය අපේක්ෂා කරනුයේ කවර තැනැත්තකුගෙන් ද, ඒ සහාය අවශ්‍ය කරනු ලැබිය හැකි ආකාරයට ලබා දීම, ඒ සෑම තැනැත්තකුගේම කාර්යය වන්නේ ය.

(3) පොලිස්පතිවරයා විසින් එකී තැනැත්තන් සපයනු ලැබූ සේවා වෙනුවෙන් අවශ්‍ය ගෙවීම් සිදුකිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

විමර්ශනවලට පහසුකම් සැලසීම සඳහා වන බලතල.

**54.** (1) මේ පනතේ කාර්යය සඳහා, මේ පනත ප්‍රකාරව විමර්ශනයක් පවත්වාගෙන යාමට පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් බලය ලබා දී ඇති උප පොලිස් පරීක්ෂකවරයකු ට නොඅඩු නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකු ට පහත දැක්වෙන නියමයන් යම් තැනැත්තකු ට කිරීමට බලය තිබිය යුතු ය:-

(අ) සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට;

(ආ) ඔහු වෙත යොමු කරන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට;

(ඇ) තොරතුරු සැපයීමට;

(ඈ) ප්‍රකාශ ලබා දීමට;

(ඉ) දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරුමක් මත ප්‍රකාශ ලබාදීමට:

එසේ වුව ද, දිවුරුම් ප්‍රකාශයක් මත හෝ දිවුරුමක් මත ලබා දෙන ප්‍රකාශ මහෙස්ත්‍රාත්වරයකුගේ ආඥාවක් මත පමණක් ලබා ගත යුතු ය;

(ඊ) එම තැනැත්තා සන්තකයේ හෝ පාලනයේ පැවතිය හැකි යම් ලේඛනයක් හෝ දෙයක් භාරදීමට;

(උ) විමර්ශනයක් පැවැත්වීමේ දී සහාය වීමට;

(ඌ) යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදුකිරීම පිළිබඳ සැකයට භාජනය වී සිටින විට, ඒ තැනැත්තාගේ ස්ත්‍රී පුරුෂ භාවය සහ පෞද්ගලිකත්වය පිළිබඳ නිසි සැලකිල්ලක් දක්වමින් ඔහුව කායික පරීක්ෂණයක් සඳහා යොමු කිරීමට;

(එ) යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කිරීම පිළිබඳ සැකයට භාජනය වී සිටින විට, ඒ තැනැත්තාගේ ඡායාරූප ලබා ගැනීමට, වීඩියෝ පටිගත කිරීම් ලබා ගැනීමට සහ ඇඟිලි සලකුණු හා අත්ලේ හෝ පතුලේ සලකුණු ලබාගැනීමට ඔහුව යොමු කිරීමට.

(2) තමා වරදක් කළ බවට හැඟවෙන හෝ අපරාධාරෝපණය කරන ප්‍රකාශයක් කිරීමට හෝ දිවුරුම් ප්‍රකාශයක් කිරීමට කිසිම තැනැත්තකු යටත් නො වන්නේ ය.

(3) සම්මුඛ පරීක්ෂණයට භාජනය විය යුතු සහ ස්වකීය ප්‍රකාශය වාර්තා කළ යුතු යම් තැනැත්තකුට -

(අ) ඔහුගේ කැමැත්ත මත නීතිඥවරයකු වෙත ප්‍රවේශවීමට හෝ නීතිඥවරයකු සමඟ සන්නිවේදනය කිරීමට සහ එකී සම්මුඛ පරීක්ෂණයට පෙර නීතිමය උපදෙස් ලබා ගැනීමට හිමිකම තිබිය යුතු ය; සහ

(ආ) අවශ්‍ය අවස්ථාවක දී භාෂණ පරිවර්තකයකුගේ සේවය සහිතව ඒ තැනැත්තා විසින් අවබෝධ කරගත හැකි භාෂාවකින් සම්මුඛ සාකච්ඡාව පැවැත්විය යුතු අතර ප්‍රකාශය වාර්තා කළ යුතු ය:

එසේ වුව ද, භාෂණ පරිවර්තකයකුගේ සේවය ලබාගෙන ඇති අවස්ථාවක දී, සම්මුඛ පරීක්ෂණය එහි පරිවර්තනය සමඟ වාර්තා කළ යුතු අතර, පිටපත් කරනු ලැබ අනාගතයේ දී සත්‍යායනය කිරීම සඳහා සංරක්ෂණය කර තැබිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන යටතේ ක්‍රියාකරන පොලිස් නිලධරයකු විසින් යම් තැනැත්තකු සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබීමට පෙර ඒ තැනැත්තාට මේ පනත යටතේ වන ඔහුගේ අයිතිවාසිකම් දැනුම් දිය යුතු ය.

(5) හැකි සෑම විටක දී ම, සම්මුඛ පරීක්ෂණය ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයට වාර්තා කරනු ලැබිය යුතු ය.

යාත්‍රාවක් හෝ වාහනයක් නැවැත්වීම සඳහා බලය භාවිත කිරීම.

**55.** යම් වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක් හෝ ගුවන්යානයක් භාර තැනැත්තකු මේ පනතේ කාර්ය සඳහා ඒ වාහනය, යාත්‍රාව, දුම්රිය හෝ ගුවන් යානය නවත්වන ලෙස පොලිස් නිලධරයකු විසින් හෝ ඔහුගේ ඉල්ලීම මත ක්‍රියා කරන වෙනත් යම් තැනැත්තකු විසින් කරන ලද යම් අණකිරීමකට අවනත නොවන අවස්ථාවක දී, එම පොලිස් නිලධරයා හෝ තැනැත්තා විසින් එකී වාහනය නැවැත්වීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි බලය භාවිත කළ හැකි ය:

එසේ වුව ද, එවැනි යම් බලයක් භාවිත කළ හැකි වන්නේ, වාහනය, යාත්‍රාව, දුම්රිය හෝ ගුවන්යානය නතර කිරීමේ අන් සියලු ක්‍රම නිරර්ථක වී ඇති බව සනාථ වී තිබෙන අවස්ථාවක දී පමණි:

එසේම තවදුරටත්, එවැනි යම් නිලධරයකු විසින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව පුද්ගලික ආරක්ෂාව ක්‍රියාත්මක කිරීමේ දී හැර මාරාන්තික බලය භාවිත නොකළ යුතු ය.

යම් වාහනයක්, යාත්‍රාවක් යනාදිය ස්වකීය පාලනය යටතට ගැනීම.

**56.** (1) මේ පනත යටතේ වන විමර්ශනයක් පවත්වාගෙන යාමේ කාර්යය සඳහා හෝ වරදක් සිදුකිරීම වැළැක්වීම සඳහා යම් වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක්, ගුවන් යානයක් හෝ නියමුවකු රහිත ගුවන් යානයක් ස්වකීය පාලනය යටතට ගැනීමට පොලිස් නිලධරයකුට හිමිකම තිබිය යුතු ය.

(2) එකී පාලනය යටතට ගැනීම වහාම මහෙස්ත්‍රාත්වරයකු වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

යාත්‍රාවක් යාත්‍රා කිරීම හෝ ගුවන් යානයක් පිටත්වීම පමා කිරීම හෝ අත්හිටුවීම.

**57.** මේ පනතේ කාර්යය සඳහා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකු විසින් -

(අ) යම් ගුවන් යානයක් පිටත් වීම, හෝ යම් යාත්‍රාවක් යාත්‍රා කිරීම අත්හිටුවීම හෝ පමා කිරීම සඳහා; හෝ

(ආ) එවැනි යම් ගුවන් යානයක් නම් කරනු ලැබූ ගුවන් තොටුපලකට හෝ වෙනත් යම් සුදුසු ස්ථානයකට ගොඩබැස්සවීම සඳහා; හෝ

(ඇ) යම් යාත්‍රාවක් යම් තොටුපලකට හෝ වරායකට හෝ වෙනත් සුදුසු ස්ථානයකට ගෙන ඒම සඳහා,

විධාන නිකුත් කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, ගුවන් ආරක්ෂණ අවසරය ලබා ගැනීමේ කාර්යය සඳහා යම් ගුවන් යානයක් සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ එවැනි යම් විධානයක් පිළිබඳව 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරි පනත යටතේ පත්කරනු ලැබූ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිවරයා වෙත පූර්ව දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ යාත්‍රාවක් සම්බන්ධයෙන් විධානයක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී විධානය පිළිබඳ පූර්ව දැන්වීමක් ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයා වෙත කරනු ලැබිය යුතු ය.

සායනික වෝහාරික වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීම.

**58.** (1) පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවකු හෝ වරදක වින්දිතයකු ආණ්ඩුවේ වෝහාරික වෛද්‍ය විශේෂඥවරයකු වෙත පරීක්ෂා කිරීම සඳහා සෘජුවම ඉදිරිපත් කිරීමට පොලිස් ස්ථානයක් භාර නිලධරයකුට හිමිකම තිබිය යුතු ය.

(2) වෛද්‍ය නිලධරයා විසින් පරීක්ෂණයේ වාර්තාව, සැකකරු ඉදිරිපත් කර ඇති, හෝ සැකකරු ඉදිරිපත් කළ යුතු මහෙස්ත්‍රාත්වරයාට පිටපතක් සහිතව, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත සෘජුවම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

රජයේ රස පරීක්ෂක වෙත හෝ වෙනත් විශේෂඥයකු වෙත අයිතම සෘජුවම ඉදිරිපත් කිරීම.

**59.** (1) මේ පනත යටතේ වන වරදක් සිදුකිරීම හා සම්බන්ධ විය හැකි බවට ඔහු විසින් සාධාරණව විශ්වාස කරන යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් පරීක්ෂා කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා රජයේ රස පරීක්ෂක වෙත හෝ වෙනත් යම් දේශීය හෝ විදේශීය විශේෂඥවරයකු වෙත සෘජුවම ඉදිරිපත් කිරීමට පොලිස් ස්ථානයක් භාර නිලධරයකුට හිමිකම තිබිය යුතු ය.

(2) රජයේ රස පරීක්ෂක හෝ වෙනත් විශේෂඥවරයා විසින් පරීක්ෂණයේ වාර්තාව අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත සෘජුවම ඉදිරිපත් කළ යුතු ය.

**විමර්ශනය සඳහා කරුණු ලබා දීම.**

**60.** (1) වෙනත් නීතිය බලාත්මක කරන ආයතනයක විමර්ශන නිපුණතාවය යටතට ගැනෙන වරදක් සිදුකර තිබෙන බවට දැක්වෙන කරුණු පවතින බව මේ පනත යටතේ වරදක් පිළිබඳ විමර්ශනය කරන පොලිස් නිලධරයකුගේ අදහස වන්නේ නම්, එම වෙනත් නීතිය බලාත්මක කරන ආයතනය වෙත ඒ පොලිස් නිලධරයා විසින් විමර්ශනය පිණිස කරුණු ලබා දීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති නීතිය බලාත්මක කිරීමේ ආයතනය යන්නට වෙනත් යම් ස්වෛරී රටක ආයතනයක් ඇතුළත් විය හැකි ය.

**ශ්‍රී ලංකාවෙන් පිටත විමර්ශන.**

**61.** (1) පොලිස්පතිවරයාගේ අනුමතය සහිතව සහ අදාළ විදේශ රටෙන් ලබාගත් පූර්ව අනුමතය සහිතව පොලිස් නිලධරයකු විසින් මේ පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත විමර්ශනයක් පවත්වාගෙන යාම නීත්‍යනුකූල වන්නේ ය.

(2) පොලිස්පතිවරයා විසින් බලය ලබා දුන් පොලිස් නිලධරයකු විසින් මේ පනත යටතේ වරදක් සිදු කිරීම පිළිබඳව, අදාළ විදේශ රටෙන් හා ශ්‍රී ලංකා රජයෙන් ලබාගත් පූර්ව අනුමතය සහිතව, වෙනත් යම් රටක අපරාධ විමර්ශන ආයතනයක් සමඟ ඒකාබද්ධව විමර්ශනයක් කිරීමට භාර ගැනීම හා සිදු කරගෙන යාම නීත්‍යනුකූල වන්නේ ය.

**මහජනතාවගේ ආරක්ෂාව සඳහා පොලිසිය විසින් විධාන නිකුත් කළ හැකි බව.**

**62.** (1) මේ පනත යටතේ වන වරදක් සිදු කරනු ලැබ ඇති බවට හෝ සිදු කිරීමට ඉඩ ඇති බවට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයකුට නොඅඩු නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකුට තොරතුරක් ලැබුණු අවස්ථාවක දී, ඔහු විසින් ඒ වරද හා සම්බන්ධ හානි සිදුවීමෙන් හෝ තව තවත් හානි සිදුවීමෙන් තැනැත්තන් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන විධාන එකක් හෝ කිහිපයක් මහජනතාව වෙත නිකුත් කරනු ලැබිය හැකි ය:-

(අ) යම් නිශ්චිත ප්‍රදේශයකට හෝ පරිශ්‍රයකට ඇතුළු නොවන ලෙස;

(ආ) යම් නිශ්චිත ප්‍රදේශයකින් හෝ පරිශ්‍රයකින් පිටවන ලෙස;

(ඇ) නිශ්චිත ප්‍රදේශයකින් හෝ පරිශ්‍රයකින් පිට නොවන ලෙස සහ එකී ප්‍රදේශය හෝ පරිශ්‍රය තුළ රැඳී සිටින ලෙස;

(ඇ) යම් මාර්ගයක ගමන් නොකරන ලෙස;

(ඉ) කිසිවක් ප්‍රවාහනය නොකරන ලෙස සහ කිසිවකු ප්‍රවාහනය නොකරන ලෙස;

(ඊ) නිශ්චිත පොදු ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස;

(උ) යම් ස්ථානයකින් නිශ්චිතව දක්වනු ලබන වස්තුවක්, වාහනයක්, යාත්‍රාවක් හෝ ගුවන් යානයක් ඉවත් කරන ලෙස;

(ඌ) වාහනයක්, යාත්‍රාවක්, නැවක් හෝ ගුවන් යානයක් එහි වර්තමාන පිහිටීමෙහි ම තැබීමට නියම කරන ලෙස;

(එ) වැඩිදුර දැනුම්දීමක් නිකුත් කරනු ලබන තුරු යාත්‍රාවක් හෝ නැවක් යම් නිශ්චිත ප්‍රදේශයක් තුළට යාත්‍රා නොකරන ලෙස;

(ඒ) නිශ්චිත ගුවන් අවකාශයක් තුළට හෝ ඉන් පිටතට ගුවන් යානයක් පියාසර නොකරන ලෙස;

(ඔ) යම් නිශ්චිත ස්ථානයක ඒකරාශී නොවන ලෙස;

(ඕ) නිශ්චිත රැස්වීමක්, රැලියක් හෝ පෙළපාලියක් නොපවත්වන ලෙස; සහ

(ක) යම් නිශ්චිත ක්‍රියාකාරකමක නිරත නොවන ලෙස:

එසේ වුවද, (ඔ), (ඕ) හෝ (ක) යන ඡේද යටතේ වන විධාන, මහෙස්ත්‍රාත්වරයකුගේ පූර්ව අනුමතය නොමැතිව නිකුත් කරනු නොලැබිය යුතු අතර ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් එකී විධානය නිකුත් කිරීමට පෙර එකී විධානය නිකුත් කිරීමට ඇති අවශ්‍යතාවය පිළිබඳ සෑහීමට පත් වී එකී විධානය යම් කොන්දේසිවලට යටත්ව නිකුත් කරනු ලැබීමට ආඥා කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් විධානයක් එකී විධානය නිකුත් කරනු ලැබූ අදාළ නිලධරයා විසින් හෝ (ඔ), (ඕ) හෝ (ක) ඡේද යටතේ එවැනි යම් විධානයක් සඳහා පූර්ව අනුමතය ප්‍රදානය කළ මහෙස්ත්‍රාත්වරයා විසින්, මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) එවැනි යම් විධානයක හදිසි අවස්ථාවන්ට මුහුණ දීම සඳහා ද එවැනි යම් විධානයක බලපෑමට ලක්විය හැකි තැනැත්තන්ගේ මානුෂීය අවශ්‍යතා සැපයීම සඳහා ද ඊට ව්‍යතිරේඛ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.

(4) එවැනි යම් විධානයක් *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර සුදුසු වෙනත් ක්‍රමවේද හරහා අදාළ ප්‍රදේශය තුළ ඊට පුළුල් ප්‍රචාරණයක් ලබා දිය යුතු ය.

(5) එවැනි යම් විධානයක් ක්‍රියාත්මක වන කාලසීමාව, එක් වරකදී අඛණ්ඩව පැය විසිහතරකට නොවැඩි විය යුතු අතර එහි මුළු කාලසීමාව පැය හැත්තෑ දෙකක් නොඉක්මවිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් විධානයක් ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව පැය විසි හතරකට වඩා දීර්ඝකරනු ලැබීම අවශ්‍ය වන අවස්ථාවකදී, එකී දීර්ඝ කරනු ලැබූ කාලසීමාව, විධානය ක්‍රියාත්මක වීමේ මුල් කාලසීමාව අවසන් වී, පැය විසිහතරකට නොඅඩු අතරමැදි කාලසීමාවකින් පසු ආරම්භ විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වන යම් විධානයක් ක්‍රියාවට නැංවීම සඳහා, යම් සන්නද්ධ හමුදාවක සාමාජිකයන්ගේ සහාය අදාළ සන්නද්ධ හමුදාවේ හමුදාපතිවරයාගෙන් ලබාගත් පූර්ව අනුමතය සහිතව, පොලිස්පතිවරයා විසින් ලබාගනු ලැබිය හැකි ය.

(7) එවැනි විධානයක් බලාත්මක කිරීමේ කාර්යය සඳහා පොලිස් නිලධරයන් විසින් එකී ප්‍රදේශය වටකර රැකවල් යෙදීම නීත්‍යානුකූල වන්නේ ය.

(8) එකී විධානයක් ක්‍රියාත්මක වීමේ කාලසීමාව තුළදී සහ විධාන ක්‍රියාත්මක කිරීමේ කාලසීමාවන් දෙකක් අතර පවතින පැය විසිහතරක අතරමැදි කාලසීමාවක් තුළදී යම් පොලිස් නිලධරයකු විසින් හෝ යම් සන්නද්ධ හමුදාවක සාමාජිකයකු විසින් පහත සඳහන් දේ කිරීම නීත්‍යානුකූල වන්නේ ය:-

(අ) එකී විධානය බලාත්මක වන ප්‍රදේශය තුළ දී හමු වූ යම් තැනැත්තකු නතර කිරීම, ප්‍රශ්න කිරීම සහ සෝදිසි කිරීම;

(ආ) යම් පරිශ්‍රයන්ට ඇතුළු වීම සහ සෝදිසි කිරීම; හෝ

(ඇ) එකී විධානය බලපවත්වන ප්‍රදේශය තුළට ප්‍රවේශ වීමට හෝ එහි රැඳී සිටීමට තැත් කරන යම් තැනැත්තකු නතර කිරීම සහ ප්‍රශ්න කිරීම හෝ ඒ තැනැත්තාව හෝ ඒ තැනැත්තාට අයත් ඒ ප්‍රදේශය තුළට හෝ ඉන් පිටතට ගෙන යනු ලැබිය හැකි දේ සහ දේපළ පිළිබඳ සෝදිසි කිරීම.

(9) මේ වගන්තිය ප්‍රකාරව පවත්වනු ලැබූ යම් සෝදිසි කිරීමක් ඊට භාජනය වන තැනැත්තාගේ ගරුත්වය හා පෞද්ගලිකත්වය පිළිබඳ නිසි සැලකිල්ල දක්වමින් සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සැලකිල්ලෙන් කරනු ලැබිය යුතු අතර කාන්තාවක් සෝදිසි කිරීම නිලධාරිනියක් විසින් පමණක් සිදු කිරීමට වග බලා ගත යුතු ය.

(10) විධානයට පටහැනිව ක්‍රියා කළ හැකි යම් තැනැත්තකු වැළැක්වීම සහ සෝදිසි කිරීම පොලිස් නිලධරයකු විසින් හෝ තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ සන්නද්ධ හමුදාවක සාමාජිකයකු විසින් සිදු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(11) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ විධානයකට පටහැනිව ඕනෑකමින්ම ක්‍රියා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කිරීමේදී වසර එකක් නොඉක්මවන කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(12) මේ වගන්තිය යටතේ වන වරදක්, එකී වරද සිදු කිරීමෙන් වරදකරු හැර වෙනත් තැනැත්තකුගේ ජීවිතයට හානියක් නොවන්නේ නම්, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය නොවන වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### විමර්ශන සඳහා කරුණු ලබා ගැනීම

බැංකු, මූල්‍ය ආයතන යනාදියෙන් තොරතුරු ලබා ගැනීම.

**63.** (1) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ විධිවිධානවලට සහ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් තොරතුරු හා කරුණු පොලිස් අධිකාරීවරයකුට වඩා පහළ නොවන

නිලයක් දරන පොලිස් නිලධරයකුට සපයන ලෙස යම් බැංකුවකට, බැංකුවක් නොවන මූල්‍ය ආයතනයකට හෝ නමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාරයකට නියම කරන්නා වූ ආඥාවක් මහෙස්ත්‍රාත්වරයකුගෙන් ඉල්ලා සිටීමට එම නිලධරයාට හිමිකම තිබිය යුතු ය :-

(අ) එකී බැංකුව, ආයතනය හෝ ව්‍යාපාරය විසින් යම් තැනැත්තකුට සපයනු ලබන යම් මූල්‍ය සේවාවකට අදාළ තොරතුරු;

(ආ) යම් තැනැත්තකු විසින් සිදු කරනු ලැබූ යම් මූල්‍ය ගනුදෙනුවක් පිළිබඳ විස්තර;

(ඇ) බැංකු ගිණුම්, තැන්පතු ප්‍රේෂණ හා ආපසු ගැනීම් සම්බන්ධ විස්තර සහ එවැනි යම් බැංකුවක්, ආයතනයක් හෝ ව්‍යාපාරයක් විසින් සපයනු ලැබූ මූල්‍ය සේවා පිළිබඳ විස්තර;

(ඈ) යම් තැනැත්තකු විසින් මූල්‍ය සේවා ලබාගැනීම සම්බන්ධ විස්තර; සහ

(ඉ) යම් ගිණුමක සහතික කරනු ලැබූ ප්‍රකාශයක් හෝ යම් ගිණුමකට හෝ ගනුදෙනුවකට අදාළ වෙනත් තොරතුරක්.

(2) එකී මහෙස්ත්‍රාත්වරයා විසින් එකී පොලිස් නිලධරයා විසින් කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගත යුතු අතර, විමර්ශනය පැවැත්වීම සඳහා ඒ ආඥාව කිරීම සාධාරණ ලෙස අවශ්‍ය යයි පෙනී යන විට දී, (1) වන උපවගන්තිය ප්‍රකාරව ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් ඉල්ලීම සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර, එකී පොලිස් නිලධරයා විසින් ඉල්ලා සිටින්නේ නම් ඉල්ලීමට අදාළ නීති කෘත්‍ය රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

**64.** (1) පොලිස් අධිකාරීවරයකුට පහළ නොවන නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකු විසින්, විදුලි සංදේශ, චන්ද්‍රිකා හෝ ඩිජිටල් සේවා හෝ දත්ත සේවා සපයන්නකුට - සේවා සපයන්නන්ගෙන් තොරතුරු ලබා ගැනීම.

(අ) එකී සේවා සපයන්නා විසින් යම් තැනැත්තකුට සපයන ලද හෝ සපයමින් පවතින සේවාවන්ට අදාළ තොරතුරු;

(ආ) එකී සේවාවක් ලබා දී ඇත්තේ යම් තැනැත්තකුට ද එකී තැනැත්තා විසින් භුක්ති විඳිනු ලබන සේවාවන්ට අදාළ තොරතුරු;

(ඇ) එකී සේවා සපයන්නා විසින් ගබඩා කරනු ලැබිය හැකි, ලේඛනාගාරගත කළ හැකි හෝ අන්‍යාකාරයකින් තබා ගත හැකි යම් තොරතුරක්, දත්තයක් හෝ ලේඛනයක් හෝ වාර්තාවක්; සහ

(ඈ) එකී සේවා සපයන්නා විසින් සපයන ලද සේවාව හරහා යම් උපකරණයකට හෝ යම් උපකරණයකින් දත්ත හෝ තොරතුරු උඩුගත කිරීමට සහ බාගත කිරීමට අදාළ තොරතුරු,

ඒ පොලිස් නිලධරයාට සපයන ලෙස නියම කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයාගෙන් ආඥාවක් ඉල්ලුම් කිරීමට හිමිකම තිබිය යුතු ය.

(2) එකී මහෙස්ත්‍රාත්වරයා විසින් එකී පොලිස් නිලධරයා විසින් සිදු කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගත යුතු අතර, විමර්ශනය පැවැත්වීම සඳහා ඒ ආඥාව කිරීම සාධාරණ ලෙස අවශ්‍ය වේ යයි පෙනී යන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය ප්‍රකාරව ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් ඉල්ලීම සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර, එකී පොලිස් නිලධරයා විසින් ඉල්ලා සිටින්නේ නම්, ඉල්ලීමට අදාළ නීතිකෘත්‍ය රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

රජයෙන් හෝ ව්‍යවස්ථාපිත ආයතනයන්ගෙන් තොරතුරු ලබා ගැනීම.

**65.** (1) පොලිස් අධිකාරීවරයකුට පහළ නොවන නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකු විසින්, මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීමේ කාර්යය සඳහා පහත සඳහන් නිලධරයන්ගෙන් යම් තොරතුරක් හෝ ලේඛනයක් ලබා දෙන ලෙස නියම කරන ආඥාවක් මහෙස්ත්‍රාත්වරයකුගෙන් ඉල්ලුම් කිරීමට හිමිකම තිබිය යුතු ය :-

(අ) යම් අමාත්‍යාංශයක ලේකම්වරයෙක්;

(ආ) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;

(ඇ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා;

(ඈ) මහ බැංකුවේ අධිපතිවරයා;

(ඉ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා;

(ඊ) මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂවරයා;

(උ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඌ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(එ) ආගමන සහ විගමන පාලකවරයා;

(ඒ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා;

(ඔ) ආනයන සහ අපනයන පාලකවරයා;

(ඕ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා;

(ක) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා;

(ග) බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ච) මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල්වරයා;

(ජ) විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ට) රාජ්‍ය දෙපාර්තමේන්තුවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ වෙනත් රාජ්‍ය ආයතනයක ප්‍රධානියෙක්; හෝ

(ඩ) පළාත් සභාවක සභාපතිවරයෙක් හෝ පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙක් හෝ විශේෂ කොමසාරිස්වරයෙක්.

(2) එකී මහෙස්ත්‍රාත්වරයා විසින් එකී පොලිස් නිලධරයා විසින් සිදු කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගත යුතු අතර, විමර්ශනය

පැවැත්වීම සඳහා ඒ ආඥාව කිරීම සාධාරණ ලෙස අවශ්‍ය වේ යයි පෙනී යන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය ප්‍රකාරව ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් ඉල්ලීම සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර, ඒ පොලිස් නිලධරයා විසින් ඉල්ලා සිටින්නේ නම්, ඉල්ලීමට අදාළ නීති කෘත්‍ය රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

V වන කොටස

**විමර්ශනයට පහසුව සැලසීම සඳහා වන මහෙස්ත්‍රාත්වරයාගේ නියෝග**

මහෙස්ත්‍රාත්වරයා විසින් ස්ථාන භාර පොලිස් නිලධරයකුගේ ඉල්ලීමක් මත ආඥා නිකුත් කළ හැකි බව.

**66.** (1) මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීමේ කාර්යය සඳහා, පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින්, පහත දැක්වෙන ආඥාවක් කිරීම මඟින් විමර්ශනයට පහසුව සලසන මෙන් මහෙස්ත්‍රාත්වරයකුගෙන් ඉල්ලා සිටිය හැකි ය :-

(අ) සැකකරුවකු ශ්‍රී ලංකාවෙන් පිටතට ගමන් කිරීම වැළැක්වීමට:

එසේ වුවද, පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් සැකකරු සම්බන්ධයෙන් වන එකී ආඥාව භාර දීමට වහාම පියවර ගත යුතු ය;

(ආ) රුධිරය, හිසකෙස් සාම්පල සහ පිස්න ලබා ගැනීමට;

(ඇ) හඳුනා ගැනීමේ පෙරට්ටු පැවැත්වීමට;

(ඈ) ඉදිරිපත් කිරීම් රජයේ රස පරීක්ෂක වෙත හෝ වෙනත් යම් දේශීය හෝ විදේශීය විශේෂඥයකු වෙත හෝ රජයේ වෝහාරික වෛද්‍ය විශේෂඥයකු වෙත ඉදිරිපත් කිරීමට;

(ඉ) විශේෂඥයන් විසින් පරීක්ෂණ සහ පිරික්සුම් පැවැත්වීමට;

(ඊ) පනවනු ලැබිය හැකි යම් කොන්දේසියකට යටත්ව බැංකු ගිණුම් තහනම් කිරීමට හෝ වෙනත් මූල්‍ය තැන්පතු සහ ගිණුම් තහනම් කිරීමට:

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින් තම අභිමතය මත හෝ තත් කාර්යය සඳහා සිදු කරන ලද ඉල්ලීමක් මත, ස්වකීය ආඥාව වෙනස් කිරීමට හෝ සද්භාවයෙන් යම් නීත්‍යනුකූල කාර්යයක් සඳහා එකී ගිණුමේ හිමිකරු විසින් එකී ගිණුමෙහි අරමුදල් භාවිත කිරීමට අවසර ලබා දීම සිදු කරනු ලැබිය හැකි ය;

(උ) යම් සේවා සපයන්නකු විසින් සපයනු ලබන සේවා සැපයීම අත්හිටුවීමට හෝ වෙනස් කිරීමට :

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින් තම අභිමතය පරිදි හෝ තත් කාර්යය සඳහා සිදු කරන ලද ඉල්ලීමක් මත, සද්භාවයෙන් යම් නීත්‍යනුකූල කාර්යයක් සඳහා එකී සේවා භාවිත කිරීමට හැකි කරමින් එකී ආඥාව වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඌ) සේප්පු විවෘත කිරීමට.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින්, ඉල්ලීම සද්භාවයෙන් සිදු කර ඇති බවට සහ විමර්ශන පැවැත්වීම පහසු කිරීමේ කාර්යය සඳහා ඉල්ලා ඇති සහාය සාධාරණ ලෙස අවශ්‍ය බවට සෑහීමකට පත්වීමෙන් පසුව, (1) වන උපවගන්තිය යටතේ ඉල්ලා ඇති ආඥාව කරනු ලැබිය යුතු ය.

අගුළුලන ලද දත්ත සහ තොරතුරු විවර කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා අවසර ලබා දිය යුතු බව.

**67.** (1) (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති කාර්යයන් සඳහා, පොලිස් අධිකාරීවරයකුට වඩා පහළ නොවන නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකු විසින් -

(අ) යම් දත්තවල හෝ තොරතුරුවල හෝ වෙනත් දෙයක සන්නිවේදනය හෝ ගබඩා කිරීම හෝ උපකරණ අගුළු දැමීමේ හෝ කේත යෙදීමේ සේවා සපයනු ලබන යම් තැනැත්තකුට ඒ සේවාවේ අගුළු හෝ කේත විවර කර එහි අඩංගු තොරතුරු එකී පොලිස් නිලධරයාට සැපයීමට විධානය කිරීමට;

(ආ) යම් තැපැල් පණිවිඩයකට හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයකට හෝ යම් දුරකතනයකට, හඬ පටයකට, අන්තර්ජාල හෝ වීඩියෝ කථාබහකට හෝ සංවාදයකට හෝ වෙනත් යම් මාධ්‍යයක් හරහා කෙරෙන වෙනත් සන්නිවේදනයකට බාධා කිරීමට, කියවීමට, සවන් දීමට හෝ වාර්තා කිරීමට;

(ඇ) ඇනලොග් හෝ ඩිජිටල් දත්ත හෝ තොරතුරු හුවමාරු හෝ මාරු කිරීමේ පද්ධතියකට ප්‍රවේශ වීමට,

ඒ නිලධරයාට අවසර ලබා දීමේ ආඥාවක් ඉල්ලා සිටිමින් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබිය හැක්කේ පහත දැක්වෙන කාර්යයන් සඳහා විය යුතු යː-

(අ) මේ පනත යටතේ වරදක් සිදු කර ඇති තැනැත්තකුගේ අනන්‍යතාවය නිශ්චය කිරීම සඳහා;

(ආ) මේ පනත යටතේ වරදක් සිදු කර ඇති තැනැත්තකු සිටින ස්ථානය නිශ්චය කිරීම සඳහා;

(ඇ) මේ පනත යටතේ වරදක් සම්බන්ධ විමර්ශනයක් පැවැත්වීමට පහසුව සැලසීම සඳහා;

(ඈ) මේ පනත යටතේ වරදක් සිදු කර ඇති තැනැත්තකුට එරෙහිව සාක්ෂි එකතු කිරීම සඳහා;

(ඉ) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට එක් තැනැත්තකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් කුමන්ත්‍රණය කරන්නේ ද, සැලසුම් කරන්නේ ද, සූදානම් වන්නේ ද හෝ තැත් කරන්නේ ද යන්න නිශ්චය කිරීම සඳහා;

(ඊ) මේ පනත යටතේ වරදක් සිදු කිරීම වැළැක්වීමට පියවර ගැනීම සඳහා.

(3) ඉල්ලීම සිදු කරන ලද්දේ සද්භාවයෙන් බවටත් එකී ආඥාව කිරීම විමර්ශන පැවැත්වීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන බවටත්, සෑහීමකට පත්වන්නේ නම් මහෙස්ත්‍රාත්වරයා විසින්, එකී ආඥාව නිකුත් කරනු ලැබිය යුතු ය.

මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශ වාර්තා කළ යුතු බව.

**68.** (1) මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වනු ලබන පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් සිදු කරන ලද ඉල්ලීමක් මත, එකී ඉල්ලීම සිදු කරන ලද්දේ යම් මහෙස්ත්‍රාත්වරයෙක් වෙත ද එම මහෙස්ත්‍රාත්වරයා ඉදිරියට ඒ

නිලධරයා විසින් ඉදිරිපත් කරන ලද යම් සැකකරුවකුගෙන් ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කර ප්‍රකාශයක් වාර්තා කරනු ලැබිය හැකි ය.

(2) එකී ප්‍රකාශය වාර්තා කිරීම පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව කරනු ලැබිය යුතු ය :-

(අ) මේ පනත යටතේ වන ඔහුගේ අයිතිවාසිකම් පිළිබඳ ඒ තැනැත්තාව දැනුවත් කරනු ලැබිය යුතු ය;

(ආ) ඒ තැනැත්තා අපේක්ෂා කරනු ලබන්නේ නම් ඔහුට නීතිඥවරයකුගේ ප්‍රවේශය ලබාගැනීමට හෝ නීතිඥවරයකු සමඟ සන්නිවේදනය කිරීමට හැකි විය යුතු ය;

(ඇ) ඔහුට යොමු කරනු ලබන ප්‍රශ්නවලට ස්වේච්ඡාවෙන් ම පිළිතුරු සැපයීමට එකී තැනැත්තා අපේක්ෂා කරනු ලබන්නේ ද යන්න තහවුරු කර ගැනීමට ඒ තැනැත්තාගෙන් ප්‍රශ්න කළ යුතු අතර, කිසිදු පොරොන්දුවකින්, පෙළඹවීමකින් හෝ තර්ජනයකින් තොරව එකී තැනැත්තා විසින් ස්වේච්ඡාවෙන් එකී ප්‍රකාශය සිදු කරන බවට සෑහීමකට පත්වන්නේ නම් පමණක් මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශයක් වාර්තා කිරීමට කටයුතු කරනු ලැබිය යුතු ය;

(ඈ) ඒ තැනැත්තාගෙන් ප්‍රශ්න කිරීමේ කාර්යය සඳහා පොලිස් ස්ථානය භාර නිලධරයාගෙන් ප්‍රශ්නාවලියක් ලබා ගත යුතු ය;

(ඉ) ඔහුට යොමු කරන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු දීමට ඔහුට බැඳීමක් නොමැති බවට ඒ තැනැත්තා දැනුවත් කරනු ලැබිය යුතු ය;

(ඊ) ඔහුට එරෙහිව අපරාධ නඩු කටයුතු ආරම්භ කරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් සිදු කරනු ලබන ප්‍රකාශයේ ඇතුළත් දේ, ඔහුට එරෙහිව සාක්ෂි වශයෙන් භාවිත කරනු ලැබිය හැකි බවට ඒ තැනැත්තාට පූර්ව දැනුම් දීමක් කළ යුතු ය;

(ඌ) ඔහුට යොමු කරන ලද ප්‍රශ්න සඳහා ලබා දෙන ලද පිළිතුරුවලට අමතරව, එකී තැනැත්තා විසින් පැවසීමට අපේක්ෂා කරනු ලබන කවර ප්‍රකාශයක් වුව ද වාර්තා කරනු ලැබිය යුතු ය;

(ඍ) සම්මුඛ සාකච්ඡාවට භාජනය කරනු ලබන තැනැත්තාට මහෙස්ත්‍රාත්වරයා කථා කරන භාෂාව නොවැටහෙන අවස්ථාවක දී, ප්‍රශ්න සහ පිළිතුරු එකී තැනැත්තාට සහ මහෙස්ත්‍රාත්වරයාට වැටහෙන භාෂාවලට පරිවර්තනය කිරීම සඳහා භාෂණ පරිවර්තකයකුගේ සේවය ලබා ගත යුතු ය;

(එ) අනාගතයේදී සනාථ කිරීම සඳහා සම්මුඛ සාකච්ඡාවේ පිටපතක් සකස් කර තබා ගත යුතු ය.

(3) එකී ප්‍රකාශය සිදු කරනු ලබන තැනැත්තා මේ පනත යටතේ වරදක් කිරීම හේතුවෙන් පසුව අධිචෝදනා ලබා ඇති අවස්ථාවක දී, එකී වරද සම්බන්ධ නඩු කටයුතුවලදී එකී ප්‍රකාශය එකී තැනැත්තාට එරෙහිව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර ගත යුතු ය.

(4) මේ පනත යටතේ වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් අධිචෝදනා ලබා ඇති තැනැත්තකුට එරෙහිව සාක්ෂිකරුවකු වශයෙන් සාක්ෂි ලබා ගැනීමට ප්‍රකාශය සිදු කරනු ලබන තැනැත්තා නීතිපතිවරයා විසින් කැඳවනු ලබන විට දී, සම්පූර්ණ ප්‍රකාශය හෝ එයින් කොටසක් ලකුණු කර එකී තැනැත්තා සම්බන්ධ මුල් ප්‍රශ්න කිරීමේ කොටසක් වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) සැකකරු විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ප්‍රකාශයක් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන විට දී, මහෙස්ත්‍රාත්වරයා විසින් එකී කරුණ අදාළ පොලිස් නිලධරයාට සන්නිවේදනය කරනු ලැබිය යුතු අතර සැකකරු රිමාන්ඩ් භාරයේ තැබිය යුතු ය.

**69.** (1) විමර්ශනය සම්පූර්ණ කරන ලද විට දී, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් විමර්ශනය සම්පූර්ණ කිරීම පිළිබඳ දැනුම් දෙමින් වාර්තාවක් මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. විමර්ශන සම්පූර්ණ කිරීම.

(2) විමර්ශනය සම්පූර්ණ කර ඇත්තේ යම් සැකකරුවෙක් සම්බන්ධයෙන් ද එකී සැකකරු සම්බන්ධයෙන් මේ පනත යටතේ කිසිදු රඳවා තබා ගැනීමේ නියෝගයක් නිකුත් කිරීම හෝ දීර්ඝ කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

(3) යම් අවස්ථාවක දී මේ පනත යටතේ සිරභාරයට ගන්නා ලද යම් තැනැත්තෙක් සම්බන්ධයෙන් විමර්ශනයක් නැවත ඇරඹිය යුතු වන්නේ නම්, එකී වැඩිදුර විමර්ශන නැවත ආරම්භ කිරීම සහ සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා සහ මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කරනු ලැබිය යුතු ය.

විමර්ශනවල සටහන් නීතිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු බව.

**70.** විමර්ශනය සම්පූර්ණ කිරීමෙන් පසුව, සැකකරුට එරෙහිව අපරාධ නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට පොලිස් ස්ථානය භාර නිලධරයා විශ්වාස කරන්නේ නම්-

(අ) සැකකරුට එරෙහිව අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීමට නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටිය යුතු ය; සහ

(ආ) පොලිස්පතිවරයා විසින් තත් කාර්යය සඳහා අවසර ලබා දෙන ලද යම් නිලධරයකු මඟින් පහත දැක්වෙන සටහන් නීතිපතිවරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :-

(i) වරද සිදු කරන ලද ස්ථානයෙන් සහ පරීක්ෂා කරන ලද හෝ සෝදිසි කරන ලද වෙනත් යම් ස්ථානයකින් සොයා ගන්නා ලද නිරීක්ෂණ;

(ii) වරද සිදු කරන ලදැයි චෝදනා ලද තැනැත්තාගේ ප්‍රකාශ ඇතුළුව විමර්ශනය අතරතුර දී වාර්තා කරන ලද සියලු ප්‍රකාශ;

(iii) විශේෂඥයන්ගේ වාර්තා, ඡායාරූප, කටුසටහන්, සැලසුම් ආදිය;

(iv) කලින් කලට නීතිපතිවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් දේ ; සහ

(v) පවත්වන ලද විමර්ශනයට අදාළ වාර්තාවක්.

VI වන කොටස

**අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම**

නීතිපතිවරයා විසින් නඩු පැවරීම.

**71.** මේ පනත යටතේ වරදක් සිදු කර ඇති බව පෙනී යන හෝ මේ පනත යටතේ වරදක් සිදු කිරීමේ ක්‍රියාවලිය තුළ දී වෙනත් යම් නීතියක් යටතේ වරදක් සිදු කර ඇති බවට පෙනී යන යම් තැනැත්තකුට එරෙහිව නීතිපතිවරයා විසින් අපරාධ නඩු පවරනු ලැබිය යුතු ය.

අධිචෝදනා කිරීම අත්හිටුවීම සහ කල් තැබීම.

**72.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද-

(අ) යම් තැනැත්තකුට මරණය හෝ බරපතල ශාරීරික තුවාල සිදු වී නොමැති විට දී; හෝ

(ආ) රාජ්‍යයේ සහ ශ්‍රී ලාංකික ජනතාවගේ ආරක්ෂාව දැඩි ලෙස අන්තරායකට හෝ බලපෑමකට ලක් වී නොමැති විට දී,

නීතිපතිවරයා විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින් සහ (3) වන උපවගන්තියේ සඳහන් කොන්දේසි එකකට හෝ වැඩි ගණනකට යටත් ව, මේ පනත යටතේ වරදක් සිදු කර ඇතැයි චෝදනා ලද යම් තැනැත්තකුට එරෙහිව අපරාධ නඩු කටයුතු පැවරීම වසර පහකට නොඅඩු සහ වසර දහයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා අත්හිටුවීම සහ කල් තැබීම සිදු කරනු ලැබිය හැකි ය.

(2) නීතිපතිවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ අපරාධ නඩු කටයුතු පැවරීම අත්හිටුවීම හෝ කල් තැබීම සිදු කරනු ලබන විට දී, ඔහු විසින්-

(අ) රාජ්‍ය ප්‍රතිපත්තිය;

(ආ) ජාතික යහපත සහ මහජන යහපත;

(ඇ) පොලිස්පතිවරයාගේ අදහස්;

(ඈ) වරදේ වින්දිතයන්ගේ අදහස්; සහ

(ඉ) චූදිත තැනැත්තා හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයා විසින් සිදු කරනු ලැබිය හැකි කරුණු දැක්වීම්,

කෙරෙහි නිසි සැලකිල්ල දක්වනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ වරදක් කරන ලදැයි කියනු ලබන තැනැත්තකුට එරෙහිව අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම, (1) වන උපවගන්තිය ප්‍රකාරව නීතිපතිවරයා විසින් අත්හිටුවීමට සහ කල් තැබීමට තීරණය කර ඇති අවස්ථාවක දී, ඒ තැනැත්තාට එරෙහිව අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම අත්හිටුවීමට සහ කල් තැබීමට ප්‍රතිෂ්ඨාවක් වශයෙන්, පහත දැක්වෙන කොන්දේසි එකක් හෝ කීපයක් පැනවීමට මහාධිකරණයේ අවසරය ලබා ගැනීමට ඉල්ලීමක් නීතිපතිවරයා විසින් මහාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය:-

(අ) නීතිපතිවරයා විසින් නිකුත් කරන ලද භාෂා පාඨයක් භාවිත කරමින් මහාධිකරණය ඉදිරියේ, ප්‍රසිද්ධියේ පසුතැවිල්ල ප්‍රකාශ කිරීම සහ සමාව ඉල්ලීම;

(ආ) නීතිපතිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි වරදේ වින්දිතයන්ට හානිපූරණය ලබා දීම;

(ඇ) නිශ්චිතව සඳහන් කරනු ලබන පුනරුත්ථාපන වැඩසටහනකට සහභාගී වීම;

(ඈ) ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් කිරීමෙන් වැළකෙන බවට ප්‍රසිද්ධියේ සහතික වීම;

(ඉ) නිශ්චිතව සඳහන් කරනු ලබන ප්‍රජා හෝ සමාජ සේවාවක නිරත වීම; හෝ

(ඊ) යම් අධිචෝදනීය වරදක් හෝ සාමය කඩ කිරීමක් සිදු කිරීමෙන් වැළකී සිටීම.

(4) මහාධිකරණය විසින් (3) වන උපවගන්තිය යටතේ නීතිපතිවරයා විසින් කරන ලද ඉල්ලීම සලකා බැලීමෙන් පසුව, වරද කරන ලදැයි කියනු ලබන තැනැත්තාට අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙස ආඥාවක් කළ යුතු අතර අධිකරණය විසින් පනවන ලද කොන්දේසි පිළිබඳව ඒ තැනැත්තාට දැනුම් දිය යුතු ය.

(5) ඒ තැනැත්තා විසින් (3) වන උපවගන්තියෙන් පනවන ලද කොන්දේසි සපුරාලීමට දෙන ලද කාලසීමාව ඇතුළත ඒ කොන්දේසි සපුරාලන්නේ නම්, සිදු කරන ලදැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් එකී තැනැත්තාට එරෙහිව නීතිපතිවරයා විසින් අපරාධ නඩු කටයුතු නොපැවරිය යුතු ය.

(6) වලංගු නිදහසට කරුණකින් තොරව එකී කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තා පැහැර හරින්නේ නම්, ඒ කොන්දේසි ඉටු කිරීමට සැකකරුට ලබා දී ඇති කාලසීමාව ඉකුත් වීමෙන්, පසුව නීතිපතිවරයා විසින් ඒ තැනැත්තාට එරෙහිව අපරාධ නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

## VI වන කොටස

## නඩු විභාගය

මහාධිකරණයේ නඩු විභාගය.

**73.** මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකුම, ජූරි සභාවක් නොමැතිව විනිශ්චයාසනාරූඪ වන මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු ඉදිරියේ නීතිපතිවරයා විසින් පවරනු ලබන අධිචෝදනාවක් මත මූලික පරීක්ෂණයකින් තොරව, නඩු විභාගයට භාජනය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද,-

(අ) නීතිපතිවරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයාගෙන් එසේ කිරීමට ඉල්ලා සිටින අවස්ථාවක දී; හෝ

(ආ) යුක්තිය ඉටු කිරීම සඳහා එසේ කිරීම අවශ්‍ය වන බව අග්‍රවිනිශ්චයකාරවරයාගේ මතය වන අවස්ථාවක දී; හෝ

(ඇ) චූදිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් නීතිඥවරයකු විසින් එසේ කිරීමට ඉල්ලා සිටින අවස්ථාවක දී,

අග්‍රවිනිශ්චයකාරවරයා විසින් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 450 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විශේෂ මහාධිකරණයක් ඉදිරියේ නඩු විභාගය පැවැත්විය යුතු බවට විධාන කරනු ලැබිය හැකි ය.

මේ පනත යටතේ නඩු විභාග සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.

**74.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් අධිචෝදනා නඟනු ලැබූ යම් තැනැත්තකු ට එරෙහිව ඇති නඩු විභාගවලට මහාධිකරණය විසින් ප්‍රමුඛත්වය දිය යුතු ය.

දෛනික පදනම යටතේ නඩු විභාග පැවැත්වීම.

**75.** අසාමාන්‍ය අවස්ථානුගත කරුණක් නිසා මිස, මේ පනත යටතේ වන නඩු විභාගයක් සති අන්තයේ දී, රජයේ නිවාඩු දිනවල දී සහ අග්‍රවිනිශ්චයකාරවරයා විසින් අධිකරණයේ නිවාඩු දින ලෙස නියම කරනු ලබන දිනයන් හි දී හැර දිනපතා පැවැත්විය යුතු ය.

නඩු කාර්ය පටිපාටිය.

**76.** මේ පනතේ විධිවිධානවලට යටත් ව, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, මේ පනත යටතේ වන නඩු විභාග සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අධිචෝදනාවක් ඉල්ලා අස්කර ගැනීම.

**77.** (1) මේ පනත යටතේ වූ යම් වරදක් හෝ වැරදි එකකට වැඩි ගණනක් සම්බන්ධයෙන් අධිචෝදනා නඟනු ලැබූ යම් තැනැත්තකුට එරෙහිව මහාධිකරණය විසින් නඩු තීන්දුව ලබා දීමට පෙර, කවර අවස්ථාවක දී වුව ද, එම අධිචෝදනාවේ කිසිදු චෝදනාවක්-

(අ) යම් තැනැත්තකුගේ මරණය සිදු කිරීමට හෝ බරපතල තුවාල සිදු කිරීමට සම්බන්ධ නොවන;

(ආ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආරක්ෂාව සහ ජනතාවගේ ආරක්ෂාවට තර්ජනයක් ඇති කිරීමට සම්බන්ධ නොවන; හෝ

(ඇ) දේපළවලට බරපතල හානි සිදු කිරීමට සම්බන්ධ නොවන,

අවස්ථාවක දී, නීතිපතිවරයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද කරුණු සැලකිල්ලට ගනිමින් සහ (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද කොන්දේසි එකක් හෝ වැඩි ගණනකට යටත්ව, මහාධිකරණයේ අවසරය ඇතිව, චූදිතයාට එරෙහිව නගන ලද අධිචෝදනාව ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි ය.

(2) නීතිපතිවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ අධිචෝදනාව ඉල්ලා අස්කර ගනු ලබන විට, ඔහු විසින්-

(අ) රාජ්‍ය ප්‍රතිපත්තිය;

(ආ) ජාතික යහපත සහ මහජන යහපත;

(ඇ) පොලිස්පතිවරයාගේ අදහස්;

(ඇ) වරදේ වින්දිතයන්ගේ අදහස්; සහ

(ඉ) චූදිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි කරුණු,

පිළිබඳ සැලකිල්ල දැක්විය යුතු ය.

(3) නීතිපතිවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ පහත දැක්වෙන කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් පනවනු ලැබිය හැකිය:-

(අ) නීතිපතිවරයා විසින් නිකුත් කරනු ලබන භාෂා පාඨයක් භාවිත කරමින්, මහාධිකරණය ඉදිරියේ ප්‍රසිද්ධියේ පසුතැවිල්ල ප්‍රකාශ කිරීම සහ සමාව ඉල්ලීම;

(ආ) නීතිපතිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි, වරදේ වින්දිතයන්හට හානිපූරණය ලබා දීම;

(ඇ) නිශ්චිතව සඳහන් කරනු ලබන පුනරුත්ථාපන වැඩසටහනකට ස්වේච්ඡාවෙන් සහභාගී වීම;

(ඈ) මේ පනත යටතේ හෝ වෙනත් නීතියක් යටතේ තමා වරදක් කිරීමෙන් වැළකෙන බවට ප්‍රසිද්ධියේ සහතික වීම;

(ඉ) නිශ්චිතව සඳහන් කරනු ලබන ප්‍රජා හෝ සමාජ සේවයක නිරත වීම; සහ

(ඊ) යම් අධිචෝදනීය වරදකින් හෝ සාමය කඩ කිරීමකින් වැළකී සිටීම.

(4) එවැනි තැනැත්තකු (3) වන උපවගන්තිය යටතේ පනවන ලද කොන්දේසි, එම කොන්දේසි ඉටු කිරීම සඳහා නියම කරන ලද කාලසීමාව තුළ සපුරාලන්නේ නම් නීතිපතිවරයා විසින් චූදිතයාට එරෙහිව මුල් අධිචෝදනාවේ චෝදනා මතම නව අධිචෝදනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.

(5) චූදිතයා වලංගු නිදහසට කරුණු ඉදිරිපත් නොකරමින් එකී කොන්දේසි සමඟ අනුකූලව කටයුතු කිරීම පැහැර හරී නම්,

නීතිපතිවරයා විසින් චූදිතයාට එරෙහිව මුල් අධිචෝදනාවේ චෝදනා මතම නව අධිචෝදනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, චූදිතයාට එම කොන්දේසි ඉටු කිරීමට ලබා දී ඇති කාලය ඉකුත්වීමෙන් පසු ව චූදිතයාට එරෙහිව නඩු පැවරීම කරනු ලැබිය හැකි ය.

මහාධිකරණයේ නඩු විභාගය අතරතුර දී ඇප ලබා දීම.

**78.** මේ පනත යටතේ රිමාන්ඩ් භාරයට පත් කරන ලද තැනැත්තකුට එරෙහිව ඇති නඩු විභාගය අධිචෝදනාව ගොනු කරන ලද දින සිට වසරක් ඉකුත්වීමෙන් පසුව ද අවසන් වී නොමැති නම්, එම නඩු විභාගය විභාග වෙමින් පවතින හෝ පවත්වනු ලබන මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්, නඩු විභාගය අවසන් කිරීමේ ප්‍රමාදයට හේතුව ලෙස චූදිතයාගේ හෝ ඔහුගේ නීතිඥවරයාගේ ක්‍රියාවන් ආරෝපණය කළ හැකි නම් මිස, එම තැනැත්තා ඇප මත නිදහස් කළ යුතු ය.

## VIII වන කොටස

### ප්‍රකාශවල ආවේශ්‍යතාවය

මහෙස්ත්‍රාත්වරයකු වෙත කරන ලද ප්‍රකාශ.

**79.** (1) මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත කරන යම් ප්‍රකාශයක්, (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති විධිවිධානවලට සහ සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව එම තැනැත්තාට එරෙහිව ආවේශ්‍ය කර ගනු ලැබිය යුතු ය.

(2) (අ) වරදක් තමා විසින් කළ බව ගම්‍යමාන වන හෝ අපරාධරෝපණය කරන ප්‍රකාශයක් සිදු කිරීමට හෝ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කිසිදු තැනැත්තකු නීත්‍යනුකූලව බැඳී නොසිටින්නේ ය.

(ආ) සම්මුඛ සාකච්ඡාවකට භාජනය විය යුතු සහ ඔහුගේ ප්‍රකාශය වාර්තා කරනු ලැබිය යුතු යම් තැනැත්තකු ට, නීතිඥවරයකු මුණගැසීමට හෝ නීතිඥවරයකු සමග සාකච්ඡා කිරීමට සහ එවැනි සම්මුඛ සාකච්ඡාවකට පෙර නීතිමය උපදෙස් ලබා ගැනීමට ඔහු කැමැත්තෙන් සිටී නම් එසේ කිරීමට හිමිකම තිබිය යුතු ය.

(ඇ) ප්‍රකාශයක් වාර්තා කර ගැනීමට අපේක්ෂා කරන මහෙස්ත්‍රාත්වරයකු විසින් එම සම්මුඛ සාකච්ඡාවට පෙර මේ පනත යටතේ සම්මුඛ සාකච්ඡාවට භාජනය වන තැනැත්තාට ඇති අයිතීන් පිළිබඳ ව ඒ තැනැත්තා දැනුවත් කළ යුතු ය.

(ඇ) සම්මුඛ සාකච්ඡාවේ දී ප්‍රකාශය වාර්තා කර ගනු ලබන්නේ යම් තැනැත්තකුගේ ද, ඒ තැනැත්තාට සම්මුඛ සාකච්ඡාවේ දී කතා කරන භාෂාව තේරුම් ගැනීමට නොහැකි නම්, භාෂණ පරිවර්තකයකුගේ සේවය ලබා ගත යුතු අතර, සම්මුඛ සාකච්ඡාව එම තැනැත්තාට තේරුම්ගත හැකි භාෂාවකින් මෙහෙයවනු ලැබිය යුතු ය.

(ඉ) ප්‍රකාශයේ පරිවර්තනයක් අනුරූපී ප්‍රශ්න සමඟ අනුපිටපත් කරනු ලැබිය යුතු අතර, අනාගතයේ දී සනාථ කිරීම සඳහා තබා ගත යුතු ය.

(ඊ) හැකි සෑම අවස්ථාවක දී ම සම්මුඛ සාකච්ඡාව ශ්‍රව්‍ය දෘෂ්‍ය ආකාරයෙන් පටිගත කර තැබිය යුතු ය.

මහෙස්ත්‍රාත්වරයකු වෙත කරනු ලැබූ පාපොච්චාරණයක ආවේශ්‍යතාව සඳහා සෑහීමකට පත්විය යුතු පූර්ව කොන්දේසි.

**80.** (1) මේ පනත යටතේ වරදක් සිදු කර තිබීම සම්බන්ධයෙන් චූදිත තැනැත්තකු විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත කරන ලද පාපොච්චාරණයක්-

(අ) එවැනි පාපොච්චාරණයක් වාර්තා කරන ලද මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශය වාර්තා කිරීමට පෙරාතුව ම සහ ඉන් ඉක්බිතිව ම ප්‍රකාශය කරන ලද තැනැත්තා රජයේ වෝහාරික වෛද්‍ය විශේෂඥයකුගේ පරීක්ෂාවට ලක් කිරීමට කටයුතු සලස්වන්නේ නම් මිස; සහ

(ආ) පාපොච්චාරණ ප්‍රකාශයක ආවේශ්‍යතාව සනාථ කිරීම සඳහා මෙහෙයවනු ලැබිය හැකි, ප්‍රාථමික ශක්‍යතා පරීක්ෂණය අතරතුර, වෝහාරික වෛද්‍ය විශේෂඥයාගේ වාර්තාව නඩු පවරන බලධරයා විසින් ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස,

එම තැනැත්තාට එරෙහිව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර ගනු නොලැබිය යුතු ය.

(2) සිදු කරන ලද යම් පාපොච්චාරණයක් ස්වේච්ඡාවෙන් ම සිදු කරන ලද බවට ඔප්පු කිරීමේ භාරය නඩු පවරන බලධරයා සතු වන්නේ ය.

## IX වන කොටස

### විවිධ නියම

අමාත්‍යවරයා විසින් තහනම් නියම කරනු ලැබිය හැකි බව.

81. (1) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වරදකට හේතුවන ක්‍රියාවක යම් සංවිධානයක් නිරත වී සිටින බවට හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක ආරක්ෂාවට අගතිගාමී වන ආකාරයට ක්‍රියා කරමින් සිටින බවට විශ්වාස කිරීමට අමාත්‍යවරයාට සාධාරණ හේතු පවතින්නේ නම් අමාත්‍යවරයා විසින් (මෙහි මින්මතු "තහනම් නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියමයක් මගින්, ඒ සංවිධානය තහනම් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් තහනම් නියමයක්-

(අ) පොලිස්පතිවරයා විසින් කරන ලද නිර්දේශයක් බලාත්මක කිරීම සඳහා; හෝ

(ආ) යම් විදේශ රටක රජය විසින් ශ්‍රී ලංකා රජයට කරන ලද ඉල්ලීමක් බලාත්මක කිරීම සඳහා,

කරනු ලැබිය හැකි ය.

(3) තහනම් නියමයක පහත එක් තහනම් කිරීමක් හෝ තහනම් කිරීම් කිහිපයක් හෝ ඇතුළත් විය හැකි යː-

(අ) එම සංවිධානය මගින් රැස්වීම්, ක්‍රියාකාරකම් සහ වැඩසටහන් පැවැත්වීම තහනම් කිරීම;

(ආ) එම සංවිධානයේ බැංකු ගිණුම් සහ වෙනත් මූල්‍ය තැන්පතු භාවිතය හෝ යෙදවීම තහනම් කිරීම;

(ඇ) ගිවිසුම්වලට එළඹීම තහනම් කිරීම;

(ඈ) අරමුදල් රැස්කිරීම සහ ප්‍රදාන සහ රික්තවරණ ලබා ගැනීම තහනම් කිරීම;

(ඉ) සංවිධානයේ අරමුදල් සහ වත්කම් පැවරීම තහනම් කිරීම; හෝ

(ඊ) එම සංවිධානය වෙත පොළඹවා ගැනීම සහ ඒ සංවිධානය වෙනුවෙන් යාචනය කිරීම තහනම් කිරීම.

(4) (1) වන උපවගන්තිය යටතේ තහනම් නියමයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් සංවිධානයක් සම්බන්ධව ද, ඒ සංවිධානය සම්බන්ධයෙන් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරන ලද යම් තහනම් කිරීමක්, සීමා කිරීමක්, අත්හිටුවීමක් හෝ සම්බාධකයක්, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් තහනම් නියමයකට හානියක් නොමැතිව අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

(5) තහනම් නියමයක් *ගැසට් පත්‍රයේ* පළ කළ වහාම, එය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් සංවිධානයක් සම්බන්ධයෙන් ද, ඒ සංවිධානය වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු අතර, සෘජු සන්නිවේදනය කිරීමට හැකි සෑම අවස්ථාවක දී ම, සෘජු සන්නිවේදනය මාර්ගයෙන් එම සංවිධානයේ සාමාජිකයන් සහ සේවා නියුක්තයන් වෙත ඊට අදාළ හේතු ද සමඟ ඒ පිළිබඳ වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය. එවැනි නියමයක් මහජනයා වෙත ද නිවේදනය කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද තහනම් නියමයක් නිසා අතෘප්තියට පත් තැනැත්තකු හෝ සංවිධානයක් විසින් කරන ලද ඉල්ලීමක් මත අමාත්‍යවරයා විසින් එම තැනැත්තා හෝ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසුව එම නියමය සමාලෝචනයට භාජනය කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(7) (අ) මේ වගන්තිය යටතේ කරනු ලබන තහනම් නියමයක් මුල් අවස්ථාවේ අවුරුද්දක කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) අවුරුද්දක කාලයක් ඉකුත් වීමෙන් පසුව, අමාත්‍යවරයා විසින් නවීන සහ විශ්වසනීය තොරතුරු සහ ආරක්ෂක අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, එම නියමය එක් වරකට අවුරුද්දක් නොඉක්මවන වැඩිදුර කාලසීමාවන් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(8) තහනම් නියමයක් හෝ එහි යම් දීර්ඝ කිරීමක් මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකු හෝ සංවිධානයක් එම නියමය ප්‍රතිශෝධනය කිරීමක් හෝ අවලංගු කිරීමක් අපේක්ෂාවෙන් අභියාචනාධිකරණය වෙත අභියාචනය කිරීමට හිමිකම ලබන්නේ ය.

අමාත්‍යවරයා විසින් සීමා කිරීමේ නියම කරනු ලැබිය හැකි බව.

**82.** (1) පොලිස්පතිවරයා විසින් කරනු ලබන නිර්දේශයක් මත යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කර ඇති බව හෝ වරදක් සිදු කිරීමට සූදානම් වෙමින් සිටින බව ද, එම තැනැත්තාව සිරභාරයට ගැනීමෙන් තොරව ඔහුගේ ක්‍රියාකලාපය විමර්ශනය කිරීමට හැකි බව ද, එසේ කිරීම අවශ්‍ය බව ද, අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් මහාධිකරණය වෙත ඉල්ලීමක් කර ලබා ගත් ඒ අධිකරණයේ අවසරය ඇතිව එවැනි තැනැත්තකු මත (මෙහි මින්මතු "සීමා කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලිඛිත නියමයක් එම නියමයෙහි නිශ්චිතව සඳහන් සීමා කිරීම් පනවමින් කරනු ලැබිය හැකි අතර එවැනි නියමයක් එක් වරකට එක් මසක් නොඉක්මවන කාලසීමාවක් සඳහා කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන සීමා කිරීමේ නියමයක පහත සීමා කිරීම් ඇතුළත් විය හැකි යː-

(අ) පදිංචි ස්ථානයෙන් බැහැරව එහා මෙහා යාම සීමා කිරීම;

(ආ) විදේශගත වීම සීමා කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත ගමන් කිරීම සීමා කිරීම;

(ඈ) පදිංචි ස්ථානය සහ සේවයේ නියුක්ත ස්ථානය අතර සාමාන්‍ය ගමන් මාර්ගයෙන් බැහැරව ගමන් කිරීම සීමා කිරීම;

(ඉ) නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන ආකාරයට විශේෂ තැනැත්තන් සමඟ සන්නිවේදනය කිරීම හෝ ආශ්‍රය කිරීම හෝ ඒ දෙකම සීමා කිරීම; හෝ

(ඊ) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට පහසුව සැලසෙන ආකාරයේ නිශ්චිත ක්‍රියාකාරකම්වල නිරත වීම සීමා කිරීම.

(3) එවැනි යම් සීමා කිරීමේ නියමයකින් යම් නිශ්චිත දිනයක හෝ නිශ්චිත කාල පරාසයකට වරක් යම් පොලිස් ස්ථානයක් වෙත වාර්තා කිරීමට සැකකරු වෙත නියම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කිසිදු සීමා කිරීමේ නියමයක්-

(අ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන්නේ නම් මිස;

(ආ) මේ පනත යටතේ වරදක් සිදු කිරීම පිළිබඳ විමර්ශන පැවැත්වීම සඳහා අවශ්‍ය වන්නේ නම් මිස;

(ඇ) මේ පනත යටතේ කරන ලදැයි කියනු ලබන හෝ කරනු ලැබීමට ඉඩ ඇති වරදට සමානුපාතික වන්නේ නම් මිස;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සීමා කිරීමකට හෝ අත්තනෝමතිකව නිදහස අහිමි කිරීමකට සම්බන්ධ නොවන්නේ නම් මිස,

නොකරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් යම් සීමා කිරීමේ නියමයක්, එම සීමා කිරීමේ නියමය කරනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට භාර දීමට සැලැස්විය යුතු අතර, එම නියමය බලාත්මක කිරීමට සහ ඊට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න තහවුරු කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස පොලිස්පතිවරයාට නියම කරනු ලැබිය යුතු ය.

(6) (අ) පොලිස්පතිවරයා විසින්, සීමා කිරීමේ නියමය කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, නියමය කිරීමෙන් සතියක කාලයක් ඇතුළත ඒ තැනැත්තාගේ ප්‍රකාශ වාර්තා කර ගැනීමට කටයුතු සැලැස්විය යුතු අතර, එකී නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය යුතු ද වෙනස් කළ යුතු ද යන්න අමාත්‍යවරයාට තීරණය කිරීමට හැකිවන පරිදි එම වාර්තාව අමාත්‍යවරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(ආ) ප්‍රකාශ වාර්තා කර ගැනීමට පෙර, මේ පනත යටතේ ඔහුගේ අයිතිවාසිකම් පිළිබඳ අදාළ තැනැත්තා දැනුවත් කරනු ලැබිය යුතු අතර, සීමා කිරීමේ නියමය කිරීමට හේතු පිළිබඳවද ඔහුව දැනුවත් කරනු ලැබිය යුතු ය.

(ඇ) ප්‍රකාශ වාර්තා කර ගැනීමට පෙර, අදාළ තැනැත්තා විසින් නීතිඥවරයකු මුණ ගැසීමට හෝ රහස් සන්නිවේදනයක් පැවැත්වීමට ඉල්ලීමක් කරන්නේ නම්, ඔහුට ඒ සඳහා අවසර ලබා දිය යුතු ය.

(ඈ) අවශ්‍ය අවස්ථාවක දී භාෂණ පරිවර්තකයකුගේ සේවය සහිතව, සම්මුඛ සාකච්ඡාව පවත්වාගෙන යාම සහ ප්‍රකාශ වාර්තා කර ගැනීම සම්මුඛ සාකච්ඡාවට භාජනය වන තැනැත්තා විසින් තේරුම් ගන්නා භාෂාවකින් සිදු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, භාෂණ පරිවර්තකයකුගේ සේවය ලබා ගන්නා අවස්ථාවක දී, සම්මුඛ සාකච්ඡාව සහ එහි පරිවර්තන වාර්තා කර, අනුපිටපත් කර අනාගතයේ දී සනාථ කිරීම සඳහා සංරක්ෂණය කර තැබිය යුතු ය.

(ඉ) හැකි සෑම අවස්ථාවකදී ම, සම්මුඛ සාකච්ඡාව ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයෙන් පටිගත කර තැබිය යුතු ය.

(7) මේ පනත යටතේ කරනු ලබන සීමා කිරීමේ නියම ඕනෑකමින්ම උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු, වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර තුනක් දක්වා දීර්ඝ කළ හැකි බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(8) අමාත්‍යවරයා විසින් මේ වගන්තිය යටතේ කරන ලද සීමා කිරීමේ නියමයක් සෑම මසකම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය වේ නම් එහි කාලසීමාව දීර්ඝ කරනු ලැබිය යුතු ය.

(9) ඕනෑම සීමා කිරීමේ නියමයක මුළු කාලසීමාව මාස හයක් නොඉක්මවිය යුතු ය.

(10) සීමා කිරීමේ නියමයක් හෝ එහි දීර්ඝ කිරීමක් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් නීතිඥවරයකු විසින් එම නියමය අවලංගු කිරීමක් හෝ සංශෝධනය කිරීමක් අපේක්ෂාවෙන් එම නියමයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(11) අභියාචනය කිරීමට හේතු සහ එවැනි නියමයක් කිරීමට හේතු වශයෙන් අමාත්‍යවරයා විසින් සහ පොලිස්පතිවරයා විසින් පවසන කරුණු සැලකිල්ලට ගනිමින් අභියාචනාධිකරණය විසින් එම අභියාචනය ඉදිරිපත් කිරීමේ දිනයේ සිට මාස එකක් ඇතුළත, එවැනි යම් අභියාචනයක් විභාග කර අවසන් කළ යුතු ය.

ඇඳිරි නීති නියම.

**83.** (1) (140 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ජනාධිපතිවරයා විසින් ස්වකීය අභිමතය මත හෝ අමාත්‍යවරයා විසින් සපයන ලද තොරතුරු පිළිබඳව සෑහීමකට පත් වීමෙන් පසුව අමාත්‍යවරයාගේ ඉල්ලීමක් මත, (මෙහි මින්මතු "ඇඳිරි නීති නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලබන නියමයක් මගින්, (2) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලබන කාර්ය සඳහා මුළු ශ්‍රී ලංකාවටම හෝ ශ්‍රී ලංකාවේ කොටසකට එහි දේශීය ජල තීරය සහ ගුවන් තීරය ද ඇතුළුව, (3) වන උපවගන්තියට යටත්ව එවැනි නියමයක නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා මේ පනත යටතේ ඇඳිරි නීතිය ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින් -

(අ) මේ පනත යටතේ ක්‍රමානුකූලව සහ පුළුල්ව ව්‍යාප්ත වූ ත්‍රස්තවාදය හෝ වෙනත් වැරදි සිදුවීම පාලනය කිරීමේ, අනාවරණය කිරීමේ හෝ විමර්ශනය කිරීමේ;

(ආ) මේ පනත යටතේ ත්‍රස්තවාදය සහ වෙනත් වැරදිවලින් ජාතික හෝ මහජන ආරක්ෂාව සලසා ගැනීමේ; හෝ

(ඇ) මේ පනත යටතේ ක්‍රමානුකූලව සහ පුළුල්ව ව්‍යාප්ත වූ වැරදි සිදු කිරීම වැළැක්වීමේ,

කාර්ය සඳහා ඇඳිරිනීතිය ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(3) (අ) ඕනෑම ඇඳිරි නීති නියමයක උපරිම කාලසීමාව එක් වරකට පැය විසිහතරක් නොඉක්මවිය යුතු ය.

(ආ) ඇඳිරි නීති කාලසීමාවන් දෙකක් අතර, අවම වශයෙන් පැය තුනක කාලසීමාවක කාල පරතරයක් පැවතිය යුතු ය.

(4) ඇඳිරි නීති නියමයක්, මානුෂීය අවශ්‍යතා සැපයීම සඳහා පනවනු ලැබිය හැකි යම් නිදහස් කිරීම්වලට යටත්ව කරනු ලැබිය හැකි ය.

(5) එවැනි යම් ඇඳිරි නීති නියමයක-

(අ) එයින් නිදහස් කරනු ලබන තැනැත්තන් ප්‍රභේද නිශ්චිතව සඳහන් කළ යුතු ය;

(ආ) (i) යම් තැනැත්තකු හෝ තැනැත්තන් ඇඳිරි නීති නියමයට අනුකූලව ක්‍රියා කිරීමෙන් නිදහස් කරමින්; සහ

(ii) බලපත්‍රයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අත්‍යවශ්‍ය සේවා සහ සැපයුම් ද, හදිසි අවශ්‍යතා සහ මානව අවශ්‍යතා ද පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව හේතුවෙන් එවැනි තැනැත්තකු හෝ තැනැත්තන්ට එක් ස්ථානයකින් තවත් ස්ථානයකට ගමන් කිරීමට බලය ලබා දෙමින්,

බලපත්‍ර නිකුත් කිරීමේ බලය ලබා දිය හැකි යම් අධිකාරියක් නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(6) ඇඳිරි නීති නියමයකින් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් නිදහස් වීම අවශ්‍ය යම් තැනැත්තකු, (5) වන උපවගන්තියේ සඳහන් කර ඇති අධිකාරියට, නියමිත ආකෘතියෙන් ඉල්ලීමක් කිරීමට හිමිකම ලබන්නේ ය.

(7) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඇඳිරි නීති නියමයක් සම්බන්ධයෙන් පොලිස්පතිවරයා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වහාම දැනුම්දිය යුතු ය.

(8) ඇඳිරි නීති නියමයක් ඕනෑකමින්ම උල්ලංඝනය කරනු ලබන තැනැත්තකු, වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(9) ඇඳිරිනීති නියමයකට අනුකූලව ක්‍රියා කිරීමට වගබලා ගැනීමේ අනෙකුත් සියලු ක්‍රම නිරර්ථක වී ඇති බව තහවුරු වී ඇති අවස්ථාවක දී, ඇඳිරි නීති නියමයකට අනුකූලව ක්‍රියා කිරීමට වගබලා ගැනීමට අවශ්‍ය විය හැකි සාධාරණ බලය යම් සිරභාරයට ගන්නා නිලධරයකු විසින් භාවිත කිරීම නීත්‍යනුකූල විය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් නිලධරයකු විසින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව පුද්ගලික ආරක්ෂාව ක්‍රියාත්මක කිරීමේ දී හැර, මාරාන්තික බලය භාවිත නොකළ යුතු ය.

**84.** (1) මේ පනතේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින්, පොලිස්පතිවරයාගේ හෝ පිළිවෙළින් යුද හමුදාපතිවරයාගේ, නාවික හමුදාපතිවරයාගේ හෝ ගුවන් හමුදාපතිවරයාගේ හෝ වෙරළාරක්ෂක අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත, (මෙහි මින්මතු "තහනම් ස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් පොදු ස්ථානයක් හෝ වෙනත් යම් ස්ථානයක් තහනම් ස්ථානයක් බවට *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් කලින් කලට නියම කරනු ලැබිය හැකි ය. තහනම් ස්ථාන.

(2) (1) වන උපවගන්තිය යටතේ වන නියමයක තහනම් ස්ථානයකට ඇතුළු වීම තහනම් කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී තහනම් ස්ථානය ඡායාරූප ගත කිරීම, වීඩියෝ පටිගත කිරීම සහ දළ සටහන් සකස් කිරීම තහනම් කිරීම ද ඇතුළත් විය හැකි ය.

(3) තහනම් ස්ථානයක් සම්බන්ධයෙන් වන නියමය *ගැසට් පත්‍රයේ* පළකිරීමට අමතරව, වෙනත් ආකාරයකින් ඊට ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබා දිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක් සම්බන්ධයෙන් පොලිස්පතිවරයා විසින් වහාම මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) තහනම් ස්ථානයක් ලෙස ස්ථානයක් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, හැකි අවස්ථාවල දී එම ස්ථානය තහනම් ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බව සඳහන් කරමින් එම ස්ථානයට ඇතුළුවන ස්ථානවල නිවේදන තැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමෙන් පසුව, පොලිස් ස්ථානය භාර නිලධරයා හෝ අමාත්‍යවරයා විසින් බලය ලබා දී ඇති පරිදි තහනම් ස්ථානය පිළිබඳව නීත්‍යානුකූල අධිකාරිය සහ පාලනය සහිත වෙනත් තැනැත්තකු විසින් එම ස්ථානයට ඇතුළු වීමට සහ එහි රැඳී සිටීමට බලය ඇති පුද්ගල කාණ්ඩ නිශ්චිතව දක්වනු ලැබිය යුතු අතර, ඔහු විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසි මත එම ස්ථානයට වෙනත් යම් තැනැත්තකුට ඇතුළු වීමට අවසර ලබා දීමට ද ඔහුට හිමිකම ඇත්තේ ය.

(7) නීත්‍යානුකූල අවසරයකින් තොරව තහනම් ස්ථානයකට ඇතුළු වීමෙන් හෝ එහි රැඳී සිටීමෙන් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් හිතාමතාම උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, අවුරුදු තුනක් නො ඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(8) තහනම් ස්ථානයක ඡායාරූප ගැනීමෙන්, වීඩියෝ පටිගත කිරීමෙන් සහ දළ සටහන් සකස් කිරීමෙන් (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක් ඕනෑකමින්ම උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු, අවුරුදු තුනක් නො ඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

සන්නද්ධ හමුදා කැඳවීම.

**85.** (1) විශාල ලෙස පැතිරුණු ත්‍රස්තවාදී ප්‍රහාර සහ මේ පනත යටතේ වැරදි සිදුකර ඇති බවට ජනාධිපතිවරයාට විශ්වසනීය තොරතුරු ලැබී ඇතිවිට සහ එවැනි අවස්ථාවක් සම්බන්ධයෙන් කාර්යක්ෂම ලෙස කටයුතු කිරීමට සහ නීතිය සහ සාමය පවත්වාගැනීමට පොලීසිය ප්‍රමාණවත් නොවන බවට පොලිස්පතිවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයා අදහස් කරනු ලබන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් මහජන සාමය පවත්වාගෙන යාමට සහාය වීමට සහ මේ පනත යටතේ පොලිස් නිලධරයකු වෙත පවරා ඇති නිශ්චිතව සඳහන් කර ඇති කර්තව්‍ය ඉටු කිරීම සඳහා යම් සන්නද්ධ හමුදාවක හමුදාපතිවරයකුට හෝ සෑම සන්නද්ධ හමුදාවක ම සෑම හමුදාපතිවරයකුට ම ප්‍රකාශනයක් මගින් විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ස්වකීය අභිමතය මත හෝ, අමාත්‍යවරයා හෝ පොලිස්පතිවරයා විසින් කරන ලද ඉල්ලීමක් මත ප්‍රකාශනයක් කරනු ලැබිය හැකි ය.

(3) එම ප්‍රකාශනයේ -

(අ) ශ්‍රී ලංකාවේ මුළු දේශභූමියට හෝ ශ්‍රී ලංකාවේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති ඇතැම් කොටස්වලට හෝ එම ප්‍රකාශනය ක්‍රියාත්මක වන්නේ ද යන්න නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය;

(ආ) නම් කරන ලද නිලතලවල පොලිස් නිලධරයන් සමඟ සමානව බලය ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලබා දී ඇති සන්නද්ධ හමුදාවන්ගේ නිලධරයන්ගේ නිලතල නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) යම් ප්‍රදේශයක මහජන සාමය පවත්වාගෙන යාමේ කාර්යය සඳහා කැඳවන ලද යම් සන්නද්ධ හමුදාවක සාමාජිකයන් වෙත, එම කාර්යය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XI වන පරිච්ඡේදයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති බලතල හැර, සෝදිසි කිරීමේ සහ සිරභාරයට ගැනීමේ බලය ඇතුළුව මේ පනතේ යම් විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පොලිස් නිලධරයකු වෙත ප්‍රදානය කරනු ලැබ ඇති බලතල තිබිය යුතු ය:

එසේ වුව ද, පොදු ස්ථානයක දී තැනැත්තන්ගෙන් පීඩාකාරී ආයුධ සහ පීඩාකාරී ද්‍රව්‍ය අල්ලා ගැනීම සහ ඉවත් කිරීම සඳහා පොලිස් නිලධරයකු වෙත ලබා දී ඇති බලතල, ඉහත සඳහන් කළ පරිද්දෙන් කැඳවන ලද ශ්‍රී ලංකා යුද හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සැරයන්වරයකු හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ සුළු නිලධරයකුට වඩා පහළ නිලයක සිටින යම් සන්නද්ධ හමුදාවේ සාමාජිකයකු විසින් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශනය ක්‍රියාත්මක වන්නා වූ යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 95 වන වගන්තිය ඒ වගන්තියෙහි යොදා ඇති "පොලිස් නිලධරයා" යන යෙදුමට, එම ප්‍රකාශනය මගින් කැඳවන ලද සහ ශ්‍රී ලංකා යුද හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සැරයන්වරයකු හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ සුළු නිලධරයකුගේ නිලයට වඩා පහළ නිලයක නොවන යම් සන්නද්ධ හමුදා සාමාජිකයකු ඇතුළත් වන ලෙස බලාත්මක විය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ වන ප්‍රකාශනයක් මගින් යුද හමුදාවේ නිත්‍ය නිලධරයකු හෝ සෙබළකු නොවන ශ්‍රී ලංකා යුද හමුදාවේ යම් සාමාජිකයකු කැඳවන ලද අවස්ථාවක දී, ඔහු යුද හමුදා පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ක්‍රියාකාරී සේවයේ යෙදී සිටින බවට සහ යුද නීතියට යටත් වන බවට සලකනු ලැබිය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ වන ප්‍රකාශනයක් මගින් නාවික හමුදාවේ නිත්‍ය නිලධරයකු හෝ නාවිකයකු නොවන ශ්‍රී ලංකා නාවික හමුදාවේ යම් සාමාජිකයකු කැඳවන ලද අවස්ථාවක දී, නාවික හමුදා පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ඔහු ක්‍රියාකාරී සේවයේ යෙදී සිටින බවට සහ නාවික නීතියට යටත් වන බවට සලකනු ලැබිය යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ වන ප්‍රකාශයක් මගින් ගුවන් හමුදාවේ නිත්‍ය නිලධරයකු හෝ ගුවන් භටයකු නොවන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් සාමාජිකයකු කැඳවන ලද අවස්ථාවක දී, ගුවන් හමුදා පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ඔහු ක්‍රියාකාරී සේවයේ යෙදී සිටින බවට සහ එම පනතට යටත් වන බවට සලකනු ලැබිය යුතු ය.

(9) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශනයක් මගින් කැඳවන ලද යම් සන්නද්ධ හමුදා සාමාජිකයකුගේ එම කැඳවීම එම ප්‍රකාශනය ඉකුත් වන තෙක් හෝ එය පරිච්ඡින්න කරනු ලබන තෙක් පැවතිය යුතු ය.

දේපළ තහනමට ගැනීම, රාජසන්තක කිරීම සහ ජනරජය සන්තක කිරීම.

**86.** (1) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට හෝ වරදක් සිදු කිරීමට සම්බන්ධ වීමට භාවිත කරන ලද හෝ වරදක් සිදු කිරීමෙන් ව්‍යුත්පන්න වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් යම් පොලිස් නිලධරයකු විසින් තහනමට ගනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් තහනමට ගැනීමක් පොලිස් ස්ථානයක් භාර නිලධරයකුගේ ඉල්ලීම මත මහෙස්ත්‍රාත්වරයකු විසින් ස්ථිර කර දීර්ඝ කරනු ලැබුවේ නම් මිස, එම තහනමට ගැනීමේ සිට දින තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(3) ඉහත සඳහන් පරිදි ස්ථිර කර දීර්ඝ කරනු නොලැබූ යම් දේපළ තහනමට ගැනීමක්, ඉහත සඳහන් දින තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව බලාත්මක වීම අවසන් විය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ ස්ථිර කර දීර්ඝ කරන ලද යම් දේපළ තහනමට ගැනීමක්, පොලිස් ස්ථානයක් භාර නිලධරයකුගේ ඉල්ලීම මත අදාළ වරද සම්බන්ධයෙන් වන නඩු විභාගය අවසන් වන තුරු දීර්ඝ කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු විසින් අවසර ලබා දී ඇත්තේ නම් මිස, එම ස්ථිර කිරීමේ දින සිට දින අනූවක් ඉකුත් වීමෙන් පසුව බලාත්මක වීම අවසන් විය යුතු ය.

(5) යම් තැනැත්තකු එසේ තහනමට ගන්නා ලද දේපළ සම්බන්ධයෙන් හිමිකම තහවුරු කරනු ලබන අවස්ථාවක දී,-

(අ) වරද සිදු කිරීම පිළිබඳ කිසිදු දැනුමක් නොමැති සද්භාවී හිමිකරු එම තැනැත්තා වන බවට ; හෝ

(ආ) එකී වරද සිදු කිරීම වැළැක්වීම සඳහා එම තැනැත්තා නිසි උද්‍යෝගයෙන් කටයුතු කරන ලද බවට,

මහෙස්ත්‍රාත්වරයා සෑහීමකට පත් වන්නේ නම් නියම කරනු ලැබිය හැකි කොන්දේසි මත, මහෙස්ත්‍රාත්වරයා විසින් හිමිකම තහවුරු කරනු ලබන තැනැත්තා වෙත එම දේපළ නිදහස් කරනු ලැබිය හැකි ය.

(6) මේ පනත යටතේ යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී වරදකරු කිරීමට එරෙහිව වන අභියාචනයක තීරණයට යටත්ව, එම වරද කිරීමේ දී භාවිත කරන ලද හෝ එම වරද කිරීමෙන් ව්‍යුත්පන්න වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් රාජසන්තක කර ජනරජය සන්තක කළ යුතු බවට අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(7) මේ පනත යටතේ වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු නිදොස් කර ඇති අවස්ථාවක දී, එම වරද කිරීමට භාවිත කරන ලද හෝ එම වරද සිදු කිරීමෙන් ව්‍යුත්පන්න වූ යම් දේපළක් රාජසන්තක කර ජනරජය සන්තක කළ යුතු බවට අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි ය.

(8) (6) වන සහ (7) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම දේපළෙහි හිමිකරුගේ දැනුම සහ අනුමැතියෙන් තොරව මේ පනත යටතේ වරදක් සිදු කිරීම සඳහා යම් තැනැත්තකු විසින් භාවිත කර ඇති, එසේ රාජසන්තක කරන ලද හෝ ජනරජය සන්තක කරන ලද යම් දේපළක්, එම රාජසන්තක කිරීමෙන් සහ ජනරජය සන්තක කිරීමෙන් නිදහස් කළ යුතු ය.

(9) මේ වගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකුට අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

(10) (5) වන, (6) වන, (7) වන සහ (8) වන උපවගන්තිවල විධිවිධාන මේ පනත යටතේ වරදක් කිරීම සඳහා භාවිත කරන ලද යම් උපකරණයක්, ආයුධයක්, වෙඩිබෙහෙත් හෝ මෙවලමක් සඳහා අදාළ නොවිය යුතු ය.

## X වන කොටස

### දඬුවම් දීමට අදාළ මාර්ගෝපදේශ

දඬුවම බරපතල වන කරුණු.

**87.** මේ පනත යටතේ වරදක් සිදුකර වරදකරුවකු කරන ලද තැනැත්තකු වෙත පැනවිය යුතු බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව තීරණය කිරීමේ දී, මේ පනතේ විධිවිධානවලට යටත්ව බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව වැඩිකර ලබා දීමට හේතුවන බරපතල කරුණු ලෙස පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය :-

(අ) ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවයට හෝ ස්වෛරීභාවයට හෝ වෙනත් ස්වෛරී රාජ්‍යයක භෞමික අඛණ්ඩතාවයට හෝ ස්වෛරීභාවයට, අදාළ වරද සිදුකිරීමෙහි බලපෑම;

(ආ) ශ්‍රී ලංකාවේ ආරක්ෂාව මත හෝ රාජ්‍ය ආරක්ෂාව මත අදාළ වරද සිදුකිරීමේ බලපෑම;

(ඇ) වරද සිදුකිරීම හේතුවෙන් අහිමි වූ ජීවිත ගණන;

(ඈ) වරද සිදුකිරීම මහජන නොසන්සුන්තාව ඇති කළේ ද යන්න;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් ස්වෛරී රාජ්‍යයක ජනතාවට කරන ලද තුවාල හෝ හානි;

(ඊ) වින්දිතයන් මත වරදෙහි බලපෑම සහ ඔවුන් විසින් විඳිනු ලැබූ ප්‍රතිවිපාකයන්හි බරපතල ස්වභාවය;

(උ) පොදු ජනතාවගේ ආරක්ෂාව මත වන බලපෑම;

(ඌ) ශ්‍රීලංකාවේ ජනතාවගේ සාමකාමී සහජීවනය මත වන බලපෑම;

(එ) ශ්‍රී ලංකා රජයට සහ පොදු මහජනතාවට ඇති වූ මූල්‍යමය සහ ද්‍රව්‍යමය පාඩුව; සහ

(ඒ) ඇති වූ අලාභවලට හානිපූරණය කිරීම සහ අලාභ යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය සහ වෙනත් සම්පත්.

දඬුවම අවම කිරීමේ කරුණු.

88. මේ පනත යටතේ වරදක් සිදුකර වරදකරුවකු කරන ලද තැනැත්තකු වෙත පැනවිය යුතු බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව තීරණය කිරීමේ දී, මේ පනතේ විධිවිධාන යටතේ බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව අවම කිරීමට හේතුවන අවම කිරීමේ කරුණු ලෙස පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු යː-

(අ) ත්‍රස්තවාදය ප්‍රසිද්ධියේ හෙළා දැකීම;

(ආ) පසුතැවිල්ල ප්‍රකාශ කිරීම;

(ඇ) වරද සිදුකරන අවස්ථාවේ දී තරුණ වයසේ සිටීම;

(ඈ) දඬුවම් පනවන අවස්ථාවේ දී මහළු වයසේ සිටීම;

(ඉ) රැඳවුම් භාරයේ හෝ රිමාන්ඩ් භාරයේ ගතකළ කාලසීමාව;

(ඊ) වරද සිදුකරන ලද්දේ බලකිරීමක් හෝ උත්තර්ජනයක් යටතේ ද යන්න;

(උ) වරදකරුට සමාව ලබා දීම සඳහා වරදෙහි වින්දිතයන්ගේ පාර්ශ්වයේ කැමැත්ත;

(ඌ) වරදකරු විසින් ස්වේච්ඡාවෙන්ම වරදෙහි වින්දිතයන්ට වන්දි ලබා දීම;

(එ) වරදකරු කරනු ලැබූ දරුණු ක්‍රියා සහ වෙනත් වැරදි වරදකරු විසින් ප්‍රසිද්ධියේ හෙළා දැකීම;

(ඒ) ශ්‍රී ලංකාවේ ඒකීයභාවය, භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරීභාවය සුරක්ෂිත කිරීමට සහ ආරක්ෂා කිරීමට අවංක ලෙස කැපවීම; සහ

(ඕ) අධිකරණය විසින් දක්වනු ලබන පුනරුත්ථාපන වැඩසටහනකට ස්වේච්ඡාවෙන් සහභාගී වීම සහ පුනරුත්ථාපන වැඩසටහනක් සම්පූර්ණ කිරීම.

## XI වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

*අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඇතැම් විධිවිධාන අදාළ නොවිය යුතු බව.*

**89.** අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කුමක් සඳහන් වුව ද -

(අ) මේ පනත යටතේ යම් අධිකරණයක් විසින් හෝ අධිකරණයක් හමුවේ යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට වරදකරු කරනු ලබන අවස්ථාවේ දී චූදිතයා අවුරුදු දහඅටකට වඩා අඩු වයසක පසුවන්නේ නම් හෝ අවුරුදු හැත්තෑව හෝ ඊට වැඩි වයසක පසුවන්නේ නම් මිස එකී පනතේ 303 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය;

(ආ) මේ පනත යටතේ යම් අධිකරණයක් විසින් හෝ අධිකරණයක් හමුවේ යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු බව පිළිගන්නා හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට එකී පනතේ 306 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

*ළමයින් හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත අදාළ වන බව.*

**90.** වරදකරු කරනු ලැබූ සහ මේ පනත යටතේ වරදක් කිරීම සම්බන්ධව වරදකරු වූ සහ වරදකරු කරනු ලැබූ යම් ළමයකුට (23 වන අධිකාරය වූ) ළමයින් හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

*පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.*

**91.** මේ පනත යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ විට, ඒ පුද්ගල මණ්ඩලය -

(අ) නීතිගත සංස්ථාවක් නම්, ඒ නීතිගත සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ ප්‍රධාන විධායක නිලධරයකු ම; හෝ

(ආ) වෙළෙඳායතනයක් නම් ඒ වෙළෙඳායතනයේ සෑම හවුල්කරුවකු ම ; හෝ

(ඇ) වෙළෙඳායතනයක් නොවන සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් නම් ඒ පුද්ගල මණ්ඩලයේ කළමනාකාරීත්වය හා පාලනය සඳහා වග කිව යුතු සෑම නිලධරයකු ම,

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ වරද සිදුකරන ලද්දේ තමාගේ අනුදැනුම ඇතිව නොවන බව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීම සඳහා තමා නිසි සියලු උද්‍යෝගයෙන් යුතු ව ක්‍රියා කළ බව හෝ එකී යම් තැනැත්තකු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා ඒ වරදට වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

නියෝග.

**92.** (1) මේ පනතේ කාර්ය, ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා ජනාධිපතිවරයා විසින් ඔහුගේ අභිමතය මත හෝ අමාත්‍යවරයාගේ නිර්දේශය මත මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයෙහි* පළ කළ යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කළ හැකි යම් පසු දිනයක සිට හෝ ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබීමෙන් දින තිහක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ යටතේ නිසි ලෙස කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සැලකිය යුතු ය.

(5) නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයෙහි* පළ කළ යුතු ය.

විධාන.

**93.** (1) ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයාගේ නිර්දේශය මත, මේ පනතේ විධිවිධාන බලාත්මක කළ යුතු ආකාරයට අදාළව පොලිස් නිලධරයන්ට සහ සන්නද්ධ හමුදා නිලධරයන්ට මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ආකාරය පිළිබඳව විධාන කලින් කලට නිකුත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන හුදෙක් ම කාර්යක්ෂම ආකාරයෙන් මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා විය යුතු අතර, නීතියෙන් පිළිගනු ලබන මානව හිමිකම් න්‍යායන් සහ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "නීතිය" යන යෙදුමට මානව හිමිකම් පිළිගැනීමට ලක් කරනු ලබන ශ්‍රී ලංකාව අත්සන්කරුවකු වන අන්තර්ජාතික සාධන පත්‍ර ඇතුළත් වේ.

(4) එම සෑම විධානයක් ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු ය.

පුනරුත්ථාපන වැඩසටහන්.

**94.** (1) 72 වන වගන්තිය යටතේ නීතිපතිවරයා විසින් අපරාධ නඩු කටයුතු අත්හිටුවීම හා කල් තැබීම නිර්දේශ කරනු ලැබ ඇත්තේ හෝ 77 වන වගන්තිය යටතේ නීතිපතිවරයා විසින් අධිචෝදනා ඉල්ලා අස්කර ගනු ලැබ ඇත්තේ යම් තැනැත්තෙක් සම්බන්ධයෙන් ද එකී තැනැත්තන් සඳහා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයාගේ නිර්දේශ මත නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන නියෝගවලට -

(අ) වැඩසටහන පැවැත්වීම මගින් සාක්ෂාත් කරගත යුතු අරමුණු;

(ආ) පුනරුත්ථාපන කටයුතුවල ස්වභාවය;

(ඇ) සපයනු ලබන පුහුණුවේ ස්වභාවය;

(ඈ) පුනරුත්ථාපනය හෝ පුහුණුව පවත්වන අධිකාරිය හෝ අධිකාරීන්;

(ඉ) වැඩසටහන පවත්වනු ලබන ස්ථානය; සහ

(ඊ) වැඩසටහන පවත්වනු ලබන කාලය,

ඇතුළත් විය යුතු ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිබවා බලපවත්වන බව.

**95.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, එය නොතකා මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, මේ පනතේ විධිවිධාන සහ එවැනි වෙනත් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් පවතින අවස්ථාවක මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අධිකරණ සමාලෝචන.

**96.** මේ පනත යටතේ යම් අදාළ අධිකාරියක් විසින් ලබා දෙන ලද යම් තීරණයකින්, නිශ්චය කිරීමකින්, නියමයකින් හෝ විධානයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව අධිකරණ සමාලෝචනය මගින් සහනයක් ඉල්ලීම වළක්වනු ලබන ලෙස මේ පනතේ කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

## XII වන කොටස

### පරිච්ඡින්න කිරීම සහ අන්තර්කාලීන විධිවිධාන

1979 අංක 48 දරන පනත පරිච්ඡින්න කිරීම.

**97.** 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

අන්තර් කාලීන විධිවිධාන.

**98.** 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත (මෙහි මින්මතු "පරිච්ඡින්න කරන ලද පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) පරිච්ඡින්න කිරීම නොතකා -

(අ) පරිච්ඡින්න කරන ලද පනත යටතේ යම් අධිකරණයක හෝ වෙනත් අධිකාරයක පවත්වනු ලැබ, ඉදිරිපත් කරනු ලැබ හෝ කරනු ලැබ මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පැවති යම් නඩු විභාගයක්, අභියාචනයක් හෝ ඉල්ලීමක් ප්‍රායෝගිකව හැකිතාක් දුරට කාර්ය පටිපාටිය හා සාක්ෂිවලට අදාල විධවිධාන ද ඇතුලත්ව පරිච්ඡින්න කරන ලද පනතේ විධිවිධාන යටතේ විභාග කර අවසන් කිරීම, ඉදිරියට පවත්වාගෙන යාම, පවත්වාගෙන යාම හෝ ඇසීම කරනු ලැබිය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයට පෙර, වරදක් කරනු ලැබූ බවට හෝ වරදක් කිරීමට සම්බන්ධ වූ බවට සැකයට භාජනය වී සිටින්නා වූ ද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වන විට ඔහු සම්බන්ධයෙන් නඩු පවරනු ලැබ නොමැති වූ ද, යම් තැනැත්තකු හට පරිච්ඡින්න කරන ලද පනතේ විධිවිධාන යටතේ ඔහුට විරුද්ධව නඩු පවරනු ලැබිය යුතු අතර ප්‍රායෝගිකව හැකිතාක් දුරට මේ පනතේ විධිවිධාන යටතේ එවැනි යම් වරදක් සඳහා වන නඩු කටයුතු අදාළ අධිකාරිය විසින් පවත්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් වරදක් සඳහා අධිචෝදනා ගොනු කිරීමට පෙර, නීතිපතිවරයා විසින් මේ පනතේ 72 වන වගන්තිය යටතේ අපරාධ නඩු කටයුතු අත්හිටුවීමේ හෝ කල් තැබීමේ හැකියාව සලකා බැලිය යුතු ය;

(ඈ) පරිච්ඡින්න කරන ලද පනත යටතේ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙර දෙනු ලැබූ සියලු දණ්ඩන නියම සහ වාර්තා කරන ලද හෝ කරන ලද යම් තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් මේ පනතේ අනුරූප විධිවිධාන යටතේ පිළිවෙළින් දෙනු ලැබූ බවට හෝ කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කිරීම හා ක්‍රියාවට නැංවීම කරනු ලැබිය යුතු ය;

(ඈ) යම් සංවිධානයක් තහනම් කිරීමේ නියෝග ද ඇතුළත් ව නමුත් එම නියෝගවලට සීමා නොවී 2011 අගෝස්තු මස 29 වන දින අංක 1721/2 දරන අති-විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියෝගය ද ඇතුළත්ව පරිච්ඡින්න කරන ලද පනතේ විධිවිධාන යටතේ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව සාදනු ලැබූ සෑම නියෝගයක් ම සහ නියමයක් ම මේ පනතේ අනුරූප විධිවිධාන යටතේ සාදනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කිරීම සහ ක්‍රියාවට නැංවීම කරනු ලැබිය යුතු ය.

**89.** (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි - අර්ථ නිරූපණය.

"ගුවන් යානයක්" යන්නට, හෙලිකොප්ටරය ඇතුළත් වේ;

"සන්නද්ධ හමුදා" යන්නෙන්, 1949 අංක 17 දරන යුද හමුදා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා යුද හමුදාව සහ (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා නාවික හමුදාව සහ 1949 අංක 41 දරන ගුවන් හමුදා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ගුවන් හමුදාව අදහස් වේ;

"වෙරළ ආරක්ෂක" යන්නෙන්, 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනත යටතේ පිහිටුවනු ලැබූ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව අදහස් වේ;

"අපරාධ නඩු විධාන සංග්‍රහය පනත" යන්නෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදහස් වේ;

"ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 204 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"රහස්‍ය තොරතුරු" යන්නෙන්, -

(අ) ප්‍රචාරණය කිරීමෙන් ශ්‍රී ලංකාවේ ආරක්ෂාව හා රාජ්‍ය ආරක්ෂාව කෙරෙහි අහිතකර බලපෑමක් සිදුවිය හැකි යම් තොරතුරු;

(ආ) ප්‍රචාරණය කිරීමෙන් ජාතික ආරක්ෂාව හා මහජන ආරක්ෂාව කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති-

(i) පොලීසියේ, සන්නද්ධ හමුදාවල හෝ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ තැනැත්තන් පිළිබඳ තොරතුරු;

(ii) යම් නිශ්චිත තැනැත්තකුගේ ක්‍රියා, ගමන් බිමන් හෝ සිටින තැන් පිළිබඳ තොරතුරු;

(iii) තහනම් කළ හෝ අනුමත කළ රඳවා තබාගැනීමේ ස්ථාන පිළිබඳ තොරතුරු;

(iv) මේ පනත යටතේ වන වැරදිවල විමර්ශන පැවැත්වීම, එකී විමර්ශනවල දී අනාවරණය කරගත් කරුණු, සිරභාරයට ගත් හා රඳවා තබාගත් තැනැත්තන්ගේ හා විමර්ශන පවත්වනු ලබන නිලධරයන්ගේ අනන්‍යතාව පිළිබඳ තොරතුරු;

(ඈ) ක්‍රියාවට නැංවීමට අදහස් කරනු ලබන හෝ ක්‍රියාවට නංවනු ලබන හෝ ක්‍රියාවට නංවා ඇති යම් නීතියක් බලාත්මක කිරීමේ හෝ යුදමය පියවරක් ඇතුළත්ව යම් නිල කටයුත්තක් මෙහෙයවීම පිළිබඳ පොලීසිය හෝ සන්නද්ධ හමුදාවලට අදාළ යම් තොරතුරක්;

(ඇ) ජාතික ආරක්ෂාවට හා රාජ්‍ය ආරක්ෂාවට අදාළ යම් රහස් කේත අංකයක්, වචනයක්, මුරපදයක් හෝ දත්ත සැඟවීමේ විස්තරයක්,

අදහස් වේ.

"ආගමන හා විගමන පාලකවරයා" යන්නෙන්, (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 4 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ ආගමන හා විගමන පාලකවරයා අදහස් වේ;

"ආනයන සහ අපනයන පාලකවරයා" යන්නෙන්, 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ 2 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ ආනයන සහ අපනයන පාලකවරයා අදහස් වේ;

"ඇඳිරි නීතිය" යන්නෙන්, යම් මාර්ගයක්, දුම්රිය මාර්ගයක්, උමඟක්, දේශීය මුහුදු තීරය, දිය පාරක්, උද්‍යානයක්, වෙළෙඳපොළක්, මුහුදු වෙරළ සහ විනෝද උයන් ඇතුළුව පොදු ස්ථානයක් වෙත පැමිණීමේ හෝ එවැනි ස්ථානයකින් හෝ ඒ හරහා ගමන් කිරීමේ තහනම අදහස් වේ;

"නමෝද්දිෂ්ට මූල්‍යමය නොවන ව්‍යාපාරය" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ එම යෙදුමට දී ඇති අර්ථයම ඇත්තේ ය;

"රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂවරයා" යන්නෙන්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පත්කරන ලද මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා අදහස් වේ;

"බුද්ධිමය දේපළ පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 2 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ බුද්ධිමය දේපළ පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 42 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22ආ වගන්තිය යටතේ පත් කරනු ලැබූ විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"සාක්ෂි ආඥාපනත" යන්නෙන්, (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනත අදහස් වේ;

"තුටු පඬුර" යන්නට, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ එම යෙදුමට දෙන ලද අර්ථයම ඇත්තේ ය;

"විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අර්ථානුකූලව විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා අදහස් වේ;

"මානව හිමිකම් කොමිෂන් සභාව" යන්නෙන්, 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, නීතිය සහ සාමය විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"බැංකු නොවන මූල්‍ය ආයතනය" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ එම යෙදුමට දී ඇති අර්ථයම ඇත්තේ ය;

"දණ්ඩ නීති සංග්‍රහය" යන්නෙන්, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය අදහස් වේ;

"තැනැත්තා" යන්නෙන්, තනි පුද්ගලයකු, පුද්ගල කණ්ඩායමක්, සමිතියක්, සංවිධානයක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"පොලිස් ආඥාපනත" යන්නෙන්, (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනත අදහස් වේ;

"තහනම් කරන ලද ත්‍රස්තවාදී සංවිධානය" යන්නට, 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත ප්‍රකාරව සාදන ලද නියෝගයක් යටතේ තහනම් කරනු ලැබූ යම් සංවිධානයක් ඇතුළත් වේ;

"සමාගම් රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනතේ 471 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ;

"ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ එම යෙදුමට දී ඇති අර්ථයම ඇත්තේ ය;

"නියමුවකු රහිත ගුවන්යානය" යන්නෙන්, දුරස්ථව හැසිරවීමේ හෝ පාලනය කිරීමේ හැකියාව ඇති හෝ නොමැති යම් වස්තුවක් තුළ සිටින මනුෂ්‍යයකු මගින් එම වස්තුව හැසිරවීමේ හැකියාවක් නොමැති යාන්ත්‍රික සහ/හෝ ස්වයංක්‍රීය පියාසර වස්තුවක් අදහස් වේ;

"වරදක වින්දිතයා" යන්නෙන්, ළමා වින්දිතයකු ඇතුළුව -

(අ) මේ පනත යටතේ කරන ලදැයි කියනු ලබන වරදක් සංයුක්ත වන්නා වූ; හෝ

(ආ) මේ පනත යටතේ වරදක් සිදුකිරීමේ දී යම් වෙනත් ලිඛිත නීතියක් යටතේ සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සංයුක්ත වන්නා වූ,

යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් ලෙස ශාරීරික හෝ මානසික, චිත්තවේගී, ආර්ථික හෝ වෙනත් අලාභයක් වන්නා වූ යම් හිංසාවක්, හානියක්, දුබලතාවක් හෝ ආබාධයක් අත්විඳින තැනැත්තකු අදහස් වන අතර, ඒ තැනැත්තාට සහාය වීමට මැදිහත් වීමේ හෝ වරදක් සිදුකිරීම වැළැක්වීමේ ප්‍රතිඵලයක් ලෙස හානියක් අත්විඳින තැනැත්තකු සහ වරදක ළමා වින්දිතයකුගේ මව්පියන් හෝ භාරකරු සහ එම තැනැත්තාගේ පවුලේ සාමාජිකයකු සහ ළඟම ඥාතියා, යැපෙන්නන් සහ ඒ තැනැත්තාට සුවිශේෂී වැදගත්කමක් ඇති වෙනත් තැනැත්තකු ද ඇතුළත් වේ;

"සාක්ෂිකරුවකු" යන්නෙන්,-

(අ) මේ පනත යටතේ නීතිය බලාත්මක කිරීමේ නිලධරයකු වෙත තොරතුරු සපයා හෝ පැමිණිල්ලක් කර, ඒ තොරතුරු හෝ පැමිණිල්ල පදනම් කරගෙන මේ පනත යටතේ සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් ආරම්භ කළ හැකි හෝ ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට යන විමර්ශනයකදී හෝ පරීක්ෂණයකදී, එසේ එම තොරතුරු සපයා ඇති හෝ පැමිණිල්ල කර ඇති තැනැත්තකු;

(ආ) මේ පනත යටතේ සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සිදුකිරීම පිළිබඳව නීතිය බලාත්මක කිරීමේ නිලධරයකු විසින් පවත්වනු ලබන යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් අතරතුර දී, තොරතුරු සපයා ඇති හෝ තමා ප්‍රශ්න කිරීම සම්බන්ධයෙන් වූ කාරණා ඇතුළත් ප්‍රකාශයක් කර ඇති තැනැත්තකු;

(ඇ) මේ පනත යටතේ වරදක වින්දිතයකු විසින් කර ඇති පැමිණිල්ලක් හෝ පනවා ඇති නඩු කටයුත්තකට සහාය වීමක් වශයෙන් යම් දිවුරුම් පෙත්සමක් සපයා ඇති හෝ ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති තැනැත්තකු;

(ඇ) කොමිෂන් සභාවකට තොරතුරු හෝ යම් නිවේදනයක් සපයා ඇති තැනැත්තකු;

(ඉ) නීතිය බලාත්මක කිරීමේ නිලධරයකුට හෝ කොමිෂන් සභාවකට සපයන ලද තොරතුරු හෝ කරන ලද ප්‍රකාශයක් මුල් කරගෙන යම් තැනැත්තකුට එරෙහි වන යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තකදී ප්‍රකාශයක් කිරීමට හෝ සාක්ෂි දීමට එම අධිකරණය විසින් හෝ කොමිෂන් සභාව විසින් එම තොරතුරු සැපයූ හෝ ප්‍රකාශය කළ තැනැත්තා කැඳවන බවට, සාධාරණ හේතු මත ඔහු විශ්වාස කරන්නේ නම් ඒ යම් තැනැත්තකු;

(ඊ) අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට පැවැත්වෙන යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී, ප්‍රකාශයක් කිරීමට, සාක්ෂි දීමට හෝ යම් ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමට එම අධිකරණයෙන් හෝ කොමිෂන් සභාවෙන් සිතාසි ලැබූ තැනැත්තකු; හෝ

(උ) මේ පනත යටතේ කරන ලදැයි කියනු ලබන වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් කර ඇති රජයේ නිලධරයකු,

අදහස් වන අතර, වරදක වින්දිතයකු, ළමා සාක්ෂිකරුවකු, ළමා සාක්ෂිකරුවකුගේ මව්පියන් හෝ භාරකරුවකු, එවැනි සාක්ෂිකරුවකුගේ පවුලේ සාමාජිකයෙක් හෝ යැපෙන්නෙක් හෝ ඒ තැනැත්තාට සුවිශේෂී වැදගත්කමක් ඇති වෙනත් යම් තැනැත්තකු, විශේෂඥ සාක්ෂිකරුවකු සහ මේ පනත යටතේ කරන ලදැයි කියනු ලබන වරදක් සිදු කරන ලද බවට සැකකරන හෝ චෝදනා ලත් තැනැත්තකු වෙනුවෙන් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට සාක්ෂිදීම සඳහා කැඳවනු ලැබ ඇති තැනැත්තකු ද ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**90.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

### පළමුවන උපලේඛනය

[25 (1) වගන්තිය]

### සිරභාරයට ගැනීම සහ අත්අඩංගුවට ගැනීම පිළිගන්නා වූ දැනුම්දීම

1. සිරභාරයට ගන්නා ලද තැනැත්තාගේ නම:-

2. සිරභාරයට ගන්නා ලද දිනය, වේලාව සහ ස්ථානය:-

3. සිරභාරයට ගැනීමට හේතු:-

4. සිරභාරයට ගනු ලැබූ තැනැත්තා අත්අඩංගුවේ තබා ගැනීමට හෝ රඳවා තබා ගැනීමට යෝජිත ස්ථානය:-

5. සිරභාරයට ගන්නා නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය:-

6. සිරභාරයට ගනු ලැබූ තැනැත්තාගේ ළඟම ඥාතියාට ඔහු වෙත යුක්ති සහගතව ප්‍රවේශ වීමට අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු:-

7. සිරභාරයට ගැනීම පිළිගන්නා වූ දැනුම්දීමක් නිකුත් කරනු ලබන තැනැත්තාගේ අනන්‍යතාවය:-

8. සිරභාරයට ගැනීම පිළිගන්නා වූ දැනුම්දීමක් නිකුත් කළ දිනය සහ වේලාව:-

9. සිරභාරයට ගැනීම පිළිගන්නා වූ දැනුම්දීමක් නිකුත් කළ නිලධරයාගේ නම, තනතුර සහ අත්සන:-

### දෙවන උපලේඛනය

[25 (4) වගන්තිය]

### සිරභාරයට ගැනීම පිළිබඳ මානව හිමිකම් කොමිෂන් සභාවට කරනු ලබන දැනුම්දීම

1. සිරභාරයට ගන්නා ලද තැනැත්තාගේ නම:-

2. සිරභාරයට ගත් දිනය, වේලාව සහ ස්ථානය:-

3. සිරභාරයට ගැනීමට හේතු:-

4. සැකකරු රඳවා ඇති ස්ථානයේ පිහිටීම:-

5. සිරභාරයට ගත් නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය:-

6. රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයාගේ නම, තනතුර සහ ඔහු සම්බන්ධ කර ගත හැකි ආකාරය:-

7. මානව හිමිකම් කොමිෂන් සභාවට රඳවා තැබූ තැනැත්තා වෙත ඉක්මණින් ප්‍රවේශ වීමට හැකි කරවීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු:-

**තුන්වන උපලේඛනය**

[25 (4) වගන්තිය]

**සිරභාරයට ගැනීම පිළිබඳ පොලිස්පතිවරයාට කරනු ලබන දැනුම්දීම**

1. සිරභාරයට ගන්නා ලද තැනැත්තාගේ නම:-

2. සිරභාරයට ගත් දිනය, වේලාව සහ ස්ථානය:-

3. සිරභාරයට ගැනීමට හේතු:-

4. සැකකරු රඳවා ඇති ස්ථානයේ පිහිටීම:-

5. සිරභාරයට ගත් නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය:-

6. රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයාගේ නම, තනතුර සහ ඔහු සම්බන්ධ කර ගත හැකි ආකාරය:-

**හතරවන උපලේඛනය**

[31 (1) (ආ) වගන්තිය]

**රඳවා තැබීමේ නියමය**

1. රඳවා තැබීමේ නියම ගණන:-

2. රඳවා තැබීමේ නියමය නිකුත් කරන නිලධරයාගේ නම සහ තනතුර:-

3. රඳවා තැබීමේ නියමය නිකුත් කරනු ලැබූ දිනය සහ ස්ථානය:-

4. රඳවා තැබීමේ නියමය නිකුත් කිරීම සඳහා ඉල්ලා සිටි නිලධරයාගේ අනන්‍යතාවය, ඉල්ලීමේ දිනය සහ අදාළ වන්නේ නම් යොමු අංකය:-

5. රඳවා ගැනීමට බලය දෙනු ලැබූයේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ (සැකකරුගේ) නම:-

6. බලයලත් රඳවා තැබීමේ ස්ථානය:-

7. රඳවා තැබීමේ කාලසීමාව:-

8. සැකකරු රඳවා තබනුයේ කවර කාර්යයක් සඳහා ද යන්න:-

9. රඳවා තැබීමේ කොන්දේසි :-